Striving towards climate control

වාර්ෂික වාර්තාව 2016

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය

අපගේ දැක්ම

අග්නිදිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂි ව්‍යාපාර කළමනාකාරීත්ව සමාගම බවට පත්වීම.

අපගේ මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත් ලාභදායී ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියලූ ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

මූලික සාරධර්ම

හොඳම සේව්‍යයා	:	ගුණාත්මකභාවය, ඵලදායීතාවය, ව්‍යවසායකත්වය, වටිනාකම් නැංවීම, ලාභදායීත්වය, පරිසර හිතකාමීභාවය සහ සාමූහික සමාජීය වගකීම යන කාරණා කෙරෙහි යොමුවූ අවංක කැපවීමෙන් යුත් සුදුසුකම්ලත් සේවක මඬුල්ලක් ගොඩනැංවීම.
ගුණාත්මක ප්‍රතිපාදකයා	:	අප සිදුකරන්නා වූ සියළුම කර්තව්‍යයන්හිදී ඉහළම පාරිභෝගික තෘප්තිය සහ අඛණ්ඩ උන්නතියක් ලඟාකරගැනීමට කටයුතු කිරීම.
ඵලදායීතාවය	:	යොදවන සෑම සම්පත් ඒකකයකින්ම ඉහළම ඵලදායීතාවයක් ලබාගැනීම,බිම් ඒකකයකින් උපරිම අස්වැන්නක් ලබාගැනීම, තිරසාර අන්දමින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම හා නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම.
ව්‍යවසායකත්වය	:	සියලූම අවස්ථාවන්හිදී පූර්ව ක්‍රියාකාරීත්වයන් තුළ නව ප්‍රවේශයන්ට යොමුවීම.
වටිනාකම් නිර්මානය	:	ව්‍යාපාරික ලෝකයේ නිරන්තරයෙන් වෙනස්වන අවශ්‍යතාවයන් සඳහා යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම.
ලාභදායී බව	:	ප්‍රාථමික නිෂ්පාදනයන් සහ අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා ප්‍රශස්ත විකුණුම් මිලක් ලබාගැනීම සහ නිෂ්පාදන පිරිවැය හැකි අවම මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම.
පරිසර හිතකාමීබව	:	පරිසරයට හානියක් නොවන අයුරින් හෝ අවම බලපෑමක් සහිතව සම්පත් උපරිමයෙන් යොදා ගැනීම.
සමාජයීය වගකීම	:	යහපාලනයට ගරු කරමින් මිනිසා සහ පරිසරය රැක බලා ගැනීම.



කාලගුණ විපර්යාසයන්ගේ බලපෑමට එරෙහිව අපගේ වෑයම

එය ව්‍යාපාර වර්ධනය හෝ විශිෂ්ඨ අස්වැන්නක් ලබා ගැනීම හෝ අපගේ අරමුණ කරා ලඟාවීම හෝ පිළිබඳව පමණක් නොව අප ඒ කරා ගමන් කරන්නේ කෙසේද, දිගුකාලීනව තිරසාර ලෙස රැඳී සිටින්නේ කෙසේද, යන්න පිළිබඳව වූ කාරණයකි.

කුරුණෑගල වැවිලි සමාගම වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අග්‍රගන්‍ය සේවාවක් සපයා ඇත. තිරසාරත්වය, කාබනික වර්ධනය සහ බෝග ආරක්ෂාව යන කාලගුණ විපර්යාසයන්ගේ බලපෑමට මුහුණදීම සඳහා අප අනුගමනය කරන ප්‍රවේශය අන්‍යයන් අතර අප සුවිශේෂ වීමට හේතු වී ඇත.

නව බෝග හඳුන්වා දෙමින් බෝග විවිධාංගීකරණය සහ බෝග කළමනාකරණය තුල කාලගුණ විපර්යාසයන්ගේ බලපෑමට එරෙහිව අපගේ වෑයම අතිශයින්ම සාර්ථක වී ඇත.

අපගේ නිෂ්පාදන ලබාදෙමින් ඒවා පරිභෝජනය කරන සියළුම ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සහ ඔවුන්ගේ ජීවිත වලට වටිනාකමක් එකතු කිරීම අපගේ අභිලාශයයි.

පටුන

අප ගැන	3
සන්ධිස්ථාන	4
ජයග්‍රහණයන්	6
ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය	8
ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය	11
අධ්‍යක්ෂ මණ්ඩලය	16
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය - 2016	20
පලාත් වතු අධිකාරීවරු - 2016	21
මූල්‍ය සමාලෝචනය	23
තිරසාරත්වය පිළිබඳ වාර්තාව	28
සාමූහික පාලන ප්‍රකාශය	31
අවදානම් කළමනාකරණය	33
අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	37
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය	40
විගණන කමිටු වාර්තාව	41
විගණකාධිපති වාර්තාව	42
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	46
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	47
ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	48
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	49
ගිණුම්කරණ ප්‍රතිපත්ති	51
ගිණුම්කරණ සටහන්	65
වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය	87
පෙරකලාසි පත්‍රය	89

අප ගැන

1992 පිහිටුවන ලද පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සමාගමක් වන කුරුණෑගල වැවිලි සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් එවකට පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය බාරගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා පිහිටුවන ලදී. කුරුණෑගල වැවිලි සමාගමේ සම්පූර්ණ කොටස් හිමිකාරීත්වය, ස්වර්ණමය කොටස්කරු වන මහා භාණ්ඩාගාරය විසින් දරණු ලබයි. කුරුණෑගල වැවිලි සමාගමේ ලියාපදිංචි කාර්යාලය නො. 80, දඹුල්ල පාර, කුරුණෑගල යන ස්ථානයේ පිහිටා ඇත.

ආරම්භයේ සිට පෞද්ගලික කළමනාකරණය යටතේ වසර 13 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වූ කුරුණෑගල වැවිලි සමාගම, පෞද්ගලික කළමනාකරණයේ පැවති දුර්වලතා තුල 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි කළමනාකාරීත්වය රාජ්‍ය අංශය යටතට පවරාගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් කෙරිණි. විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ කුරුණෑගල වැවිලි සමාගම, 2018 මැයි 01 වන දින සිට රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සමාගමේ මූලික ව්‍යාපාර අරමුණු වන පොල්, රබර් සහ වෙනත් අතුරු බෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම, සැකසීමෙහි හා විකිණීම නොවෙනස්ව අඛණ්ඩව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය. කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක පුරා විහිදුණු විවිධ කෘෂි-දේශගුණික කලාපයන්හි පිහිටි පළාත් වතුයාය 08 කින් සමන්විත කුරුණෑගල වැවිලි සමාගම සතුව හෙක්ටයාර 5244.58 ක් ඇත. මෙම වතුයායන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක් හෝ තුනක් පුරා විහිදී ඇති කුඩා ප්‍රමාණයේ වතු බෙදුම්වලින් සමන්විත වේ.

සමාගම සේවකයන් 1000 කට වැඩි ප්‍රමාණයකට සෘජු රැකියා අවස්ථා සලසා ඇති අතර තවත් බොහෝ දෙනෙකුගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා දායක වී ඇත.

සන්ධිස්ථාන

1992 ජූනි 18 දින

එවකට පැවති රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මණ්ඩල අංක (V) යටතේ පාලනය වූ වතු සමූහයක් ඒකාබද්ධ කොට 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ස්ථාපිත කිරීම. 1992 ජූනි 18 වන දින සිට 2004 දෙසැම්බර් 31 දින දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ කලමනාකාරිත්වය පුද්ගලික අංශයේ කළමනාකරණ නියෝජිත සමාගමක් විසින් සිදු කරන ලදී.

2005 ජනවාරි 01 දින

වසර 13 කට ආසන්න කාලයක් පැවති අකාර්යක්ෂම පෞද්ගලික කලමනාකරණය හේතු කොට ගෙන, එවකට පැවති රජය විසින් 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශය යටතට පවරා ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කිරීම.

2006 ජූනි 06 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2015 සැප්තැම්බර් 21 දින
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2015 පෙබරවාරි 18 දින
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත්වීම.

2010 නොවැම්බර් 16 දින
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2010 ජුනි 18 දින
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2007 අප්‍රේල් 18 දින
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

ජයග්‍රහණයන්

- **2016 වසර තුල ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වන්නේ ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව විසින් සංවිධානය කරනු ලැබූ හොඳම ගම්මිරිස් වගාකරු සඳහා පිරිනමන සම්මානය දිනා ගැනීමයි.**

- **ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මානය**

ජාතික වාණිජ මණ්ඩලය මගින් කෘෂි හා වැවිලි ක්ෂේත්‍රය සඳහා 2015 වර්ෂය වෙනුවෙන් පිරිනැමූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මානයෙන් (දෙවන ස්ථානය) පිදුම් ලැබීම.

- **කෘෂි ව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මාන**

කෘෂි ව්‍යාපාර සඳහා පිරිනමන ජාතික රන් සම්මානය අඛණ්ඩව තුන්වන වරටත් (2012 - 2014), මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය අඛණ්ඩව හතරවන වරටත් (2011 - 2014) දිනා ගනිමින්, අඛණ්ඩව මෙලෙස එම සම්මාන දිනාගත් එකම සමාගම බවට පත් වෙමින්, කුරුණෑගල වැවිලි සමාගම කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ මෙන්ම වැවිලි අංශයේ ඉතිහාසය තුල නව වාර්තාවක් සනිටුහන් කරන ලදී.

2014

කෘෂි ව්‍යාපාර සඳහා වන ජාතික රන් සම්මානය

මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය

2013

කෘෂි ව්‍යාපාර සඳහා වන ජාතික රන් සම්මානය

මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය

2012

කෘෂි ව්‍යාපාර සඳහා වන ජාතික රන් සම්මානය

මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය

ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය

"අපගේ ප්‍රශස්ථ හා දුරදක්නා කළමනාකාරිත්වය සමාගම කැපී පෙනෙන ලාභදායීත්වයක් කරා ගෙනයමින් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ලබා දෙමින් රටේ සංවර්ධනය සඳහා දායක වන රාජ්‍ය සමාගමක් බවට පත්කිරීමට කටයුතු කර ඇත. 2007 වසරේ සිට මේ වන විට රුපියල් මිලියන 280 ක් ලාභාංශ ලෙස ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත."

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය කුරුණෑගල වැවිලි සමාගමට පරීක්ෂණාත්මක මෙන්ම අභියෝගාත්මක වසරක් විය. අප මුහුණ දුන් අභියෝග ජයගැනීම සඳහා අප ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ශ්‍රී ලංකාව තුල ඇති වඩාත්ම ස්ථායී හා තිරසාර වැවිලි සමාගමක් බවට පත් කිරීමට අපට හැකිවිණි. මෙවන් තත්ත්වයක් තුල 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය ඇතුලත් වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මාගේ භාග්‍යයක් කොට සළකමි.

ප්‍රධාන වශයෙන්ම පොල් කර්මාන්තය තුල නියැලී සිටින කුරුණෑගල වැවිලි සමාගම 2016 වසරේදී ගෙඩි මිලියන 16.65 ක් නිෂ්පාදනය කළ අතර ඒ අනුව 2016 වසර නිෂ්පාදන ඉලක්ක සපුරා ගත් සාර්ථක වසරකි. කෙසේ වෙතත් වසර තුල වූ පොල් මිළ පහළයාම සමාගමේ ලාභය අඩුකිරීම කෙරෙහි හේතු විය. වැඩිවූ වැටුප් හා වේතන වල මූල්‍යමය බලපෑමද අභිබවා යමින් මෙවැනි වූ ලාභයක් ලබාගැනීමට හැකිවීම අප විසින් ක්‍රියාත්මක කළ යහපත් කළමනාකරණ ක්‍රමවේදයන්ගේ හා දුරදක්නා උපායමාර්ගික ක්‍රමෝපායන්ගේ ප්‍රතිඵලයකි.

මෑත අතීතය තුල ශ්‍රී ලංකාවේ අවිනිශ්චිත ආර්ථික තත්ත්වයක් ගොඩනැගී ඇති අතර රුපියලේ වටිනාකම අවදමනය වීම, පොලී අනුපාත ඉහල යාම හා අභියෝගාත්මක ආයෝජන පරිසරයක් බිහිවීම වැනි කරුණු ඒ හා බැඳී පවතී. දිගුකාලීන නියඟයන්, ගංවතුර තත්ත්වයන් හා වැවිලි ක්ෂේත්‍රය මෙන්ම අනෙකුත් අංශද මුහුණ දෙන පාරිසරික ගැටළු හා අයහපත් කාලගුණික තත්ත්වයන් කෘෂි අංශය කෙරෙහි ඉතාමත්ම අයහපත් ලෙස බලපා ඇත. ගෝලීය උෂ්ණත්වය ඉහලයාම, කාලගුණික විපර්යාස වැවිලි ක්ෂේත්‍රය හමුවේ ඇති ප්‍රධාන අභියෝගයන් බවට පත්ව ඇත. වැවිලි ක්ෂේත්‍රය සඳහා ඇති මෙම අභියෝගාත්මක බලපෑම් ජයගැනීම සඳහා උපාය මාර්ගික ක්‍රමෝපායන් සකස් කිරීම අත්‍යවශ්‍යව පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කර ඇති වාර්තා අනුව ලෝක වර්ධනය 2016 වර්ෂයේ 3.1% කින් අඩු වී ඇත. මේ සඳහා පාරිභෝගික භාණ්ඩ වල පැවති අස්ථායී මිළ උච්චාවචනයන්, චීනය වැනි ප්‍රධාන ආර්ථිකයන්ගේ මන්දගාමී ස්වභාවය, මහා බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීම සහ සමහරක් දියුණු රටවල් සඳහා ඇති වී ඇති ජාත්‍යන්තර දේශපාලන හා විදේශ සම්බන්ධතා කෙරෙහි වූ භූගෝලීය බලපෑම වැනි කරුණු හේතු වී ඇත. 2016 වර්ෂයේ මුල්භාගය තුල ලෝක බොරතෙල් මිළ පහළයාම ජාත්‍යන්තර ආර්ථිකය කෙරෙහි බලපා ඇත. විශේෂයෙන්ම මැදපෙරදිග හා රුසියාව කෙරෙහි එහි වැඩි බලපෑමක් එල්ල විය. ජාත්‍යන්තරය තුළ වර්ධනය වූ මෙවැනි අර්බුධ, 2016 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කළ අතර එය 4.4% ක් ලෙසට වාර්තා විය. ඇඟළුම් කර්මාන්තයට මෙන්ම අනෙකුත් අපනයන සැකසුම් සඳහා විශාල වාසිදායක තත්ත්වයක් ගෙන දෙන ජී.එස්.පී. ප්ලස් (GSP +) සහනය නැවත ලබා ගැනීමට හැකිවීම ශ්‍රී ලංකා රජය ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

කෙසේ වෙතත් මෙම වසර තුල වැවිලි ක්ෂේත්‍රය ගැටළු කිහිපයක අයහපත් බලපෑමට ලක්විය. ඉන් ප්‍රධාන ගැටළුවක් වන්නේ ග්ලයිපොසේට් භාවිතය තහනමට ලක් වීමයි. නමුත් පොල් පරිභෝජනයට සුදුසු වඩාත් සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදනයක් ලෙසට ප්‍රචලිතවීමත් සමඟ පොල් සඳහා කැපී පෙනෙන ලෝක වෙළෙඳපොල ඉල්ලුමක් හා වෙළෙඳපොල අවස්ථාවක් වර්ධනය වී ඇත.

ලෝක වෙළෙඳපොලෙහි මිළ පහළ යාමත් අයහපත් කාලගුණ තත්ත්වයත් හේතුකොටගෙන රබර් අංශය තවදුරටත් අලාභ ලබන කර්මාන්තයක් බවට පත්ව ඇත.

විශේෂයෙන්ම පොල් අංශයේ නිෂ්පාදන පිරිවැය පාලනය කිරීම ප්‍රබල අභියෝගයකි. ඉඩම්වල සහ ශ්‍රමිකයන්ගේ අඩු ඵලදායීතාවය කුරුණෑගල වැවිලි සමාගමද ඇතුළුව සියළුම වැවිලි සමාගම් වලට ඇති ප්‍රධාන ගැටළුවකි. වෙළෙඳපොල මිළ කෙරෙහි අවම බලපෑමක් හෝ නොඑසේනම් බලපෑමක් කළ නොහැකි වගාකරුවන් පිළිබඳව හා මිලෙහි සිදුවන සෘතුමය වෙනස්වීම් සැළකිල්ලට ගෙන සියළු ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් වන තිරසාර ආකෘතියක් ගොඩනැංවීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් මේ වන විට ගොඩනැංවී ඇත. ඇඟළුම් කර්මාන්තය තුල මෙන් නොව විශේෂයෙන්ම පොල් කර්මාන්තය තුල සිටින ඒ කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් (ප්‍රතිලාභීන්) බොහෝ විට හුදෙකලා ස්වභාවයක් පෙන්නුම් කරන අතර එම සියළුම උනන්දුවක් දක්වන පාර්ශවයන් එක් අරමුණක් සහිතව සියළු ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් වන තිරසාර ආකෘතියක් ගොඩනැංවීමට ඒකාබද්ධ කතිකාවතක් සඳහා යොමු විය යුතුය.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන් සියළුම ප්‍රාදේශීය වැවිලි සමාගම් වල කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කොට ඉඩම්වල බදු කාලය දීර්ඝ කිරීම සඳහා ගනු ලබන වෑයම වඩාත් විශ්වාසදායීව ව්‍යාපාරය තුල තව දුරටත් ආයෝජනය කිරීමටත්, නව ආයෝජකයින් හා තාක්ෂණය ගෙන ඒම සඳහාත් ප්‍රබල අනුබලයක්

ලබා දෙන අතර ඒ තුලින් සමාගමේ තිරසාරත්වය සහ දිගුකාලීන සංවර්ධනය සඳහා මනා රුකුලක් වනු ඇත. ඉඩම්වල බදු කාලසීමාව දීර්ඝ කිරීමේ තීරණය තවදුරටත් ප්‍රමාද නොකර ක්‍රියාත්මක කිරීම සමාගම වඩාත් ඉහළ තලයකට ගෙන එම සඳහා රුකුල්වන උපායමාර්ගික ආයෝජනයන් සඳහා මනා පිටුවහලක් වනු ඇත. තිරසාර සංවර්ධනය කරා යන ගමනේදී සූර්ය බලශක්ති භාවිතය පිළිබඳව අප වැඩි අවධානයක් යොමු කරමු. වැඩිවන ගෝලීය උෂ්ණත්වය තුල ඇතිවන අහිතකර බලපෑම් වලට මුහුණ දීම සඳහා වැසි ජලය එක්රැස් කිරීම, බලශක්ති කළමනාකරණය, යාන්ත්‍රීකරණය වැනි තිරසාර උපායමාර්ග ක්‍රමවේදයන් තුලින් පාරිසරික අභියෝගයන්ට මුහුණදීමට හා පවත්නා ව්‍යාපාරික අවස්ථා උකහා ගැනීමට සමාගම කටයුතු කරනු ලබයි.

රාජ්‍ය කළමනාකරණය යටතේ දීර්ඝ කාලයක් තිස්සේ අප විසින් ක්‍රියාත්මක කරනු ලබන බෝග විවිධාංගීකරණ උපායමාර්ගික ක්‍රමවේදය මේ වන විට මල්ඵල ගැන්වී ඇත.

අපගේ ප්‍රශස්ථ හා දුරදක්නා කළමනාකාරිත්වය සමාගම කැපී පෙනෙන ලාභදායීත්වයක් කරා ගෙනයමින් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ලබා දෙමින් රටේ සංවර්ධනය සඳහා දායක වන රාජ්‍ය සමාගමක් බවට පත්කිරීමට කටයුතු කර ඇත. 2007 වසරේ සිට මේ වන විට රුපියල් මිලියන 280 ක් ලාභාංශ ලෙස ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී ඇති අතර මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 30 ක ලාභාංශ ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වේ.

බෝග විවිධාංගීකරණ උපායමාර්ගික ක්‍රමවේදය යටතේ මීට වසර ගණනාවකට පෙර ආරම්භ කර ඇති කුරුඳු වගාව තවදුරටත් ක්‍රියාත්මක කිරීමට සමාගම අවධානය යොමුකොට ඇත. කුඩා පරිමාණ නිෂ්පාදකයින් හා වතු සමාගම් වලින් යුක්ත වන ශ්‍රී ලංකාවේ වැවිලි අංශය සහනාධාර මගින් හා වෙනත් මූල්‍යාධාර මගින් දිරිගන්වනු ලබයි. එමෙන්ම මෙම ක්ෂේත්‍රය සඳහා විශාල ශ්‍රම දායකත්වයක් අවශ්‍ය වන අතර ශ්‍රම පිරිවැය ඉතා අධිකය. වැඩිවන ශ්‍රම පිරිවැය හා සේවක සංගම් වල ප්‍රබල ක්‍රියාකාරිත්වය සමස්ථ කර්මාන්තයේ උන්නතිය සඳහා බාධාවක් වී ඇත.

පසුගිය මූල්‍ය වර්ෂය තුල ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන් අපහට ලබාදුන් සහයෝගය කෙරෙහි මා ස්තූතිවන්ත වන අතර අපගේ මුඛ්‍ය අරමුණ වන්නේ එම සියළු පාර්ශවයන් සමඟ වඩාත් යහපත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමයි. අප අමාත්‍යාංශයේ සියළුම අමාත්‍යවරුන්ට හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අප වෙත ලබාදුන් සහයෝගයට ස්තූතිවන්ත වන අතර මෙම ශක්තිමත් බැඳීම් තුලින් වඩාත් සාර්ථක අනාගත ගමනක් යාමට අපි බලාපොරොත්තු වෙමු. වසර ගණනාවක් තිස්සේ අපගේ සේවකයින් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගි කරවමින් මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා කටයුතු කර ඇත. මෙම ව්‍යායාමය ඵලදායීතාවය වර්ධනය සඳහාත් නව තාක්‍ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම සඳහාත් පිටුවහලක් වී ඇත. සියළු මට්ටම් වල සේවකයින්ගේ සේවක කුසලතා වර්ධනය සඳහා සෑමවිටම අප කටයුතු කරනු ලබයි.

ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමන්ට, ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ලක්‍ෂමන් යාපා අබේවර්ධන මැතිතුමන්ට, අමාත්‍යාංශ ලේකම් රවීන්ද්‍ර හේවාවිතාරණ මැතිතුමන්ට, අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්ට සහ අනෙකුත් සියළුම අමාත්‍යාංශ නිලධාරීන්ට ඔවුන් අප වෙත ලබාදෙන මඟපෙන්වීම් හා සහයෝගය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පුදකිරීමට කැමැත්තෙමි.

කුරුණෑගල වැවිලි සමාගම මෙම තත්ත්වයට ගෙන ඒම සඳහා කැප වී කටයුතු කළ විධායක නිලධාරීන් ඇතුළු සියළුම සේවක මහත්ම මහත්මීන්ගෙන් ලද නොමඳ සහයෝගයට ස්තූති කිරීම සඳහා මෙය අවස්ථාවක් කරගැනීමට කැමැත්තෙමි. සියළුම අභියෝග වලට මුහුණ දීමේදී හා නව උත්පාදනයන් හා හඳුන්වාදීම් වලදී පෙරමුණ ගෙන කටයුතු කරන සේවක මණ්ඩලය සමාගමේ ශක්තිමත් පදනමයි. සමාගමේ සමස්ථ මෙහෙයුම සඳහා වගකියනු ලබන ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු සියළුම විධායක නිලධාරීන්, ප්‍රධාන කාර්යාලයේ සේවක මහත්ම මහත්මීන් පසුගිය වසර ගණනාවක් පුරා කරන ලද සේවය වෙනුවෙන් හා ඔවුන්ගේ කැපවීම අගය කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි. අපගේ කොටස් කරුවන් වන මහා භාණ්ඩාගාරය හා එහි නිලධාරීන්, සමාගමේ සභාපති ලෙස මාගේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා ලබාදෙන උපදෙස් හා සහයෝගය වෙනුවෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. අවසාන වශයෙන් අප සමාගම කෙරෙහි විශ්වාසය තැබූ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් වෙත ස්තූතිවන්තවන අතර ඉදිරියේදීද ඔබ සියළු දෙනාගේ සහයෝගය මම බලාපොරොත්තු වෙමි.

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

"තිරසර සාර්ථකත්වයක් උදෙසා පොල් හා රබර් යන ප්‍රධාන අංශ දෙකම අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් එම අංශ ඉතා ඉහල තලයකට ගෙන එන අතරතුර ජනිත වන්නාවූ නව අවස්ථා උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා කැපවීමෙන් අප කටයුතු කරනු ලබයි. මේ තුලින් සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශව කරුවන්ගේ සිය වටිනාකම ඉහළ නැංවීම අපගේ අභිලාශය යි."

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා පිළියෙළ කරන ලද විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශන ඇතුලත් වාර්ෂික වාර්තාව අපගේ ආයතනය කෙරෙහි උනන්දුව දක්වන සියළු පාර්ශවයන් වෙත ඉතාමත්ම හෘදයංගමව පිළිගන්වමි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පොල් නිෂ්පාදන සමාගම බවට පත්වීමේ අපගේ අභිලාෂය කරා ළඟාවීමේ අධිෂ්ඨානය තිරකරමින්, අභියෝග වලට මුහුණ දෙමින් සුවිශේෂී සංධිස්ථානයන් කරා ළඟා වූ විශේෂ වසරක් ලෙසට 2016 වසර හඳුන්වා දිය හැකිය.

මූලාශ්‍රයන් සමූහයකගේ අයහපත් බලපෑමට ලක් වූ 2016 වසර පොල් කර්මාන්තයේ අනාගත ස්වභාවය මනාව පිළිබිඹු කළ වසරක් ලෙසට විස්තර කළ හැකිය. අස්ථායී කාලගුණික තත්ත්වයන් නිෂ්පාදන ධාරිතාව පහළයාම කෙරෙහි බලපා ඇති අතර අනෙක් අතට බොර තෙල් මිළ පහළයාම හා ජාත්‍යන්තර ආර්ථික අවිනිශ්චිතභාවයන් හමුවේ ප්‍රධාන ජාත්‍යන්තර වෙළෙඳපොලවල ක්‍රය ශක්තියේ පහළයාමත් පොල් කර්මාන්තය කෙරෙහි අයහපත් ලෙස බලපා ඇත. කොළඹ පොල් වෙන්දේසියේ මිළ වසරේ වැඩි කාලයක් පුරා අඩු අගයක් ගැනීමද පොල් අංශයේ ලාභදායීත්වය අඩුවීම කෙරෙහි සෘජුව බලපාන ලදී.

වසරේ අවසාන භාගය වන විට ගෝලීය වෙළෙඳපොල තුල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණු අතර එම තත්ත්වය ඉදිරි වසර සඳහාද අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් ලෝක වෙළෙඳපොල හා බැඳුනු දේශීය වෙළෙඳපොල තුලද යහපත් තත්ත්වයක් ඇති වේයැයි අප බලාපෙරොත්තු වේ.

මෙම සියළුම අහිතකර බලපෑම් අපගේ සමස්ථ මූල්‍ය ප්‍රගතිය අඩාල කිරීමට හේතු වී ඇත. අපගේ ඒකාබද්ධ උපායමාර්ගික ක්‍රමෝපායන් සහ ස්ථායී මෙහෙයුම් මූල ධර්මයන් කාලගුණික විපර්යාසයන්ට සාර්ථකව මුහුණ දෙමින් ලාභදායී තෝතැන්නක් නිර්මාණය කිරීමට හේතු වී ඇත.

ගෝලීය උෂ්ණත්වය ඉහල යෑම තුල ඇතිවෙන්නා වූ අහිතකර බලපෑම් වලට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය උපායමාර්ගික ක්‍රමෝපායන් ලෙස ක්‍රියාත්මක කරන වැසි ජලය එක්රැස් කිරීම, බලශක්ති කළමනාකරණය, සේවක කළමනාකරණය සහ යාන්ත්‍රිකරණය වැනි ක්‍රමෝපායන් පාරිසරික අභියෝග ජය ගැනීමට මෙන්ම පවත්නා ව්‍යාපාර අවස්ථා උකහා ගැනීමටද රුකුලක් වී ඇත. තිරසාරත්වය නමැති මුඛ්‍ය උපායමාර්ගික ක්‍රමෝපාය සාර්ථකව ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් අනුබද්ධිත උපායමාර්ගික ක්‍රමෝපායන් සැකසීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

සේවක සංවර්ධනය

වසර ගණනාවක් තිස්සේ අපගේ සේවකයින් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගි කරවමින් මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා කටයුතු කර ඇත. මෙම ව්‍යායාමය ඵලදායීතාවය වර්ධනය සඳහාත් නව තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම සඳහාත් පිටුවහලක් වී ඇත. සියළු මට්ටම් වල සේවකයින්ගේ සේවක කුසලතා වර්ධනය සඳහා සෑමවිටම අප කටයුතු කරනු ලබයි.

කර්මාන්ත අංශය විග්‍රහය

පොල් අංශය

2016 වර්ෂය තුලදී පොල් නිෂ්පාදනයේ වැඩිවීම හේතුකොටගෙන පොල් මිළ පහළ යාමක් වාර්තා විය. පොල් වෙන්දේසිය සඳහා බ්‍රෝකර්වරුන් කීපදෙනෙකුගේ නියෝජනයක් පැවතීම සහ ඒ තුල ඇතිවන්නා වූ කතිපයාධිකාරි තත්ත්වයද පොල් මිළ පහත මට්ටමක පැවතීම සඳහා හේතු වී ඇත. සමාගමේ ලාභදායීත්වය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇතිකරන මෙම තත්ත්වය පිළිබඳව ඉහල මට්ටමේ පාලන අධිකාරීන් දැනුවත් කිරීම සඳහා කටයුතු කර ඇතත් ඒ පිළිබඳව නිසි අවධානයක් මේ වන තුරුත් යොමුව නොතිබීම කණගාටුවට කරුණකි. සංඛ්‍යාලේඛණ අනුව ජාතිකපොල් නිෂ්පාදනයෙන් 20% ක් පමණක් අපනයනය සඳහා යොමු වන අතර ඉතිරි 80% වම දේශීය පරිභෝජනය සඳහා යොමු වේ. ඒ අනුව දේශීය පොල් පරිභෝජනය වැඩිවීම ධනාත්මක ප්‍රවනතාවයක් බව පසුගිය වසර ගණනාවක දත්ත විශ්ලේෂණයෙන් පෙනී යයි.

2015 වර්ෂයේ පොල් ගෙඩි මිලියන 14.07 ක නිෂ්පාදනයට සාපේක්ෂව 2016 මූල්‍ය වර්ෂය තුලදී පොල් ගෙඩි මිලියන 16.65 ක අස්වැන්නක් ලබා ගැනීමට සමාගමට හැකිවිය. මෙය පසුගිය වසරට සාපේක්ෂව 18% ක වර්ධනයකි. නිසි පොහොර භාවිතය, කාබනික පොහොර භාවිතය, පොල් ලෙලි වැලලීම හා වසුන් යෙදීමද ඇතුළු සමාගම අනුගමනය කළ නිෂ්පාදන ඵලදායීතාවය වර්ධනය සඳහා හේතුවන අනෙකුත් ක්‍රමවේදයන් මෙම නිෂ්පාදන වර්ධනය සඳහා හේතු වී ඇත. එමෙන්ම ඒ තුල පොහොර සඳහා වැයවන වියදමද අඩුකර ගැනීමට සමාගමට හැකි වී ඇත. කාලගුණ විපර්යාසයන්ගේ බලපෑම වියළි කලාපය තුල පිහිටි වතුයායන් තුල දැඩි

ලෙස දක්නට ලැබේ. කෙසේ වෙතත් නිසි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් මඟින් නියං තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම සඳහා කටයුතු කර ඇත. කුරුණෑගල වැවිලි සමාගම සෑමවිටම නිසි කෘෂිකාර්මික හා ක්ෂේත්‍ර කළමනාකරණ ක්‍රමවේදයන් භාවිතය සඳහා යොමු වී සිටි අතර එහි ප්‍රතිඵල පසුගිය වර්ෂය තුලද මනාව දක්නට ලැබේ.

පොල් යටි වගා ඇති කිරීම හා පාළු සිටුවීම ඉතාම සාර්ථකව කරගෙන යනු ලබන අතර අක්කරයකට පවතින ගස් ගණන 57 ක් දක්වා ගෙන ඒමට සමාග මට හැකි වී තිබේ.

රබර් අංශය

ජාතික රබර් නිෂ්පාදනය අඛණ්ඩව පස්වන වසරටත් පහළ යාමක් පෙන්නුම් කළ අතර වසර 50 කට පසු අඩුම ජාතික රබර් නිෂ්පාදනය වාර්තා වූයේ 2016 වසරේදීය. ලෝක වෙළෙඳපොල තුල ඇති ඉල්ලුම් -සැපයුම් නොගැලපීම හේතුකොටගෙන රබර් මිළ පහළයාම කෙරෙහි ඇතිවන්නා වූ පීඩනය හමුවේ කඩා වැටෙන වෙළෙඳපොල තත්ත්වයක් තුල කුරුණෑගල වැවිලි සමාගම සිය රබර් අංශය තුල පෙන්නුම් කර ඇති ප්‍රතිඵලය සැබවින්ම ගතික වෙළෙඳපොල තත්ත්වයන්ට එරෙහිව අප විසින් අනුගමනය කළ ව්‍යාපාරික ආකෘතියේ ප්‍රතිඵලයකි. පසුගිය වසර තුල නිෂ්පාදනය උපරිම කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ උපාය මාර්ග තුල ලැබූ රබර් නිෂ්පාදනය හා එම අංශයේ මූල්‍ය ප්‍රතිඵලය සම්බන්ධයෙන් විශේෂයෙන්ම සතුටට පත් වන්නෙමු. පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වසර තුලදී රබර් ආදායමෙහි 2.29% ක ආන්තික පහළයාමක් පෙන්නුම් කළද නිෂ්පාදනයේ සාපේක්ෂ වර්ධනය 2.63% ක් විය.

අතුරු බෝග

2005 වසරේ සිට කුරුණෑගල වැවිලි සමාගම බෝග විවිධාංගීකරණය සඳහා සාර්ථකව යොමු වී ඇත. 2005 වසරේදී පැවති හෙක්ටයාර 71.79 ක් වූ වගා වපසරිය 2016 වසර අවසාන වන විට හෙක්ටයාර 645.75 ක් දක්වා වර්ධනය කිරීමට සමාගම කටයුතු කර ඇත. කජු, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, අඹ සහ පේර වියළි කලාපය තුල පිහිටි වතුයායන් තුල පිහිටුවීමට කටයුතු කර ඇති අතර තෙත් කලාපය තුල පිහිටි වතුයායන් වල රඹුටන් සහ දූරියන් සාර්ථකව වගා කර ඇත. පසුගිය වසර ගණනාවක් පුරා අඛණ්ඩව අතුරු බෝග අංශය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර පෙර වර්ෂයට සාපේක්ෂව මෙම වසර තුල අතුරු බෝග වලින් ලැබූ ලාභය 350% කින් වැඩි වී ඇත. 2016 වසර තුල ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වන්නේ ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව විසින් සංවිධානය කරනු ලැබූ හොඳම ගම්මිරිස් වගාකරු සඳහා පිරිනමන සම්මානය දිනා ගැනීමයි.

උපායමාර්ගික ක්‍රමෝපායන් සහ දැක්ම

මූල්‍යමය ප්‍රතිඵලයන් කෙරෙහි පමණක් නොව, අඛණ්ඩව පාලන ක්‍රමවේදයන් වල මනා වර්ධනයක් ඇති කිරීම මෙන්ම එම ක්‍රමවේදයන් මනා ශික්ෂණයකින් යුතුව යොදා ගැනීම අභියෝග ජය ගැනීම සඳහා හේතු වූ ප්‍රධානම කාරණා බව මාගේ විශ්වාසයයි. එමෙන්ම අපගේ ප්‍රධාන ව්‍යාපාරය කෙරෙහි දැඩි හා විශේෂ අවධානයක් යොමු කරන අතරතුර, අප සතු ශක්තීන්, වටිනාකම් දාමය සහ අප යෙදී සිටින සියළු ව්‍යාපාර අංශ වල අපගේ තරගකාරී ස්ථානය යළි යළිත් ඇගයීමට ලක් කරමින්, දිගුකාලීන තිරසාර සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහා ඇති විකල්ප ක්‍රමවේදයන් කෙරෙහි අවධානය යොමු කිරීම අපගේ ප්‍රතිපත්තියයි.

පසුගිව වසරේදී ආරම්භ කළ පෞද්ගලික - රාජ්‍ය හවුල් ව්‍යාපාර යෝජනා ක්‍රම කෙරෙහි තවදුරටත් යොමුවීමට සමාගම බලාපොරොත්තු වේ. මෙම ක්‍රමවේදය තුලින් පරිසර හිතෛෂී කෘෂිකාර්මික සංචාරක කර්මාන්තය සහ පරිසරයට හානි නොවන වෙනත් ව්‍යාපෘති යෝජනා කෙරෙහි අවධානය යොමු කරණ අතර ඒ තුලින් පාරිසරික වෙනස්වීම් තුලින් සමාගමේ ලාභදායිත්වය කෙරෙහි වන බලපෑමට එරෙහිව කටයුතු කිරීමට උත්සාහ ගනී. වැඩිවන සේවක පිරිවැය වැවිලි ක්ෂේත්‍රය තුල ඇති ප්‍රබල අභියෝගයක් වන අතර එයට පිළියමක් ලෙස සමාග මේ පිරිවැය සහ සේවකයින් හට ලැබෙන ප්‍රතිලාභ අතර මනා තුලනයක් ඇතිවන පරිදි වූ වැටුප් ආකෘතියක් සැකසීම සඳහා කටයුතු කර ඇත. සෘජු අලෙවිය මගින් විකුණුම් ප්‍රවර්ධනය සඳහා වෙනස් වූ අලෙවි උපායමාර්ගික ක්‍රමවේදයන් සැකසීම සඳහා කටයුතු කර ඇත. පොල් යටිවගා ඇතිකිරීමට සමගාමීව බෝග විවිධාංගීකරණය කෙරෙහි යොමුවීම තිරසාර සංවර්ධනය සඳහා අප අනුගමනය කරන තවත් එක් උපායමාර්ගික ක්‍රමවේදයකි. අතුරු බෝග ලෙස ගම්මිරිස්, කුරුඳු, රඹුටන් සහ අඹ වගා කර ඇති අතර සුළු අපනයන බෝගයන් වන ගම්මිරිස්, කුරුඳු වැනි බෝග (කුළුබඩු) ව්‍යාප්තිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. එය සමාගම යොමුවීමට බලාපොරොත්තු වන පරිසර හිතෛෂී කෘෂිකාර්මික සංචාරක කර්මාන්තය සඳහාද උපකාරී වනු ඇත.

පාලනය සහ භාරකාරත්වය

ශක්තිමත් ආයතනික යහපාලනය තිරසාර ව්‍යාපාරයක අඩිතාලමයි. ඒ අනුව පාලන ක්‍රියාවලිය තුල ඉහල ගුණාත්මක තත්ත්වයක් පවත්වාගෙනයාම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කරන අතර එය සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් සඳහා වන අපගේ වගකීමක් ලෙස අප සලකන්නෙමු. අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය හා ඉතා සමීපව කටයුතු කරමින් කෘෂි කර්මාන්තය මුහුණ දෙන අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා සමාගමට ඇති අවදානම් පෙරාතුව හඳුනාගැනීම, විශ්ලේෂණය හා කළමනාකරණය කරනු ලබයි.

අනාගත දැක්ම

ඉදිරි අනාගතය වඩාත් සුභදායී එකක් වනු ඇතැයි මා විශ්වාස කරමි. දේශීය පොල් කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී ස්වරූපයක් ගනු ලැබූවද දේශීය පොල් කර්මාන්තය තුළ පොල් සඳහා ඇති ඉල්ලුමෙහි යම් වර්ධනයක් පෙන්නුම් කරයි. අනාගත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අපට යම් කාලයක් ගතවනු ඇත. රබර් කර්මාන්තයද පසුගිය වසර 04 ක පසුබෑස්ම අවසන් කොට නැවත යහපත් තත්ත්වයකට පත් වේයැයි මම විශ්වාස කරමි.

තිරසර සාර්ථකත්වයක් උදෙසා පොල් හා රබර් යන ප්‍රධාන අංශ දෙකම අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් එම අංශ ඉතා ඉහල තලයකට ගෙන එන අතරතුර ජනිත වන්නාවූ නව අවස්ථා උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා කැපවීමෙන් අප කටයුතු කරනු ලබයි. මේ තුලින් සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශව කරුවන්ගේ සිය වටිනාකම ඉහළ නැංවීම අපගේ අභිලාශය යි.

පරිසර හිතෛෂි සංචාරක ව්‍යාපාරය සඳහා මූලික අඩිතාලම සැකසීමට අප ක්‍රියාකරමින් සිටින අතර කුරුණෑගල වැවිලි සමාගමට පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකාවටම විශාල ප්‍රතිලාභයක් ගෙන දෙනු ඇතැයි අපි විශ්වාස කරමු. මීට අමතරව පරිසර හිතෛෂි ව්‍යාපෘති ගණනාවක් ඉදිරි වසරේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමු. අහිතකර කාලගුණික තත්ත්වයන්ගෙන් සමාගමේ අභිවෘධියට සැළකියයුතු බලපෑමක් එල්ල වූ වසරක් ලෙසට මෙම වර්ෂය හඳුන්වා දිය හැකිය. කාලගුණික විපර්යාසයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර අප විසින් ක්‍රියාවට නංවා ඇති ප්‍රධාන ක්‍රමෝපායන් සමස්ථ වැවිලි ක්ෂේත්‍රයටම හඳුන්වාදීමට බලාපොරොත්තු වේ.

ඇගයීම හා ස්තූතිය

ආයතනයේ සාර්ථකත්වය සඳහා උරදෙන කළමනාකරණ කණ්ඩායම ඇතුළු සමස්ථ සේවක මණ්ඩලය ඇගයීමට හා ඔවුනට මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එසේම ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමන්ට, ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ලක්ෂමන් යාපා අබේවර්ධන මැතිතුමන්ට, අමාත්‍යාංශ ලේකම් රවීන්ද්‍ර හේවාවිතාරණ මැතිතුමන්ට, අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්ට සහ අනෙකුත් සියළුම අමාත්‍යාංශ නිලධාරින්ට ඔවුන් අප වෙත ලබාදෙන මඟපෙන්වීම් හා සහයෝගය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පුදකිරීමට කැමැත්තෙමි. එමෙන්ම නොමඳ සහයක් ලබාදෙන කුරුණෑගල වැවිලි සමාගමේ සභාපති, පියසෝම උපාලි මැතිතුමා ඇතුළු සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා මාගේ කෘතඥතාපූර්වක ස්තූතිය පුද කර සිටිමි. එසේම කුරුණෑගල වැවිලි සමාගමේ ලේකම්වරුන් ලෙස කටයුතු කරන කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පෞද්ගලික) සමාගමට සහ ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට ඔවුන් ලබාදුන් සහයෝගය හා දායකත්වය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පුද කරමි.

එමෙන්ම කුරුණෑගල වැවිලි සමාගම මෙවන් වූ තලයකට ඔසවා තැබීම සඳහා මහත් වූ කැපවීමෙන්, පක්ෂපාතීත්වයෙන් හා උනන්දුවෙන් කටයුතු කරන කාර්යක්ෂම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම, වතු අධිකාරීවරුන් සහ සියළුම සේවක මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන්ගේ කැපවීම වෙනුවෙන් නැවතත් මාගේ ස්තූතිය පුදකිරීමට කැමැත්තෙමි.

දිගුකාලීන තිරසාර සංවර්ධන උපායමාර්ගික ක්‍රමෝපාය අනුව යමින් අඛණ්ඩ සංවර්ධනයක් කරා ගමන් කිරීම හා ඒ තුලින් පොල් අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සහ ඊට සමගාමීව බෝග විවිධාංගීකරණය හා අගය එකතු කිරීම මුල් කරගත් ව්‍යාපාරික රටාවකට යොමුවීම හා ඒ තුලින් ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදක තත්ත්වයෙන් අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදකයෙකු බවට පත්වීම අපගේ අභිලාෂයයි.

අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ. එම්. පියසෝම උපාලි මහතා

සභාපති

2015 ජනවාරි මස සිට කුරුණෑගල වැවිලි සමාගමේ සභාපති ලෙස පත්වූ පියසෝම උපාලි මහතා සතු අති විශාල දැනුම් සම්භාරය සහ වසර ගණනාවක පළපුරුද්ද අපගේ සමාගමට වඩාත් ඉහළ ජයග්‍රහනයන් ලඟාකර ගැනීම සඳහා නිසැකවම දායකවනු ඇත. තිස් වසරක ඔහුගේ කීර්තිමත් දේශපාලනික භූමිකාව තුල ඉතිහාසයේ පළමු වරට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපති බවට පත් විය. එමෙන්ම ඔහු 1988 දී වයඹ පළාත් සභාව ආරම්භයේ වයඹ පළාත් සභාවේ පළමු නියෝජ්‍ය සභාපතිවරයා ලෙසද කටයුතු කළේය.

ඔහුගේ දේශපාලන දිවියට පෙර උපාලි මහතා 1980 දී ප්‍රථම කුරුණෑගල දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම ඔහු කුලියාපිටිය විවිධ සේවා සමූපාකාර සමිතියේ සභාපතිවරයකු වශයෙන්ද ජාතික සමූපාකාර සභාවේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන්ද කටයුතු කර ඇත. ඉන් පසු පියසෝම උපාලි මහතා 1988 දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කුලියාපිටිය මැතිවරණ කොට්ඨාෂය නියෝජනය කළ අතර, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් 1989-2004 දක්වා අඛණ්ඩව වසර 16 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන ලදී.

ඔහු 2002-2004 දක්වා ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කටයුතු කළ දිගු කාලය තුළදී ආණ්ඩු පක්ෂයේ සහකාර සංවිධායක සහ නියෝජ්‍ය සංවිධායක වැනි විවිධ තනතුරු ඔහු විසින් හෙබවීය. ජපානයේ කෘෂිකාර්මික සහ සමූපාකාර වැඩසටහන, රුසියාවේ තරුණ කටයුතු වැඩසටහන සහ එක්සත් රාජධානියේ සහ ස්පාඤ්ඤයේ පැවති බලය බෙදීමේ වැඩසටහන ඇතුළුව විවිධ විදේශීය වැඩසටහන් රාශියකට ඔහු සහභාගි වී ඇත.

ඊට අමතරව, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළට විශාල වශයෙන් කේන්ද්‍රගත වෙමින් දිවයින පුරා ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන්වලදී ඔහු සක්‍රීයව දායක වී ඇත. වසර ගණනාවක් පුරා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පියසෝම උපාලි මහතා විසින් රැස්කර ගත් දැනුම සහ පළපුරුද්ද, කුරුණෑගල වැවිලි සමාගම තිරසාර සංවර්ධනයක් සහ අභිවෘද්ධිය කරා යන ගමනේදී නිසැකවම වත්කමක් වී ඇත.

එච්. ඒ. පී. තුසිත කුමාර ඩයස් මහතා

විධායක අධ්‍යක්ෂ

කුරුණෑගල ප්‍රදේශය තුල මුල් බැසගත් ව්‍යාපාරික පවුලකින් පැවත එන තුසිත කුමාර ඩයස් මහතා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමෙන් අනතුරුව තම ජීවිතයේ මුල් අවධියේදීම පවුලේ ව්‍යාපාරික කටයුතු සඳහා සම්බන්ධ විය. ජපානයෙන් ශ්‍රී ලංකාවට අත් ට්‍රැක්ටර් ආනයනය කිරීමේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කළ ඒ මහතා පසුව බර වාහන, යන්ත්‍රෝපකරණ, කෘෂිකාර්මික උපකරණ හා ට්‍රැක්ටර් ආනයනය කිරීම සඳහා යොමු විය. ඉන්පසු එල්. එස්. ටී. ට්‍රේඩින් සමාගම නමින් දේපල සංවර්ධනය, වාණිජ ගොඩනැගිලි බදු දීම හා නඩත්තුව සඳහා යොමුවන ලදී. මීට අමතරව ඔහු පොල් සහ රබර් ඉඩම් හිමි වැවිලි කරුවෙකි. එමෙන්ම ඔහු ප්‍රදේශයේ අඩු වරප්‍රසාද සහිත ජනතාවගේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම සම්බන්ධ වන අතර පරාර්ථකාමී මහජන හිතෛෂියෙකු වශයෙන් ප්‍රදේශය තුල කීර්තියට පත්ව ඇත.

ඩී. එම්. බණ්ඩාරනායක

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

2015 මාර්තු මස සිට කුරුණෑගල වැවිලි සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස පත් වූ ඩී.එම්.බණ්ඩාරනායක මහතා මහව විජයබා ජාතික පාසලේ ආදි ශිෂ්‍යයෙක් වන අතර කෘෂිකාර්මික, ගොවිපල සහ පුද්ගලික ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ වසර ගණනාවක පළපුරුද්ද ඔහු සතුය. ඔහු දේශපාලඥයෙක් ලෙස ජනතාව සමඟ වැඩ කිරීමෙන් සහ පුද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ වෘත්තීකයන් සමඟ කටයුතු කිරීමෙන් ලබා ඇති අත්දැකීම් සමුදාය අතිමහත්ය. කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් 1989- 2004 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ හිටපු වී සංවර්ධන අමාත්‍යවරයාද වේ.

ඩී.එම්.බණ්ඩාරනායක මහතා 1985 සිට 1986 දක්වා ගල්ගමුව පෞද්ගලික බස්රථ සංගමයේ භාණ්ඩාගාරික වශයෙන්ද, විලව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය සාධන බලකායේ සක්‍රීය සාමාජිකයෙක් සහ සභාපති වශයෙන්ද කටයුතු කරමින් 1985 සිට 1989 දක්වා විලව ග්‍රාමෝදය සංවර්ධන සභාවේ සභාපති ලෙසද කටයුතු කරන ලදී. එමෙන්ම 1985 සිට 1989 දක්වා යාපහුව කිරි ගොවීන්ගේ සංගමයේ සභාපති වශයෙන්ද 1989 සිට 2003 දක්වා යාපහුව පන්සලේ පෙරහැර සංවිධාන කමිටුවේ සභාපති ලෙසද සේවය කරමින් යාපහුව ප්‍රදේශය තුළ ආගමික සිද්ධස්ථාන සහ ආයතන සංවර්ධනය කිරීම සඳහා විශාල වශයෙන් දායක වී ඇත.

එච්. ඒ. එන්. සමන් කුමාර මහතා

අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත

2015 මාර්තු මස සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ/ මහා භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් වූ සමන් කුමාර මහතා 2015.04.07 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සභාපති ලෙසද කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතන ගණනාවක ජ්‍යේෂ්ඨ කළමනාකරණ සාමාජිකයෙකු මෙන්ම අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස වසර ගණනාවක් කටයුතු කරමින් සමන් කුමාර මහතා ලබා ඇති අත්දැකීම් සමුදාය අතිමහත්ය. ඔහු 2002 මැයි සිට 2005 අගෝස්තු දක්වා කාලගුණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) වශයෙන්ද, 2005 අගෝස්තු සිට 2010 දෙසැම්බර් දක්වා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද, 2010 දෙසැම්බර් සිට 2013 ජුලි දක්වා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද. 2013 ජුලි සිට 2013 සැප්තැම්බර් දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්ද සේවය කර ඇති අතර, 2013 සැප්තැම්බර් සිට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු වශයෙන්ද කටයුතු කරයි. මීට අමතරව සමන් කුමාර මහතා දැරූ අධ්‍යක්ෂක තනතුරු පහත පරිදි වේ. 2006 සිට 2010 දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ අධ්‍යක්ෂ, 2008 සිට 2011 දක්වා සීමිත ගල්ඔය වැවිලි සමාගමේ අධ්‍යක්ෂ, 2009 සිට 2011 දක්වා ගල්ඔය හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ, 2010 සිට 2011 දක්වා රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ, 2013 සිට 2015 දක්වා පරන්තන් කෙමිකල්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ. දැනට ඔහු 2015 මුල සිට වෙස්ට් කෝස්ට් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ වරයෙක් ලෙස සේවය කරයි.

ඔහු 2001 වසරේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ගත් අතර, 2009 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යවහාර මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ගන්නා ලදී. එමෙන්ම 2013 දී ජපාන අන්තර් ජාතික විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ගන්නා ලදී.

ඩබ්. එම්. ඩී. බී. අබේරත්න මහතා

අධ්‍යක්ෂ

2015 මාර්තු මස සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූ අබේරත්න මහතාට ගිණුම්කරණ සහ විගණන ක්ෂේත්‍රය තුළ වසර ගණනාවක පළපුරුද්දක් සතු වේ. එමෙන්ම, 2015.04.07 දින සිට කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයෙක් ලෙසද කටයුතු කරයි. ඔහු ඔහුගේ වෘත්තීමය දිවිය ආරම්භ කලේ තොර්න්ටන් පණ්ඩිතරත්න පුද්ගලික සමාගමෙන් වන අතර, පසුව ලංකා කිරි කර්මාන්ත සමාගම, මාලදිවයිනේ හොලිඩේ අයිලන්ඩ් රිසෝර්ට්, ඩී.බී. අබේරත්න සහ සමාගම සහ රාජ්‍ය දැව සංස්ථාව යන ආයතනවල සේවය කරන ලදී.

ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මානව හිමිකම් පිළිබඳ ඩිප්ලෝමාව ඇතුළුව වෘත්තීමය සුදුසුකම් රාශියක් ඔහු සතුය. ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ මනා සුදුසුකම් සහිත වෘත්තිකයෙක් වන අබේරත්න මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ, එක්සත් රාජධානියේ මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ, එක්සත් රාජධානියේ පොත් තබන්නන්ගේ අන්තර් ජාතික සංගමයේ, වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාවේ ආරම්භක සාමාජික), වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සාමාජිකයෙක් වන අතර, මහනුවර රොටරි හෙරිටේජ් ආයතනයේ සාමාජිකවරයෙක් මෙන්ම මුළු දිවයිනටම බලපාන සාමදාන විනිශ්චයකාරවරයෙක්ද වේ.

එම්.පී.ඩී. ඉඳුනිල් අමරසිංහ මහතා

අධ්‍යක්ෂ

ඉඳුනිල් අමරසිංහ මහතා වැවිලි ක්ෂේත්‍රය තුල කීර්තිමත් වෘත්තීමය වැවිලිකරුවකු ලෙස වසර ගණනාවක අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියයි. කනිෂ්ඨ සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස 1999 දී කොටගල වැවිලි සමාගමෙන් වැවිලි ක්ෂේත්‍රයට පිවිසි ඉඳුනිල් අමරසිංහ මහතා 2003 වසරේදී වතු අධිකාරිවරයෙකු ලෙස ෆින්ලේස් තේ වතුයායට සම්බන්ධ විය. එම වතුයායට අයත් අළුපොල, බ්ලෙයාර්ලෙමන්ඩ්, දම්මේරිය - ඒ, නහවිල යන වතුයායන් වල වතු අධිකාරිවරයෙකු ලෙස සේවය කළ ඒ මහතා වර්තමානයේදී අක්කර 1100 කින් යුත් විවිධ බෝග වර්ග වලින් සමන්විත පස්සර වතු සමූහයට අයත් දම්මේරිය - බී වතුයාය කළමනාකරණය කරනු ලබයි. ඔහු පොල්, රබර්, ගම්මිරිස් සහ තේ සම්බන්ධ විශේෂඥ දැනුමකින් යුක්ත වන අතර ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී වැවිලි කළමනාකරණ උපාධිය ලබාගෙන ඇත. මීට අමතරව ඔහු ඌව විධායක නිලධාරීන්ගේ සංගමයේ ලේකම් වශයෙන්ද කටයුතු කරනු ලබයි.

ආර්. සිඩ්නි කුලතිලක මහතා

අධ්‍යක්ෂ

2016 ඔක්තෝබර් මස සිට කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ කුලතිලක මහතා කුරුණෑගල මාවතගම පොතුබෝව මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ඇතුලත්ව කලා උපාධිය ලබා ගන්නා ලදී.

භූගෝල විද්‍යා ගුරුවරයෙකු වශයෙන් තම වෘත්තීමය දිවිය ආරම්භ කළ කුලතිලක මහතා තමාගේ වෘත්තීය ගමන වෙනත් අතකට යොමු කරමින් පූර්ණ කාලීන ව්‍යාපාරික කටයුතු සඳහා යොමු විය. වර්තමානයේදී ඔහු එස් ඒ කන්ස්ට්‍රක්ෂන් සමාගමෙහි සහ මාවතගම සේෆ්ටි ෆියුස් ඉන්ඩස්ට්‍රි සමාගමෙහි කළමනාකරණ අධ්‍යක්ෂ ධූරය හොබවන ලද අතර ට්‍රයිස්ටාර් ඉන්ඩස්ට්‍රියල් එක්ස්ප්ලෝසිව් පෞද්ගලික ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද කටයුතු කරනු ලබයි. මුළු දිවයිනටම බලපාන සාමදාන විනිශ්චයකරුවකු වන ඔහු ශ්‍රී ලංකාවේ එක්ස්ප්ලෝසිව් ඩීලර්ස් ඇසෝසියේෂන් හි ලේකම්වරයා ලෙසද ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සම්බන්ධීකාරවරයෙකු ලෙසද කටයුතු කරනු ලබයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය - 2016

ප්‍රධාන විධායක නිලධාරී

එස්. එම්. එම්. සමරකෝන් මහතා

විද්‍යාවේදී ගෞරව (කෘෂිකර්ම)
විද්‍යාපති (කෘෂි ආර්ථික)

කළමනාකරු - මූල්‍ය

පී. එම්. ඩී. පී. ප්‍රේමතිලක මහතා

විද්‍යාවේදී ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ (විශේෂ)
සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී/
සහතිකලත් වෘත්තීය කළමනාකරු

කළමනාකරු - විගණන

එම්. එම්. ජේ. කුරේ මහතා

කළමනාකරු - මානව සම්පත් සහ පාරිපාලන

අයි. ඒ. ගුණවර්ධන මහතා

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ (මානව සම්පත් කළමනාකරණය) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

කළමනාකරු - වතු අධීක්ෂණ හා සම්බන්ධීකරණ

එස්. එම්. ආර්. පී. සත්කුමාර මහතා

විද්‍යාවේදී (කෘෂි විද්‍යා) වැවිලි කලමනාකරණ (විශේෂ)

කළමනාකරු - අලෙවිකරණ

ජේ. කේ. ජේ. පී. ජයවර්ධන මහතා

විද්‍යාවේදී ගෞරව (කෘෂිකර්ම) විද්‍යාපති (කෘෂි ව්‍යාප්ති)

පලාත් වතු අධිකාරීවරු - 2016

එම්. එල්. ඒ. පී. පෙරේරා මහතා
වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා

ජී. කේ. ඒ. ජයවර්ධන මහතා

කේ. එල්. එච්. සී. පෙරේරා මහතා
සත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමා

ඒ. එම්. පී. අබේකෝන් මහතා
වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා
කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා

කේ. පී. ඩී. එන්. කලුගල්ල මහතා
වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා මානව
සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා

යූ. පී. ආර්. එම්. පතිරණ මහතා
විද්‍යාවේදී පශු වෛද්‍ය ලියාපදිංචි පශු
ශල්‍ය වෛද්‍ය

එම්. ටී. ජේ. පෙරේරා මහතා
විද්‍යාවේදී ගෞරව (කෘෂිකර්ම) විශේෂ

ජේ. එම්. ඒ. ඒ. මුණසිංහ මහතා
ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්ම)
විද්‍යාවේදී වැවිලි කළමනාකරණ

මූල්‍ය සමාලෝචනය

සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන්ට, සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වඩාත් පැහැදිලි හා පූර්ණ අවබෝධයක් ලබාදීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ සඳහා වඩාත්ම සුදුසු පරිචයන් අඛණ්ඩව යොදා ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ පරිසරයේ සිදුවන නව වර්ධනයන් කෙරෙහි නිරන්තර අවධානය යොමු කරමින් ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ සිදු විය යුතු වෙනස්කම් සිදුකර ඇත. අංක 46 සිට 86 දක්වා වන පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනය හඳුන්වා දී ඇති මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ රාමුව හා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේද ප්‍රකාශන වලට අනුකූලව පිළියෙල කර ඇත.

මූලික කාර්යයන් සහ ව්‍යාපාරයේ ස්වභාවය

මෙම වසර තුළදී ද පොල්, රබර් සහ වෙනත් කෘෂිකාර්මික බෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම යන සමාගමේ මූලික කාර්තව්‍යයන් අඛණ්ඩව හා නොවෙනස්ව පැවතිනි.

මෙහෙයුම් විෂය පථය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම; කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුල ඇති විවිධ කෘෂි දේශගුණික කලාපයන් ආවරණය වන පරිදි විහිදුන වතුයාය 08 කින් සමන්විත වන අතර එම වතු යායන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 2 ක් 3 ක් පුරා විහිදුන කුඩා වතු බෙදුම් සමූහයකින් සමන්විත වේ.

ඉඩම් වපසරිය

ජාතික අවශ්‍යතාවයන් සහ ව්‍යවස්ථාපිත නිෂ්වයන් සඳහා ඉඩම් නිදහස් කිරීම හේතු කොට ගෙන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට විශාල ඉඩම් ප්‍රමාණයක් අහිමි වී ඇත. 1992, කුරුණෑගල වැවිලි සමාගම ආරම්භ කරන අවස්ථාවේදී සමාගමට බාරදුන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් (හෙක්ටයාර 6,722) 26% ක පමණ ඉඩම් ප්‍රමාණයක් (හෙක්ටයාර 1,750.88) මේ වන විට සමාගමට අහිමි වී ඇත. 2016 මූල්‍ය වර්ෂය අවසාන වන විට සමාගම සතුව ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 4,971.12 කි.

පලාත් වතුවල ඉඩම් වපසරිය

	ප්‍රමාණය (හෙක්ටයාර)
අත්තනගල්ල	668.27
දඹදෙනිය	462.18
දොඩම්ගස්ලන්ද	690.73
හිරියාල	980.21
කටුගම්පල	617.12
කුරුණෑගල	555.80
මහායාය	446.26
නාරම්මල	550.55

නිෂ්පාදන සමූහය

වතුයාය 08 හි ම ප්‍රධාන බෝගය පොල් වන අතර රබර් වගාව අත්තනගල්ල, මහායාය, සහ දොඩම්ගස්ලන්ද පලාත් වතුවලට සීමා වී තිබේ. මීට අමතරව භූමියේ සහ දේශගුණික යෝග්‍යතාවය අනුව අතුරු බෝග වර්ග රාශියක් වගාකර ඇත.

ආදායම

2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සමාගමේ ආදායම පසුබෑමක් පෙන් වූ අතර 2015 දී රු.මිලියන 492 ක් වූ මුළු ආදායම, 2016 වර්ෂයේදී රු. මිලියන 472 ක් විය. මේ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ සමාගමේ ප්‍රධාන බෝගයන් වන පොල් හා රබර් වල මිල ගණන් පහල යාමයි.

ආදායමේ සංයුතිය පහත පරිදි වේ;

	2016	2015
පොල්	88%	90%
රබර්	6%	6%
වෙනත් බෝග	6%	4%

ලාභය

2015 වර්ෂයේදී රු. මිලියන 155 ක් වූ බදු පසු ලාභය 2016 වර්ෂයේදී රු. මිලියන 126.58 ක් දක්වා 19% කින් පහළ බසින ලදී. මෙම ලාභය සඳහා වැඩිම දායකත්වයක් පොල් අංශයෙන් ලැබුණු අතර එම දායකත්වය මිලියන 159 කි. 2015 වර්ෂය සඳහා වූ මිලියන 180 ක දායකත්වයට සාපේක්ෂව මෙම වර්ෂයේ පොල් අංශයේ දායකත්වයේ අඩුවීම රුපියල් මිලියන 22 කි.

රබර් අංශයේ අලාභය පසුගිය වසරට සාපේක්ෂව තව දුරටත් වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වසරේදී මිලියන 07 ක් වූ රබර් අංශයේ අලාභය රුපියල් මිලියන 17 ක් දක්වා වර්ධනය වී ඇත. මේ සඳහා බලපෑ ප්‍රධානතම හේතු වන්නේ රබර් මිලෙහි වූ විශාල පසුබෑම හා පුහුණු කිරි කපන්නන්ගේ හිඟයයි. වෙනත් අතුරු බෝග වලින් ලද ලාභය පසුගිය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 08 කින් වර්ධනය වී ඇත.

2016 වර්ෂයේදී රුපියල් මිලියන 120 ක් වූ පරිපාලන වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව 10% ක අඩුවීමක් පෙන්නුම් කරයි. 2015 වර්ෂය සඳහා එම අගය රුපියල් මිලියන 133 ක් විය.

2015 වර්ෂයේදී රුපියල් මිලියන 166 ක් වූ බදු පෙර ලාභය රුපියල් මිලියන 144 ක් දක්වා 13% ක පහළ යාමක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ සමස්ථ බදු වියදම රුපියල් මිලියන 18 ක් වූ අතර එය පෙර වර්ෂයේදී රුපියල් මිලියන 11 කි.

	2016 රු. මිලි.	2015 රු. මිලි.
පොල් වලින් ලද ලාභය	159	180
රබර් වලින් ලද අලාභය	(17)	(7)
වෙනත් බෝගවලින් ලද ලාභය	**10**	**2**
දළ ලාභය	152	175
වෙනත් මෙහෙයුම් ආදායම්	97	122
පරිපාලන වියදම්	(120)	(133)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ලාභය	129	164
ශුද්ධ මූල්‍ය ආදායම	40	28
පොලී ආදායම	(25)	(26)
පොලී වියදම	15	2
බදු පෙර ලාභය	144	166
ආදායම් බදු වියදම	(18)	(11)
වසරේ ලාභය	126	155

පොල් අංශය

2016 වර්ෂය අවසානයට කුරුණෑගල වැවිලි සමාගම සතුව ඇති ඵල දරණ පොල් ඉඩම් වපසරිය හෙක්ටයාර 3108.97 ක් වන අතර පොල් යටි වගා ප්‍රමාණය සමස්ථ පොල් ඉඩම් වපසරියෙන් 23% කි. අක්කරයකට පැවතිය යුතු පිළිගත් ප්‍රශස්ථ පොල් ගස් සංඛ්‍යාව 60 ක් වන අතර කුරුණෑගල වැවිලි සමාගමේ පොල්වතුවල අක්කරයකට ඇති පොල් ගස් සංඛ්‍යාව 58 කි. 2005 ජනවාරි 01 දින සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශයට පවරා ගන්නා විට අක්කරයකට පැවති පොල් ගස් සංඛ්‍යාව 50 කි. 2005 වසරේ සිට පොල් අස්වැන්නේ වර්ධනයක් පෙන්නුම් කල අතර 2012 වසරේදී මෙතෙක් වාර්තාවූ ඉහළම පොල් අස්වැන්න වාර්තා කෙරිනි. 2013 වසරේදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ඇතුළුව සියලුම පොල් වගාකරුවන් පොල් අස්වැන්නේ විශාල පසුබෑමකට ලක්විය. 2012 වසරේදී පොල් ගෙඩි මිලියන 18.10 ක් වූ වැඩිම පොල් අස්වැන්න 2013 වර්ෂයේදී මිලියන 13 ක් දක්වා පහළ බසින ලදී. 2015 වර්ෂය තුල දී යම් වර්ධනයක් පෙන් වූ අතර එය පොල් ගෙඩි මිලියන 14.7 ක් විය. 2016 වර්ෂයේදී පොල් අස්වැන්න පසුගිය වසරට සාපේක්ෂව 18% කින් පමණ වර්ධනය වූ අතර එය ගෙඩි මිලියන 16.7 කි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ පොල්, පොල් සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලබන වෙන්දේසියේදී විකුණනු ලබයි. 2016 වර්ෂයේ සමාග මේ පොල් ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිළ රුපියල් 24.71 ක් වූ අතර එම අගය 2015 වසර සඳහා 31.21 ක් විය. එය පොල් ගෙඩියක මිළ පසුගිය වසරට සාපේක්ෂව රුපියල් 6.50 ක අඩුවීමකි. විකුණුම් මිලෙහි අඩුවීම තුල පසුගිය වසරට සාපේක්ෂව පොල් ආදායමේ වූ අඩුවීම රුපියල් මිලියන 109 ක් වූ අතර පොල් නිෂ්පාදනයේ සාපේක්ෂ වැඩිවීම පොල් ආදායමේ වූ එම අඩුවීම තුලනය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය

	රු. මිලි.
විකුණුම් මිලෙහි අඩුවීම තුල පසුගිය වසරට සාපේක්ෂව පොල් ආදායමේ වූ අඩුවීම	(109.71)
පොල් නිෂ්පාදනයේ වැඩිවීම තුල ආදායමේ වූ සාපේක්ෂ වැඩිවීම	81.25
පසුගිය වසරට සාපේක්ෂව පොල් ආදායමේ වූ සමස්ථ අඩුවීම	(28.46)

කෙසේ වෙතත් තව දුරටත් සමාගමේ ආදායම් සංයුතිය සඳහා ප්‍රධාන දායකත්වය ලබා දී ඇත්තේ පොල් නිෂ්පාදනයයි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ඵලදායිතාවය ඉහළ නැංවීම හා සොරකම් අවම කිරීම අරමුණු කොටගෙන සාමාන්‍ය පොල් කැඩීම් ක්‍රම වේදය වන දෙමසකට වරක් පොල් කැඩීම වෙනුවට හැකි සෑම වගා ක්ෂේත්‍රයකම මසකට වරක් පොල් කැඩීම සිදුකරයි. මෙම ක්‍රමය තුල වැටුනු පොල් ප්‍රමාණය අඩුවන අතර ඒ තුලින් සොරකම් කිරීමට ඇති අවස්ථාවන් අවම වේ. මීට අමතරව මෙම ක්‍රමය තුල පැසුනු පොල් වල්ල ඉක්මණින් ඉවත් කිරීම තුල එම පොල් වල්ල නඩත්තුවට වැයවන ජලය සහ පෝෂක කොටස් ගසේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා

යෙදවෙන අතර වර්ෂයක් තුළ අමතර පොල් වල්ලක් නෙලා ගැනීමටද හැකි වී තිබේ. මාසික පොල් කැඩුම් වපසරිය මේ වන විට මුළු පොල් කැඩුම් වපසරියෙන් 90% ක උපරිමයකට ලඟා වී ඇත. 2004 වසර සඳහා මෙම ප්‍රතිශතය 26% ක තරම් පහළ අගයක් ගනු ලැබීය. මාසිකව පොල් කැඩීම කලද වැටුනු පොල් ප්‍රතිශතය 17% - 20% අතර ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට සමාගමට හැකි වී තිබේ. මේ තුලින් මෙම උපාය මාර්ගයේ ඵලදායීතාවය මනාව පැහැදිලි වේ. මෙම ක්‍රම වේදය තුල වැටුනු පොල් ප්‍රමාණය අඩු වීම, යාබද ගම් ප්‍රදේශ වල පිරිස් විසින් එම වැටුනු පොල් සොරකම් කිරීම අවම වීමටද හේතු වී තිබේ.

2015 වර්ෂයේදී රුපියල් මිලියන 262 ක් වූ පොල් නිෂ්පාදන පිරිවැය 2016 වසරේදී රුපියල් මිලියන 255 ක් දක්වා 3% කින් අඩු වී ඇත. නාස්තිය අවම කිරීම, ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම, ශ්‍රම භාවිතය වෙනුවට වෙනත් විකල්ප ක්‍රම භාවිතය වැනි කාරණා නිෂ්පාදන පිරිවැය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට හේතු වී ඇත. පොල් ගෙඩියක නිෂ්පාදන පිරිවැය රුපියල් 18.50 (2015) සිට රුපියල් 15.25 (2016) ක් දක්වා අඩු වී ඇත. එයට බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ නිෂ්පාදනයේ වූ වර්ධනයයි.

රබර් අංශය

සමාගම සතුව හෙක්ටයාර් 178.48 ක මේරූ රබර් වපසරියක් ඇති අතර සමාගමේ දෙවන ප්‍රධානතම වගාව වන්නේ රබර් වගාව වේ. පසුගිය වසරට සාපේක්ෂව මේරූ රබර් වගා වපසරිය හෙක්ටයාර 5.05 කින් අඩු වී ඇත. මෙයද රබර් ආදායම අඩු වීම සඳහා යම් ප්‍රමාණයකට හේතු වී ඇත. ඊට අමතරව ලෝක වෙළෙඳ පොලේ මිළ පහළ යාම හේතු කොටගෙන 2011 වසරේ සිට මේ දක්වා දිගින් දිගටම රබර් ආදායම අඩු වී ඇත. 2016 වසර සඳහා රබර් ආදායම මිලියන 29.9 ක් වූ අතර 2015 වසර සඳහා එම අගය රුපියල් මිලියන 30.6 ක් විය. 2015 වර්ෂයේදී රුපියල් 218 ක් වූ රබර් කිලෝ එකක සාමාන්‍ය විකුණුම් මිළ 2016 වර්ෂයේදී රුපියල් 211 ක් දක්වා 3% කින් පහළ වැටුනි.

වසර 50 කට පසු ජාතික රබර් නිෂ්පාදනයේ අඩුම අගය වාර්තා වූයේද 2016 වසරේදීය. කිරි කැපුම් දින ගණන අඩුවීම හා කිරි කැපුම් වපසරිය අඩුවීම යන කාරණා දෙකම නිෂ්පාදනය අඩු වීමට හේතු විය.

රබර් මිලෙහි සහ නිෂ්පාදනයෙහි වූ වෙනස්වීම, පසුගිය වසරට සාපේක්ෂව සමාගමේ රබර් ආදායම අඩුවීම කෙරෙහි බලපෑ ආකාරය පහත දක්වා ඇත.

	රු. මිලි.
විකුණුම් මිලෙහි අඩුවීම තුල පසුගිය වසරට සාපේක්ෂව රබර් ආදායමේ වූ අඩුවීම	(1.6)
රබර් නිෂ්පාදනයේ වැඩිවීම තුල ආදායමේ වූ සාපේක්ෂ වැඩිවීම	0.9
පසුගිය වසරට සාපේක්ෂව රබර් ආදායමේ වූ සමස්ථ අඩුවීම	(0.7)

2015 වර්ෂයේදී රුපියල් මිලියන 38 ක් වූ රබර් නිෂ්පාදන පිරිවැය 2016 වර්ෂයේදී රුපියල් මිලියන 47 ක් දක්වා රුපියල් මිලියන 9 කින් වැඩි වී ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 24% ක වර්ධනයකි.

රබර් අංශය සඳහා බෙදා වෙන් කළ පොදු වියදම් වල කැපීපෙනෙන වර්ධනයක් දක්නට ලැබෙන අතර රබර් අංශයේ නිෂ්පාදන පිරිවැය වැඩිවීම සඳහා එය ප්‍රධාන ලෙස බලපා ඇත.

රබර් නිෂ්පාදන පිරිවැයෙහි සංයුතිය පහත පරිදි වේ.

	2016 රු. මිලි.	2015 රු. මිලි.
මේරූ වගා නඩත්තු වියදම්	3.2	4.1
රබර් කිරි කැපීම් හා එකතු කිරීමේ වියදම්	15.8	13.6
රබර් ෂීට් නිෂ්පාදනය කිරීමේ වියදම්	2.8	0.6
රබර් අංශය සඳහා බෙදා වෙන් කළ පොදු වියදම්	25.4	19.2
	47.2	**37.5**

රබර් අංශය අලාභ තත්ත්වයක් පෙන්නුම් කලද රබර් අංශය සඳහා බෙදා වෙන් කළ පොදු වියදම් ඉවත් කලහොත් එම අංශය තව දුරටත් ලාභදායී අංශයක් ලෙස පවතී. එමනිසා රබර් අංශය ඉදිරියටත් පවත්වාගෙනයාම යෝග්‍ය වේ.

	2016 රු. මිලි.	2015 රු. මිලි.
ආදායම	29.9	30.6
රබර් අංශය සඳහා බෙදා වෙන් කළ පොදු වියදම් හැර විකුණුම් පිරිවැය	(21.8)	(18.4)
රබර් අංශයේ දායකත්වය	8.1	12.2

වෙනත් බෝග

2005 වසරේ සිට සමාගම පුළුල් ලෙස අතුරු බෝග විවිධාංගීකරණය සඳහා යොමු වූ අතර එය අද වන විට ඉතාම සාර්ථක මට්ටමකට පැමිණ ඇත. 2005 වසරේදී වෙනත් බෝග වගාකර තිබූ වපසරිය හෙක්ටයාර 71.79 ක් වූ අතර එය 2016 වසර අවසානය වන විට හෙක්ටයාර 581.10 ක් දක්වා වැඩි විය. වර්තමානය වන විට සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ගම්මිරිස්, කුරුඳු, රඹුටන්, දූරියන්, ඩ්‍රැගන්ෆෲට්, අඹ, කොකෝවා, කජු වැනි අතුරු බෝග රාශියක් වගා කොට ඇත. කජු, කුරුඳු, ඩ්‍රැගන්ෆෲට්, අඹ සහ පේර කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියලි කාලගුණික කලාපය තුල වගා කර ඇති අතර රඹුටන් සහ දුරියන් ගම්පහ දිස්ත්‍රික්කයේ තෙත් කලාපය තුල සාර්ථකව වගාකර ඇත.

2016 වසරේ අතුරු බෝග වලින් ලද ලාභය රුපියල් මිලියන 11 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 4.5% ක වැඩිවීමකි.

ශේෂපත්‍ර ව්‍යුහය

2016 වසර තුලදී සමාගමේ මුළු වත්කම් රු. මිලියන 110 කින් වර්ධනය වූ අතර එයට ප්‍රධානතම හේතුව වූයේ ධාරක ජෛව වත්කම් සඳහා කරන ලද ආයෝජනයන්ගේ වැඩිවීම (රු. මිලියන 95) සහ කෙටිකාලීන ආයෝජන වල සිදු වූ වර්ධනයයි (රුපියල් මිලියන 35). නව යටිවගා ඇති කිරීම සහ පවතින යටි වගාවන් නඩත්තුව සඳහා වඩා වැඩි පිරිවැයක් දැරීම ධාරක ජෛව වත්කම් වල වර්ධනයට හේතු වී ඇත. 2016 වසර අවසානයට ජංගම වත්කම් වල වටිනාකම රුපියල් මිලියන 651 ක් වූ අතර (2015 රුපියල් මිලියන 585) එය පසුගිය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 66 ක වැඩිවීමකි.

ද්‍රවශීලතා කළමනාකරණය

කෙටිකාලීන ආයෝජන වල සිදුවූ වර්ධනයත් සමඟ සමාගමේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 564 ක් දක්වා වර්ධනය විය. (2015 - රු. මිලියන 504) සමාගමේ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදය තුල 2015 වසර අවසානයේ රු. මිලියන 445 ක් ව පැවති මුදල් හා මුදල් සමාන දෑ 2016 වසර අවසානය වන විට රු. මිලියන 497 ක් දක්වා වර්ධනය විය. 2016 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව ඇති කෙටිකාලීන ආයෝජන වල වටිනාකම රු. මිලියන 450 කි. (2015- රු. මිලියන 415) මෙම ආයෝජන රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පවතී. 2016 වසර අවසානයේ ජංගම වත්කම් අනුපාතය 7.48 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය 7.03 ක් විය. 2015 වර්ෂය සඳහා එම අගයන් පිළිවෙළින් 7.23 හා 6.79 ක් විය.

ස්කන්ධ ප්‍රාග්ධනය

ස්කන්ධ ප්‍රාග්ධනය රු. මිලියන 200 ක කොටස් ප්‍රාග්ධනයකින් සහ රු. මිලියන 1460 ක සංචිත වලින් සමන්විත වේ. වර්ෂය තුල සංචිතවල වැඩිවීම රුපියල් මිලියන 133 කි. සංචිතවල සංයුතිය පහත පරිදි වේ.

	2016 රු. මිලි.	2015 රු. මිලි.
රඳවාගත් ලාභ	1,139	1,064
දැව සංචිත	267	248
වෙනත් සංචිත	54	15
එකතුව	1,460	1,327

ලාභාංශ ගෙවීම

බොහෝ රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාරයට බරක් වී ඇති අවධියක සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ස්වයං මූල්‍යන ආයතනයක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක වීමට අමතරව මහා භාණ්ඩාගාරයට ලාභාංශද ගෙවීම තුලින් තමන්ගේ වගකීම මනා ලෙස ඉටු කොට ඇත. මෙම වර්ෂය තුල ද රාජ්‍ය කළමනාකාරිත්වය යටතේ ස්වයං මූල්‍යන ආයතනයක් ලෙස සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සාර්ථකව කටයුතු කර ඇති බව අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු.

2005 වසරේදි සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමෙන් පසුව සමාගමේ ඉතිහාසයේ පළමුවරට ලාභාංශ ගෙවනු ලැබූයේ 2007 වසරේදීය. 2016 වසර සඳහා රු. මිලියන 30 ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කිරීමට අප බලාපොරොත්තු වේ. මෙම ප්‍රකාශිත රු. මිලියන 30 ක ලාභාංශයද සමඟ මුළු ලාභාංශ ප්‍රමාණය රු. මිලියන 345 ක් වේ.

අනාගත දැක්ම

පවත්නා අයහපත් දේශගුණික වෙනස්වීම් හා ගෝලීය මූල්‍ය අර්බුධයන් දේශීය ආර්ථිකය සහ විශේෂයෙන්ම වැවිලි අංශය සඳහා දැඩි බලපෑමකට ලක් වී ඇති අවධියක දුරදක්නා කළමනාකරණ ව්‍යවහාරයන් තුල පසුගිය වසර ගණනාවක් පුරා කුරුණෑගල වැවිලි සමාගම ස්ථායී සංවර්ධනයක් කරා ගමන් කරමින් සිටී. සමාගමේ අනාගත අභිවෘද්ධිය සහ ජාතික ආර්ථිකයට වූ දායකත්වය වැඩි කිරීමේ අරමුණින්

සමාගම තම මූලික නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩ සටහන තුලින් දේශීය හා විදේශීය සහභාගිත්වයෙන් තිරසාර ආයෝජනයන් සඳහා අවස්ථාව සැලසෙනු ඇත. සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ක්ෂේත්‍ර අතර සංචාරක බණිජ සම්පත්, ජල මූලාශ්‍ර, බල ශක්ති පුනර්ජනය, කෘෂි වැවිලි ව්‍යාපෘති, නිවාස හා වාණිජ දේපල සංවර්ධනය, වැවිලි නිෂ්පාදන සංවර්ධනය ප්‍රධාන තැනක් ගනී. මෙම ක්‍රියාවලිය අතරතුර ලාභදායීත්වය වැඩි කිරීමට හැකි වෙනත් විකල්ප මාර්ග කෙරෙහි සමාගම අවධානය යොමු කර ඇති අතර බාහිර වැවිලිකරුවන්ට කෙටි කාලීන බෝග වගා කිරීම සඳහා පහසුකම් සැපයීමේ පදනම මත ඉඩම් සැපයීම එක් මාර්ගයකි. මෙම වැඩපිළිවෙල ඉදිරි වර්ෂවලදීද ක්‍රියාත්මක කිරීමට සමාගම බලාපොරොත්තු වේ. ස්වාභාවික කළුගල් කැණීම් කටයුතු සඳහා යොදා ගැනීමද තවත් එක් මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත.

ඉදිරි වර්ෂ වලදී යහපත් ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම මේ වන විටත් සකස් කර ඇති අතර අනෙකුත් රාජ්‍ය ආයතන මෙන් නොව රජයේ භාණ්ඩාගාරයට බරක් නොවී පුද්ගලික හා රාජ්‍ය වැවිලි සමාගම් අතර සාර්ථක සමාගමක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ඉදිරියට ක්‍රියාත්මක වේ. තිරසාර කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් නිරන්තරව සමාගමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම සමාගමේ සාර්ථකත්වය සඳහා හේතු වී ඇත.

තිරසාරත්වය පිළිබඳ වාර්තාව

වැවිලි සමාගමක් වශයෙන් අප තිරසාරත්වය ලෙස අර්ථ දක්වන්නේ ආර්ථික, සමාජීය සහ පාරිසරික වශයෙන් එකාබද්ධ වූ ක්‍රියා පිළිවෙලක් මගින් වර්ධනයක් අත්පත්කර ගැනීමයි. ආර්ථික තිරසාරත්වය බවට මූලිකවම පරිවර්තනය වන්නේ සමාගමේ මූල්‍ය තිරසාරත්වයයි. ඒ මගින් ජාතියට රජයට සහ සේවකයන්ට ආර්ථික ප්‍රතිලාභයන් ලැබීම සහතික කරනු ලබයි. කෘෂිකර්මය මත පදනම් වූ ක්‍රියාදාමයක් තුල අපගේ මූල්‍ය තිරසාරත්වය පාරිසරික තිරසාරත්වය සමග බැඳී පවතී. ඒ නිසාවෙන් අපගේ ව්‍යාපාරික ක්‍රියාවන්ට උපකාරීවන ස්වභාවික පරිසරය සහ පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමට අප බැඳී සිටිමු. මෙය අර්ථ දැක්වෙන්නේ තිරසාර භූමි සහ ජල පරිහරණය සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් සිදුකිරීම යනුවෙනි.

මෙයට අමතරව සමාජීය තිරසාරත්වය සහතික කරනුවස් අපගේ වතු ආශ්‍රිතව වෙසෙන ජන කණ්ඩායම් සමග අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම මගින් ඔවුන්ද අපගේ ව්‍යාපාරයන්හි වැදගත් පාර්ශවකරුවන් බවට පත්කරගෙන ඇත්තෙමු. රාජ්‍ය ආයතනයක් ලෙස සමස්ථ පොදු ජනතාවට අපගේ ඇති වගකිවයුතු බව පිළිබඳව අප මනාව දැනුවත්ව සිටිමු. විනිවිද භාවයෙන් යුත් ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම, නිතිපතා අධීක්ෂණය හා ඇගයීම් කිරීම සහ නිසි වාර්තා කිරීමේ පිළිවෙත් මගින් දූෂණ හා වැරදි ක්‍රියාවන් නැති කිරීම මඟින් යහපාලනයක් ඇති කිරීමට අපි කැපවී සිටිමු.

තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්

අපගේ සියළුම වතුයායන් තුල භූමියේ ඵලදායීතාවය වැඩි කිරීම, බෝග විවිධාංගීකරණය සහ යටි වගා ඇති කිරීම තුලින් තිරසාර කෘෂිකාර්මික කළමනාකරණ පිළිවෙතක් ක්‍රියාත්මක කර ඇත. අක්කරයකට වගා කළ හැකි උපරිම පොල් ගස් ප්‍රමාණය ස්ථාපිත කිරීමට අප විසින් අති විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර 2005 වර්ෂයේදී එනම් කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකරණය රජයට පවරාගත් වර්ෂයේදී 50 ක් වූ අක්කරයකට පැවති පොල් ගස් ප්‍රමාණය අද වන විට 58 දක්වා වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. යටිවගා ස්ථාපනයට සුදුසු සියළුම ඉඩම් හඳුනාගෙන ක්‍රමානුකූලව හා සැලසුම් සහගතව යටිවගා ස්ථාපනය කල අතර සමහර වතුයායන් තුල මේ වනවිට යටිවගා ඇති කිරීම සඳහා සුදුසු භූමි ප්‍රමාණයක් ඉතිරි වී නොමැති තරමිය. 2016 වසර අවසානයේ යටිවගා සහිත අක්කර ප්‍රමාණය මුළු පොල් වගා වපසරියෙන් 23% ක් (හෙක්ටයාර 938.55) ලෙස වාර්තා වූ අතර 2016 වසර තුලදී රුපියල් මිලියන 71.7 ක් පොල් යටිවගාවන් සඳහා ආයෝජනය කර ඇත. ඊට අමතරව මේරූ පොල් වගා වපසරිය තුල පැළ සිටුවීමේ ක්‍රමානුකූල මෙන්ම ස්ථාපිත වැඩසටහනක් අප සතුව ඇත. මෙම ක්‍රියාවලිය තුලින් අක්කරයක් තුල ඇති පොල් ගස් සංඛ්‍යාවේ සිදුවන වර්ධනය කුරුණෑගල වැවිලි සමාගමේ අනාගත සමස්ථ පොල් ඵලදාව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීමට හේතුවනු ඇත.

සීසෑම, රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, බෑවුම් සහිත ඉඩම් සඳහා වගා තාක්ෂණය යොදා ගැනීම, ආවරණ බෝග ව්‍යාප්තිය, සමෝච්ඡ කාණු කැපීම වැනි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හරහා අපගේ ඉඩම්වල ඵලදායීතාවයේ තිරසාර වර්ධනය සහතික කර ඇත. කාබනික පොහොර, පසේ සාරවත් බව, තෙතමනය රඳාපවත්වා ගැනීමේ හැකියාව, පාංශුවයනය, පසේ ව්‍යුහය සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම සඳහා හේතු වේ. මෙම කෘෂිකාර්මික ක්‍රමවේදයන් අපගේ ඉඩම් වල තිරසාරත්වය වැඩි කිරීමට හේතු වේ.

වගාවන් සඳහා කෘතීම රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම

පාරිසරික සුරක්ෂිතතාවය පිළිබඳ සැලකිලිමත් වෙමින් කුරුණෑගල වැවිලි සමාගම රසායනික වල් නාශක, කෘමි නාශක, දිලීර නාශක සහ රසායනික පොහොර භාවිතය අවම කර ඇති අතර ඒ සඳහා විකල්ප ලෙස ජෛව විද්‍යාත්මක හා යාන්ත්‍රික පාලන ක්‍රමයන් යොදාගැනීමට සහ කාබනික පොහොර භාවිතය වැඩි කිරීම වැනි ක්‍රමෝපායන් යොදාගැනීමට පියවර ගෙන ඇත.

ජෛව විද්‍යාත්මක පාලනය

පොල් වගාවෙහි මයිටාවන් පාලනය සඳහා විලෝපික මයිටාවන් භාවිතය - විලෝපික මයිටාවන් නිපදවීම සඳහා අප විසින් විද්‍යාගාරයක් ස්ථාපිත කර ඇති අතර එම විලෝපික මයිටා පැකටි මයිටා හානිය

බහුලව දක්නට ලැබෙන අපගේ වතුයායන් තුල බෙදාහරිමින් මයිටා උවදුර ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සඳහා සමාගම කටයුතු කර ඇත.

පලතුරු වගාවට හානිකරන පලතුරු මැස්සන් සහ පොල් වගාවට තර්ජනයක් වී ඇති රතු කුරුමිණියන් පාලනය කිරීම සඳහා පෙරමෝන් උගුල් භාවිතය.

කජු වගාවට හානිකරන හෙලෝපිලිටිස් මදුරුවා පාලනය කිරීම සඳහා දිඹියන් භාවිතය.

යාන්ත්‍රික පාලනය

වර්තමානයේ විවිධ අවස්ථාවලදී වල්නාශකයක් ලෙස ග්ලයිපොසේට් භාවිතා කිරීම පුළුල්ව විවාදයට ලක් වී ඇති අතර රජය ග්ලයිපොසේට් භාවිතය තහනම් කිරීමට තීරණයක් ගෙන ඇත. කුරුණෑගල වැවිලි සමාගම වල්නාශකයක් ලෙස ග්ලයිපොසේට් භාවිතය වෙනුවට සී සෑම, යාන්ත්‍රික වල් නෙලීම, ආවරණ බෝග වගා කිරීම, පොහොර කවයන් ආවරණය වන පරිදි වසුන් යෙදීම වැනි ක්‍රියාමාර්ග තුලින් වල් මර්ධනය සඳහා සාර්ථකව කටයුතු කරනු ලබයි.

කාබනික පොහොර භාවිතය

කුරුණෑගල වැවිලි සමාගම කාබනික පොහොර භාවිතා කිරීම මගින් රසායනික පොහොර භාවිතය අඩු කිරීමට පියවර ගෙන ඇත. අපගේ වගාවන් තුල රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය හා පරිහරණය කිරීම මනාව අධීක්ෂණය කරනු ලබයි. ක්ෂේත්‍ර මට්ටමේ රසායනික ද්‍රව්‍ය ඉසීම සහ භාවිතා කිරීමේ යෙදී සිටින සේවකයින් එහිදී අනුගමනය කළයුතු ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ හොඳින් දැනුවත් කිරීමට හා ඒ සම්බන්ධව පුහුණු කිරීමට සමාගම කටයුතු කරනු ලබයි.

ජෛව විවිධත්වය

සියලු වතුවල ජෛව විවිධත්වය වැඩි කිරීම කෙරෙහි අප සක්‍රීයව කටයුතු කරමු. අතුරු බෝග හෝ දැව හෝ රබර් හෝ වෙනත් බෝගයක් හෝ වගා කළ හැකි භූමි හඳුනා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

කුරුණෑගල වැවිලි සමාගම වටිනාකමින් යුත් දැව ගස් පාරිභෝජ්‍ය ජෛව වත්කමක් ලෙස හඳුනාගෙන ඇත. මේරූ දැව ගස් හෙලීම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාල අමාත්‍යාංශ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන වලින් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව සිදු කරනු ලබයි. තිරසාරත්වය සුරක්ෂිත කරනු වස් හෙලනු ලබන දැව ගස් සඳහා දැව ගස් නැවත් ස්ථාපිත කිරීමට කුරුණෑගල වැවිලි සමාගම කටයුතු කර ඇත.

අපගේ සේවකයන්

සේවක ප්‍රතිලාභ හා ධෛර්යමත් කිරීම්

අපගේ සේවකයන් සඳහා ආරක්ෂිත සිත් ඇදගන්නා සහ ප්‍රතිඵලදායක පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප විසින් මනාව අවබෝධ කරගෙන ඇත. වඩාත් වටිනාම සම්පත සුදුසුකම්, අත්දැකීම් සහ වෘත්තීය නිපුනතාවයන්ගෙන් යුත් අපගේ සේවකයින් බව අප විශ්වාස කරමු. ඉහළ මට්ටමේ වෘත්තිකයන් හා ප්‍රවීනයන් නොමැතිව වැවිලි කර්මාන්තය ලාභදායී අයුරින් මෙහෙයවීම කළ නොහැකි බව පැහැදිලි කරුණකි. ලාභදායීත්වය යන්න යතාර්ථයක් බවට පත්කළ හැකි මානව ප්‍රාග්ධන පදනමක් කුරුණෑගල වැවිලි සමාගම සතුවීම භාග්‍යයකි. කුරුණෑගල වැවිලි සමාගමේ මුළු ශ්‍රම බලකාය 1,235 කි.

කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා ගෙවීම්

2005 වර්ෂයේ සිට ආරම්භ කල කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා ගෙවීම අඛණ්ඩව සිදුකරන අතර මෙම යහපත් ඇගයීම් ක්‍රමය අපගේ සේවකයින් ඵලදායී ලෙස රාජකාරි කිරීම සඳහා පොළඹවා ඇත. රුපියල් මිලියන 18.03 ක මුදලක් 2016 වර්ෂය තුල කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා ගෙවීම සඳහා වෙන් කර ඇත. මෙම ප්‍රමාණය 2015 වසර සඳහා මෙම අගය රුපියල් මිලියන 25.20 ක් විය. මෙම වෙන් කිරීම සිදුකරනු ලැබුවේ මාසික වැටුප් ලබන සේවකයින්ට ඔවුන්ගේ මාසික දළ වැටුප මෙන් 1.09 ක ගුණයක් සහ දෛනික වැටුප් ලබන සේවකයන්ට රුපියල් 15,000 ක දිරි දීමනාවක් ගෙවීම සඳහාය.

සේවකයින්ට අත්වන අනෙකුත් ප්‍රතිලාභ

- අඩු පොළී අනුපාතයක් යටතේ වූ ආපදා ණය.
- පාසල් පොත් හා ඇඳුම් සඳහා පොළී රහිත ණය.
- රුපියලක නාමික වටිනාකමකට පරිභෝජනය සඳහා නියමිත පොල් ප්‍රමාණයක්.
- වැටුණු පොල් ඇහිලීම මත සහ මුරකරුවන්ගේ මාසික පැමිණීම මත දිරිදීමනා.
- විදුලිය නොමැති මුරකරුවන්ට භූමිතෙල් දීමනාව.
- සියළුම සේවකයින් සඳහා සේවක වන්දි වෙනුවෙන් රක්ෂණ ආවරණයක්.

- විධායක නිලධාරීන් සඳහා රුපියල් මිලියන 01 ක පුද්ගල අනතුරු රක්ෂණ ආවරණයක්.
- විධායක නිලධාරීන්ගේ පවුල් ඒකකයකට රුපියල් 400,000 ක සෞඛ්‍ය රක්ෂණ ආවරණයක්.
- කාර්ය මණ්ඩල සේවකයන්ගේ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර.
- සේවකයින්ගේ ළමුන් සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ආධාර.
- ලබා නොගත් අසනීප නිවාඩු සඳහා මසක වැටුපක්.

නිවාස පහසුකම්

පසුගිය වසර කිහිපය පුරා, අපගේ වතුයායන් තුල ඇති නිවාස වල තත්ත්වය වැඩි දියුණු කිරීමට අප ප්‍රබල උත්සාහයක් ගතිමු. මෙම වසර තුලදී ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත මුරකරු නිවාස 15 ක් ඉදිකිරීම ආරම්භකර ඇත. එමෙන්ම, සමාගම නේවාසික සේවකයින් පිලිබඳ මනා සැලකිල්ලකින් යුතුව කටයුතු කරන අතර ඔවුන් සඳහා විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත නිවාස ලබාදීමට කටයුතුකර ඇත.

සේවක පුහුණුව හා සංවර්ධනය

ඵලදායිතාව වැඩිකිරීම තහවුරු කරනු වස් අපගේ සේවකයින්ට අවශ්‍ය නිපුණතාවය, දැනුම සහ ආකල්ප සංවර්ධනය සඳහා සමාගම අඛන්ඩව ආයෝජනය කරනු ලැබේ. අඛණ්ඩ අධ්‍යයනය මෙන්ම පුද්ගල සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විවිධ ගෘහස්ථ සහ බාහිර පුහුණු වැඩසටහන් රාශියක් ලබා දීමට සමාගම කටයුතු කර ඇත. අපගේ සේවකයන්ගේ ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් රාශියකට අනුග්‍රහය ලබා දී ඇත. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා රැකියාව තුලින්ම වූ පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෘත්තීය ප්‍රවීනයන් සමග විශේෂ පුහුණු වැඩ සටහන් කිහිපයක් පසුගිය වසර තුල පවත්වන ලදී.

සේවකයින් සමග දිගු කාලීන සම්බන්ධතා ගොඩනැගීම

සේවකයින් සමග දිගුකාලීන සම්බන්ධතා ගොඩනැගීම සඳහා සමාගම විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කරන ලද අතර ඒවා පහත දැක්වේ.

- වාර්ෂික සර්ව රාත්‍රික පිරිත් දේශනාව සාර්ථකව 8 වන වරටත් පැවැත්වීම.
- වාර්ෂික පොසොන් උත්සවය නිමිති කොට ගෙන 10 වන වරටත් කිරිබත් දන්සැල කුරුණෑගල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්වීම.
- කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා වාර්ෂික සුහද හමුවක් පැවැත්වීම.
- වතු අන්තර් ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීම.
- වාර්ෂික විනෝද චාරිකා සංවිධානය කිරීම.

අපගේ මානව සම්පත් කළමනාකරණ උපායමාර්ග සේවක අභිප්‍රේරණය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර සමාගමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා සමාගම කෙරෙහි ඇති බැඳියාව වර්ධනය වීම කෙරෙහි හේතු වී ඇත.

කුරුණෑගල වැවිලි සමාගම සහ සමාජීය සම්බන්ධතා

පසුගිය වසර කිහිපය පුරා අසල්වැසි ගොවීන්ගේ කිරි ගවයින්ට තණකොළ උලා කෑම සඳහා පහසුකම් සපයන ලද අතර එය කුරුණෑගල වැවිලි සමාගමට කාබනික පොහොර ලබා ගැනීමට මෙන්ම වගා තුල වල් මර්ධනයට යොදා ගෙන ඇත. මෙම වැඩ පිළිවෙල ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හා අවසන් වශයෙන් කිරි ගවයින් ගහනය වැඩිවීම කෙරෙහි දායක වී ඇත. අසල්වැසි ගොවියන්ට ආර්ථික වටිනාකමකින් යුතු වූ අර්ධ වාර්ෂික බෝග වර්ග වගාකිරීම සඳහා අප පහසුකම් ලබාදුනිමු. මේ තුලින් ඔවුන්ගේ පවුල්වල ආදායම වැඩිවී ඇති අතර ජාතික කෘෂි නිෂ්පාදනය වර්ධනය කිරීමටත් වතුයායවල භූමියේ ජෛව හා පාරිසරික සමබරතාවය වඩාත් දියුණු වීම සඳහාත් හේතු වී ඇත. මෙම යාන්ත්‍රනය තුළින් වගා කිරීම සම්බන්ධ සාම්ප්‍රදායික දැනුම සතු දක්ෂ ශ්‍රමිකයන් හඳුනාගෙන ඔවුන් සමාගමේ සේවක මණ්ඩලය තුලට අවශෝෂණය කර ගැනීමේ අවකාශයද උදාවී ඇත.

සමාගම විසින් වාර්ෂිකව මහනුවර ශ්‍රී දළදා පෙරහැර, විවිධ පන්සල් සහ දේවාල පෙරහැර සඳහා කොප්පරා ලබාදේ. ආගමික ස්ථාන සහ පාසල් ඉදිකිරීම්/ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය දැව ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා සමාගම අනුග්‍රාහකත්වය ලබාදීමට කටයුතු කරයි. තිරසාරත්වයේ වටිනාකම් අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය සමග බැඳී පවතී. නිසි කළමනාකාරිත්වයෙන් යුත් ව්‍යාපාරයක් සතුව ආර්ථික, සමාජීය හා පාරිසරික තිරසාරත්වයක් තිබිය යුතුය. කුරුණෑගල වැවිලි සමාගම, වැවිලි සමාගමක් ලෙස ආර්ථික වශයෙන් ලාභදායී කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටිමින් පරිසරය ආරක්ෂා කරමින්, ජෛව විවිධත්වය වර්ධනයට දායක වෙමින් සහ සේවකයින්ගේත් සමස්ථයක් ලෙස ජාතියේත් යහපැවැත්ම සහතික කරමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබේ.

සාමූහික පාලන ප්‍රකාශය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකකම, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා ගිණුම්කරණභාවය යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමඟ මෙන්ම සමාගම ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය සමඟ ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. සමාගමේ කටයුතු ආචාරධර්ම වලට අනුකූලව සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සෑම පාර්ශවයකගේම සුභසිද්ධිය උපරිම වන අයුරින් කරගෙන යනු ලබයි. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම් වර්ධනය වන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

වගකීම

මූල්‍ය ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

සංයුතිය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපතිතුමා ඇතුලත්ව විධායක නොවන අධ්‍යක්ෂ වරුන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අය වැය, සිය කාර්යන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්තන වියදම් සමාලෝචනයට ලක්කිරීම මෙම රැස්වීම් වලදී සිදු කරනු ලබයි. සෑම රැස්වීමක් පවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හට ලබාදීමට කටයුතු කරනු ලැබේ. 2016 වසර තුලදී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

නම	පත්වීම් දිනය	සහභා-ගිත්වය
ඒ.එම්. පියසෝම උපාලි මහතා **සභාපති**	29.01.2015	13/13
එච්.ඒ.පී.ටී. කුමාර ඩයස් මහතා **විධායක අධ්‍යක්ෂ**	07.10.2016	02/13
ඩී.එම්. බණ්ඩාරනායක මහතා **ක්‍රියාකාරී අධ්‍යක්ෂ**	26.03.2015	13/13
එච්.ඒ.එන්. සමන් කුමාර මහතා **අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත**	06.03.2015	11/13
ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා	13.03.2015	13/13
ආර්. සිඩ්නි කුලතිලක මහතා	07.10.2016	02/13
එම්.පී.ඩී. ඉඳුනිල් අමරසිංහ මහතා	07.10.2016	01/13

2016 දෙසැම්බර් 31 වන දින වන විට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් වී ඇති පහත අධ්‍යක්ෂවරුන්ද 2016 වසර තුලදී පහත පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වී ඇත.

Name	Date of Appointment	Date of Resigned	Attendance
සුනිල් එස්. අලස් මහතා	06.03.2015	06.10.2016	11/13
ඩී.පී. විජේසිංහ මහතා **විධායක අධ්‍යක්ෂ**	13.03.2015	06.10.2016	11/13
ඩබ්.ඒ.ඩී.ඩී.එම්. ප්‍රියන්ත මහතා	13.03.2015	06.10.2016	07/13

විගණන කමිටු

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 39 හි ඇති විගණන කමිටු වාර්තාව බලන්න.

නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සියළුම අවස්ථාවන්හිදී සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට උත්සාහ ගනු ලබයි. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි පිළියෙල කර ඇති බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු වේ.

අවදානම් කළමනාකරණය

කුරුණෑගල වැවිලි සමාගම අනෙකුත් ව්‍යාපාර ආයතන මුහුණ දෙන අවදානම් වලට අමතරව වැවිලි ක්ෂේත්‍රය සඳහා විශේෂ වූ අවදානම් රැසකටද නිරාවරණය වේ. මෙම විශේෂ අවදානම් පොල්, රබර් සහ වෙනත් අතුරු බෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම, සැකසීම සහ අලෙවිය හා සම්බන්ධ වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිත්වයද ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අවදානම් කළමනාකරණය සඳහා මූල්‍ය, මෙහෙයුම් සහ වෙනත් පාලනයන් ක්‍රියාකාරීව යොදා ගනු ලබයි.

අභ්‍යන්තර තක්සේරුකරුවන් සහ කළමනාකරණ මඩුල්ල විසින් මෙම අවදානම් පාලන ක්‍රමවල යෝග්‍යතාවය ඇගයීමට ලක් කරනු ලබන අතර පවත්නා අවදානම් ආයතනයට වාසිදායක වන ලෙසට හරවා ගැනීම, අවදානම් තුලින් ඇතිවන බලපෑම මගහැරවීම හෝ අවම කිරීම සඳහාත් අවසාන වශයෙන් සියළුම ප්‍රතිලාභීන්ගේ අරමුණු සහ වත්කම්වල සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා ක්‍රියාකරනු ලබයි.

අවදානමේ ස්වභාවය

අධ්‍යක්ෂ මණ්ඩලය තමාගේ වගකීම මැනවින් හඳුනාගෙන ඉතාමත් යෝග්‍ය අවදානම් කළමනාකරණ රාමුවක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරනු ලබයි. කළමනාකරණයද මේ සම්බන්ධයෙන් ඇති වගකීම මනාව තේරුම් ගෙන ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම සඳහා කටයුතු කරයි. සේවක මණ්ඩලයද අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලබන මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා තම උපරිම දායකත්වය ලබා දේ.

මෙහෙයුම් අවදානම

අපගේ ප්‍රධාන බෝගය වන පොල් සමාගමෙහි ප්‍රමුඛ ආදායම් මාර්ගය වේ. ජාතික නිෂ්පාදනයෙන් 70%කට අධික ප්‍රමාණයක් දේශීය වශයෙන් පරිභෝජනය කෙරෙන අතර කර්මාන්ත අංශය සඳහා ඉතිරි වනුයේ 30%ක පමණ වූ ප්‍රමාණයකි. මෙම තත්ත්වය මගින් වෙළෙඳ පොළ උච්චාවචනයන් නිර්මාණය කෙරෙන අතර ඉහළ එලදා තත්ත්වයන් හැමවිටම පහළ වාර්ෂික පිරිවැටුමක් සඳහා හේතු වේ. උසස් තත්ත්වයේ පොල් නිෂ්පාදනය සහ ප්‍රතික්ෂේප වීම් අවම කිරීම මගින් කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී ගැනුම්කරුවන්ගේ ගෞරවයට පාත්‍ර වේ. වෙළෙඳ පොළ තුළ ඉහළ තරඟකාරිත්වයක් ඇති කිරීම උදෙසා සමාගම මගින් දේශීය ගැණුම්කාර පදනමක් ගොඩනගා ඇති අතර එමගින් අස්වැන්න අධික සමයන්හිදී අදාළ පොල් තොග අලෙවිය පහසු වී ඇත. පොල් ගබඩා කරන ස්ථාන වෙත පහසු පිවිසුමක් ලබාදීම, පොල් ලෙලි ගසන්නන් හට නේවාසික පහසුකම් ලබාදීම සහ වතු තුල අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම මඟින් සමාගම එහි ගැණුම්කරුවන්ට හිතකාමී පරිසරයක් ඇති කිරීමට කටයුතු කර ඇත. මේ වන විට නිරන්තරයෙන් උද්ගත වන තත්ත්වයක් බවට පත්ව ඇති අහිතකර කාලගුණ තත්ත්වයන් පොල්ද ඇතුළුව සියළු බෝග කෙරෙහි අයහපත් අයුරින් බලපා ඇත. දිගු නියඟයන් සහ අධික වර්ෂාපතනයන්ද නියමාකාරයෙන් අස්වැන්න නෙළාගැනීමේ ක්‍රියාවලීන් කෙරෙහි බලපා ඇත. පසෙහි තෙතමනය පවත්වා ගනිමින් පස සංරක්ෂණය සඳහා අප විසින් පොල් ලෙලි වැලලීම, අගල් කැපීම හා කාබනික පොහොර භාවිතය වැනි කටයුතු ක්‍රියාත්මක කර ඇත. සියළු මේරූ රබර් වගාවන්ට වැසි ආවරණ යෙදීමටද කටයුතු කර ඇත. පලිබෝධ සහ රෝග පොල් මයිටාවන් (Aceria guerreronis), පත්‍ර වලට හානි කරන කෘමීන් (Plessispa) සහ වැලිගම කොළ මැලවීමේ රෝගය (Weligama Wilt) යනාදී මෑත කාලයේදී වර්ධනය වූ රෝග සහ පලිබෝධ පැවති කෘමි, පලිබෝධ සහ රෝග කාණ්ඩ සමග එක්ව මනා පොල් වගාවන් ඇති කිරීම කෙරෙහි බලවත් තර්ජනයක් එල්ල කර ඇත. වැලිගම කොළ මැලවීමේ රෝගය පොල් වගාවට බරපතල ලෙස හානි පමුණුවන රෝගයක් බවට පත්ව ඇති අතර එහිදී අදාල වගාවන් ගලවා ඉවත් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති වී ඇත. කෙසේවුවද පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මෙම රෝගය පැතිරීම අවම කිරීමෙහිලා ප්‍රසංශනීය කාර්යභාරයක් ඉටු කර ඇත. අප සමාගම අවම අවදානම් තත්ත්වයකට මුහුණපෑවද අප විසින් මෙම රෝගය හඳුනාගැනීම සඳහා අප සේවකයින් සතු දැනුම වර්ධනය සඳහා කටයුතු කර ඇත. විලෝපික මයිටාවකු යොදාගනිමින් මයිටා උවදුර සාර්ථකව පාලනය කරනු ලැබ ඇත. අපගේ විද්‍යාගාරයේදී පොල් පර්යේෂණ ආයතනයෙහි මගපෙන්වීම යටතේ

මෙම විලෝපික මයිටාවන් නිෂ්පාදනය කෙරේ. එම විලෝපික මයිටාවන් වෙනත් පොල් වගාකරුවන් වෙතද සාධාරණ මිලකට ලබාදීමට කටයුතු කර ඇත. පළපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ නිරන්තර අධීක්ෂණය තුල අපගේ වගාවන් රෝග හා පලිබෝධ වලින් ආරක්ෂා කරගැනීමට හැකි වී ඇත. බෝග ආරක්ෂාව ගිනි ගැනීම් සහ ජල ගැලීම් වැනි ස්වාභාවික ආපදාවන් ගේ අවදානමට අමතරව පොල් බහුල වශයෙන් පරිභෝජනයට ගැනෙන බෝගයක් වශයෙන් නිරන්තරයෙන් සොරකම් කිරීමේ අවදානමට ලක් වේ. පලාත් වතුයායන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් පුරා පැතිරුන කුඩා වතු කොටස් සමූහයකින් සමන්විත වීම නිසා මෙම අවදානම් තත්ත්වය තවත් ඉහළ ගොස් ඇත. මාසිකව පොල් නෙලන වපසරිය උපරිම කිරීමට මේවන විට කටයුතු කර ඇති අතර එය සමස්ථ පොල් නෙලන වපසරියෙන් 90% ක් පමණ වේ. ද්වී මාසිකව අස්වැන්න නෙලීමට සාපේක්ෂව පොල් වැටීමේ ප්‍රතිශතය මෙම ක්‍රමය තුල අඩුවීම හේතුවෙන් සොරකම් කිරීමේ අවදානම අඩුවී ඇත. තවද වැටවල් ශක්තිමත් කිරීම, වතු අධිකාරීවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ අභ්‍යන්තර විගණන අංශය විසින් කරනු ලබන නිරන්තර අධීක්ෂණය තුල මෙම තත්ත්වය අවම කිරීම සඳහා කටයුතු කර ඇත. වැටුණු පොල් ඇහිලීම වෙනුවෙන් මුරකරුවන් වෙත දිරිදීමනා ලබාදීමද තවත් එක් උපායමාර්ගයකි. ශ්‍රම හිඟය පොල් වගාකරුවන් පුහුණු ශ්‍රමය සොයා ගැනීම සම්බන්ධ බරපතල අර්බුදයකට මුහුණ පා ඇත. ශ්‍රමිකයින්ගේ හිඟය හේතුවෙන් එදිනෙදා කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම ද අසීරු තත්ත්වයකට පත්ව ඇත. තේ සහ රබර් මෙන් නොව පොල් වතුයායන් තුල නේවාසික ශ්‍රමික පිරිසක් නොමැති බැවින් අසල ගම්වල ශ්‍රමය මත රඳා පැවතීමට සිදුවේ. අප විසින් නිසි පරිදි අපගේ ශ්‍රම බලකාය තුලින් උපරිම දායකත්වයක් ලබාගැනිම සහ යාන්ත්‍රීකරණය තුල ප්‍රශස්ථ ප්‍රතිඵල නෙලා ගැනීමට කටයුතු යොදා ඇත. විදුලිය, ජලය සහ නේවාසික පහසුකම් නොමිලේ ලබා දෙමින් ද ගෙවීම් සහ දිරිදීමනා ඉහළ නැංවීමෙන් ද සහන පොලී යටතේ ණය ලබා දෙමින් ද සේවකයින්ගේ අවශ්‍යතා ඉටු කර දීමෙන් ද මිත්‍රශීලී සහ විනය ගරුක සේවක පිරිසක් බිහි කර ගැනීමට සමාගම කටයුතු කරනු ලැබේ. ඉඩම් අත්පත් කර ගැනීමේ අවදානම ජාතික අවශ්‍යතාවයන් සහ ව්‍යාස්ථාපිත නිශ්චයන් මත සමාගම සතු එලදායී ඉඩම් අත්පත් කර ගැනීමේ අවදානමට නිරාවරණය වී ඇත. මේ වනවිට, 1992 වර්ෂයේ සමාගම පිහිටුවීමේදී සමාගමට බාර දුන් ඉඩම් වලින් 20% කට වැඩි ප්‍රමාණයක් අහිමි වී ඇත.

වෘත්තීය සමිති, සමාජ සහ පරිසර වෙනස්වීම්

කුරුණෑගල වැවිලි සමාගම කාර්මික සංහිඳියාවෙහි වැදගත්කම අවබෝධ කරගනිමින් ලංකා සේවක සංගමය සමඟ සාමූහික ගිවිසුමකට එළඹුනි. වැටුප්, ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක වන්දි නිසි කලට ගෙවීම සහ සේවක ගැටළු වලට ප්‍රමුඛතාවය ලබාදීම වැනි කරුණු කෙරෙහි සමාගමේ නිරන්තර අවධානය යොමු කිරීම තුලින් කාර්මික සංහිඳියාව ශක්තිමත් කිරීමට සමාගම කටයුතු කර ඇත.

අවදානම් අධීක්ෂණය හා සමාලෝචනය

අභ්‍යන්තර සහ බාහිර වෙනස්වීම් වලට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින දුර්වලතා හඳුනා ගැනීමේ අරමුණින් අවදානම් කළමනාකරණ ක්‍රම වල පැවැත්ම හා ක්‍රියාකාරිත්වය කාලානුරූපීව ඇගයීමට ලක් කරනු ලබයි. අධීක්ෂණ කටයුතු පවත්වා ගෙනයාම හෝ වෙනමම ඇගයීමකට ලක් කිරීම හෝ ඉහල කළමනාකරණයේ සහ විගණන කමිටුවේ වගකීමකි. අපගේ අභ්‍යන්තර විගණන කණ්ඩායම නිරන්තරව වතුයායන් වල ක්‍රියාකාරිත්වය විමර්ශනය කරමින් විගණනයේ යෙදෙන අතර එහිදී සොයා ගනු ලබන විශේෂ අවධානයක් යොමු කළ යුතු කරුණු විගණන කමිටුවේ සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කමිටුවේ අවධානය සඳහා යොමු කරනු ලබයි. එසේම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. එහිදී හඳුනාගනු ලබන තොරතුරු සහ ගතයුතු ක්‍රියා මාර්ග අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු සමාගමේ විවිධ පාර්ශවයන් වෙත සන්නිවේදනය කරනු ලබයි.

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

පොදු හැඳින්වීම

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාග මක් ලෙස පිහිටුවා ඇත. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අතර නව ලියාපදිංචි අංකය PB 1319 වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල, දඹුල්ල පාරේ, අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තනි කොටස්කරුවකුගෙන් යුත් සමාගමක් වන අතර ශ්‍රී ලංකා ජනරජයේ භාණ්ඩාගාර ලේකම් එකම කොටස්කරු වේ.

සමාගමේ ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාරයේ ස්වභාවය

අදාල වර්ෂයේදී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදු කරණ ලදී.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වතුයාය 08 කින් සමන්විත වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතියි. එම වතුයායන් 08 නම් අත්තනගල්ල, දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පොල, කුරුණෑගල, මහායාය, නාරම්මල වේ.

අඛණ්ඩ පැවැත්ම

දුර දක්නා අනාගත කාලයක් සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. ඒ අනුව ගිණුම් වාර්තා අඛණ්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

මෙහි පිටු අංක 46 සිට 86 දක්වා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් සහ විගණන වාර්තාව ඇතුළත් කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 51 සිට 64 දක්වා පිටුවල දැක්වේ. සමාගම විසින් පසුගිය වසරේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව එලෙසම මෙම වර්ෂයේදීද යොදාගෙන ඇත.

ආදායම

2016 වසරේ සමාගමේ මුළු ආදායම රුපියල් මිලියන 472 ක් විය (2015 දී රුපියල් මිලියන 492 කි). වසරේ වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 97 කි (2015 දී රුපියල් මිලියන 122 කි). 2016 වර්ෂයේ බදු පසු ලාභය මිලියන 126 කි. (2015 දී රුපියල් මිලියන 155 කි). සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල පෙන්නුම් කර ඇත.

	2016 රු. මිලි.	2015 රු. මිලි.
පොල්වලින් ලද ලාභය	159	180
රබර්වලින් ලද අලාභය	(17)	(7)
වෙනත් බෝගවලින් ලද ලාභය	10	2
දළ ලාභය	152	175
වෙනත් මෙහෙයුම් ආදායම්	97	122
පරිපාලන වියදම්	(120)	(133)
මෙහෙයුම් ලාභය	129	164
ශුද්ධ මූල්‍ය ආදායම		
මූල්‍ය ආදායම	40	28
මූල්‍ය වියදම	(25)	(26)
	15	2
බදු පෙර ලාභය	144	166
ආදායම් බදු වියදම	(18)	(11)
වසරේ ලාභය	126	155

ප්‍රාග්ධන වියදම් හා ආයෝජන

2016 වසර තුළදී රුපියල් මිලියන 129.32 ක් (2015 දී රුපියල් මිලියන 135.17) ස්ථාවර වත්කම්වල ආයෝජනය කර ඇත. ඉන් රුපියල් මිලියන 87.86 (2015 දී රුපියල් මිලියන 98.08) නොමේරූ වගාවන් සඳහා දරා ඇත.

කෙටිකාලීන ආයෝජන

2016 දෙසැම්බර් 31 දිනට කෙටිකාලීන ආයෝජන වල වටිනාකම රුපියල් මිලියන 450 ක් විය. (2015 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 415) මෙම ආයෝජන රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පැවතිනි. (ලංකා බැංකුව රුපියල් මිලියන 76, මහජන බැංකුව රුපියල් මිලියන 234 සහ ඉතිරි කිරීමේ බැංකුව රුපියල් මිලියන 140)

ස්කන්ධ ප්‍රාග්ධනය

කොටස් විකිණීමෙන් ලැබුණු සම්පූර්ණ මුදල් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇත. 2016 දෙසැම්බර් 31 දිනට මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රුපියල් 200,000,010 කි. මෙය සාමාන්‍ය කොටස් 20,000,000 ක් සහ භාණ්ඩාගාර ලේකම් විසින් දරණ ස්වර්ණමය කොටස් 01 කින් සමන්විත වෙයි. අදාළ වර්ෂය තුළදී කිසිදු කොටස් නිකුත් කිරීමක් සිදු කර නැත.

සංචිත

2016 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ලාභය රුපියල් මිලියන 1139 කි. මීට අමතරව දැව සංචිත වශයෙන් රුපියල් මිලියන 267 ක්ද වෙනත් සංචිත ලෙස රුපියල් මිලියන 54 ක් ද පැවතිණි මුළු සංචිත වල වටිනාකම රුපියල් මිලියන 1460 කි.

අධ්‍යක්ෂ මණ්ඩලය

වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය වෙනස් වී ඇත. වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළ සාමාජිකයින් පහත පරිදි වේ.

නම	පත්වීම් දිනය
ඒ.එම්. පියසෝම උපාලි මහතා **සභාපති**	29.01.2015
එච්.ඒ.පී.ටී. කුමාර ඩයස් මහතා **විධායක අධ්‍යක්ෂ**	07.10.2016
ඩී.එම්. බණ්ඩාරනායක මහතා **ක්‍රියාකාරී අධ්‍යක්ෂ**	26.03.2015
එච්.ඒ.එන්. සමන් කුමාර මහතා **අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත**	06.03.2015
ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා	13.03.2015
ආර්. සිඩ්නි කුලතිලක මහතා	07.10.2016
එම්.පී.ඩී. ඉඳුනිල් අමරසිංහ මහතා	07.10.2016

වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් වූ අධ්‍යක්ෂවරුන්

නම	පත්වීම් දිනය	ඉවත් වූ දිනය
සුනිල් එස්. අලස් මහතා	06.03.2015	06.10.2016
ඩී.පී. විජේසිංහ මහතා **විධායක අධ්‍යක්ෂ**	13.03.2015	06.10.2016
ඩබ්.ඒ.ඩී.ඩී.එම්. ප්‍රියන්ත මහතා	13.03.2015	06.10.2016

අධ්‍යක්ෂවරුන් සමාගමේ ගනුදෙනු කෙරෙහි ඇති සම්බන්ධතාවය

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සෘජුව හෝ වක්‍රව හෝ සමාගමේ ගනුදෙනු කෙරෙහි කිසිඳු ආකාරයකින් බලපෑමක් කර නොමැත.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිඳු අධ්‍යක්ෂවරයෙකු හෝ ඔවුන්ගේ කලත්‍රයකු සමාගමේ කොටස් සඳහා හිමිකම් නොකියයි.

විගණන කමිටුව

පහත අධ්‍යක්ෂවරුන් 2016 වසර තුළදී විගණන කමිටු සාමාජිකත්වය දරා ඇත.

නම
එච්.ඒ.එන්. සමන් කුමාර මහතා **අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත**
ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා
ආර්. සිඩ්නි කුලතිලක මහතා
සුනිල් එස්. අලස් මහතා (2016.10.06 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් වී ඇත.)

සේවා නියුක්තිය

සේවකයන් තෝරා ගැනීමේදී සමාගම සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සෑමවිටම කටයුතු කරයි. පුහුණුව, සංවර්ධනය සහ උසස්වීම් ලබාදීම ආදියේදී සෑමවිටම පදනම් වන්නේ කුසලතාවයයි. එමෙන්ම ජාතිය, ආගම, දේශපාලනික මතවාද, ස්ත්‍රී පුරුෂභාවය, විවාහක අවිවාහක බව හෝ ශාරීරික දුබලතා පිළිබඳව වෙනස්කම් නොදක්වා සැමටම සමාන අවස්ථාවන් ලබාදීමට කටයුතු කරයි.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත සියළු බදු සහ සමාගමේ සේවකයන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන කර ඇති බවට හෝ අධ්‍යක්ෂකවරුන් සහතික වේ.

මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනට පසු සිදුවීම්

ගිණුම් සටහන්හි අනාවරණය කර ඇති සිදුවීම් හැර මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන දිනය දක්වා, ගිණුම් ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇතිකරන වෙනත් කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

විගණකවරු

2016 වසරේ ගිණුම් විගණනය විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

වාර්ෂික වාර්තාව

මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 පෙබරවාරි මස 28 වන දින අනුමත කර ඇත.

වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2018 අගෝස්තු 23 වන දින නො. 712/3, බේස්ලයින් පාර, දෙමටගොඩ, කොළඹ - 09 දරණ ස්ථානයේ පිහිටි කුරුණෑගල වැවිලි සමාගමේ කොළඹ කාර්යාලයේදී පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මෙයට අමුණා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ

ඒ. එම්. පියසෝම උපාලි
සභාපති

එච්. ඒ. එන්. සමන් කුමාර
අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම

2018 අගෝස්තු 01 වන දින කුරුණෑගල දී .

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත දැක්වෙන ප්‍රකාශනයෙහි දක්වා ඇත. 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතා අනුව පිළියෙල කල මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ විගණකවරුන්ගේ වගකීම විගණකවරුන්ගේ වාර්තාවෙහි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශයන් පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ.

- මූල්‍ය වර්ෂය සඳහා සමාගමෙහි ලාභ/ අලාභ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිඹිබු වන අයුරින් සකස්කල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය. සහ
- සමාගම් පනතෙහි අවශ්‍යතා වලට අනුකූලව මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමෙහි මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් සකස් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.
- අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී පහත දැක්වෙන කරුණු තහවුරු කල යුතු වේ.
- සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඒවා අඛණ්ඩව හා සංගතභාවයෙන් යුතුව යොදාග ැනීමටත් යම් ප්‍රමාණාත්මක බැහැරවීමක් සිදුවී ඇත්නම් ඒවා සවිස්තරාත්මක ලෙස අනාවරණය කිරීමට කටයුතු කර ඇති බව.
- අදාළ සියළු ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති බව.
- නිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ සහ විචක්ෂණශීලී ඒවා බව.
- සමාගමට සිය මෙහෙයුම් කටයුතු දුර දක්නා අනාගත කාල පරිච්ඡේදයක් තුල පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් පවතින බවට අධ්‍යක්ෂක මණ්ඩල තහවුරු කරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය යොදාගැනීම සාධාරණ බව.

සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රමාණවත් තරම් ගිණුම් වාර්තා පවත්වා ගෙන යාමටත්, සමාගමේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමක පවත්වාගෙන යාමටත්, මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය බැඳී සිටී.

සමාගම සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා හඳුනාගෙන ඒවා වැලැක්වීම පිණිස සුදුසු අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම අධ්‍යක්ෂක වරුන්ගේ වගකීමකි.

සිය විගණන මතය ලබාදීම සඳහා අවශ්‍ය පරීක්ෂාවන් සිදු කිරීම සඳහා විගණකවරුන් වෙත අවසර ලබාදීමද අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි.

සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව අදාළ රැස්වීම පැවැත්වෙන දිනට අවම වශයෙන් වැඩ කරන දින 15 කට පෙරාතුව සියළු කොටස් හිමිකරුවන් වෙත යැවිය යුතු වේ.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති සියළු වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි මතය වේ.

අනුකූලතා ප්‍රකාශය

අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය උපරිම දැනුම අනුව සමාගම විසින් ගෙවිය යුතු සියළු බදු, තීරු බදු සහ එහි සේවකයන් වෙත ගෙවිය යුතු සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දින වන විට ගෙවනු ලැබ ඇති බව හෝ ගෙවීම සඳහා ගිණුම් තුල අවශ්‍ය වෙන්කිරීම් කර ඇති බව හෝ තහවුරු කෙරේ.

අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි

කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම

2018 අගෝස්තු 01 වන දින කුරුණෑගල

විගණන කමිටු වාර්තාව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබයි. භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා එම විගණන කමිටුවේ සභාපතිත්වය දරයි. අවශ්‍යතාවය පරිදි මෙම විගණන කමිටු රැස්වීම් පැවැත්වෙන අතර ගරු සභාපති, විධායක අධ්‍යක්ෂ, ක්‍රියාකාරි අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ පලාත් වතු අධිකාරිවරුන් මෙම රැස්වීම්වලට ආරාධිතව සහභාගි වේ. මෙම රැස්වීම් සම්බන්ධීකරණය විගණන කළමනාකරු විසින් සිදු කරයි.

පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2016 අප්‍රේල් 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුව සඳහා පත් කර ඇත. 2016 වසර තුලදී විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර එම රැස්වීම සඳහා විගණන කමිටු සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

නම	25.02.2016	05.05.2016	13.05.2016	05.07.2016	13.09.2016	24.11.2016
එච්.ඒ.එන්. සමන් කුමාර මහතා අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත	√	√	√	√	√	√
සුනිල් එස්. අලස් මහතා (2016.10.06 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් වී ඇත.)	√	√	√	√	√	--
ඩබ්.එම්.ඩී.බී. අබේරත්න මහතා	√	√	√	√	√	√
ආර්. සිඩ්නි කුලතිලක මහතා (2016.07.10 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයට පත් වී ඇත.)	--	--	--	--	--	√

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම මූල්‍ය ප්‍රකාශන වල ගුණාත්මකභාවය, සම්පූර්ණත්වය සහ එම ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම, ප්‍රමාණාත්මක ලෙස හෙලිදරවු කිරීම, සම්බන්ධ අධීක්ෂණ වගකීමට විගණන කමිටුව යටත් වේ. අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන්ගේ ප්‍රමාණාත්මකභාවය, නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට හා වරින් වර ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයන්ට අනුකූල වීම තහවුරු කිරීමද විගණන කමිටුවේ වගකීමකි. මූල්‍ය වර්ෂය තුල කමිටුවේ ප්‍රගතිය සෑම විගණන කමිටු වාර්තාවක්ම අනුමැතිය හා ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. විගණන කමිටුව විසින් විගණන විෂය පථය, අරමුණු සහ ඵලදායීතාවය අධීක්ෂණය හා සමාලෝචනය කරනු ලබයි. අනාගත අරමුණු වලට එරෙහිව සමාගමේ මෙහෙයුම් කටයුතු සමාලෝචනය කරනු ලබයි. හඳුනාගත් ගැටළු සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ග පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවල සඵලතාවය ඒ ඒ ව්‍යාපාර ඒකකයන්ගේ ප්‍රධානීන්/ වතු අධිකාරීන් සමඟ සාකච්ඡා කරනු ලබන අතර අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශයන් විගණන කමිටුව විසින් ලබා දෙනු ලබයි.

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සහ ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ලබාදුන් පිළිතුරු සාකච්ඡාවට භාජනය කළ අතර හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනා ගනු ලැබූ අභ්‍යන්තර පාලන දුර්වලතා සහ අඩුපාඩු ප්‍රධාන විධායක නිලධාරි සහ වතු අධිකාරීන් සමඟ සාකච්ඡා කරනු ලබන අතර වැදගත් ක්ෂේත්‍ර කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කිරීම සඳහා කටයුතු කරනු ලබයි. අභ්‍යන්තර විගණන අංශය විසින් කරගෙන යනු ලබන වැඩ කටයුතු හා ඔවුන්ගේ ව්‍යායාමයන් අගය කරනු ලබයි. කමිටු සාමාජිකයන්ගේ ක්‍රියාකාරී දායකත්වය විශේෂයෙන්ම අගය කරනු ලබන අතර ඔවුන් සතු අත්දැකීම් සම්භාරය මෙන්ම මූල්‍ය කරුණු සම්බන්ධයෙන් ඔවුන් සතු නිපුනතාවය සමාගමේ අභිවෘද්ධිය සඳහා හේතු වන බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

එච්.ඒ.එන්. සමන් කුමාර
සභාපති - විගණන කමිටුව
අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඒ/ඒ/කේපීඑල්/01/16/01	ඔබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 24 දින

සභාපති,

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ; ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla. Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.30,239,420 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

සමාගම විසින් අනාගත පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම් මත ඇති වන අවදානම අවම කර ගැනීම සඳහා සැලසුම්ගත වත්කම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාගම විසින් නිදහස් කල හෙක්ටයාර 1750.88 ට අදාල කල්බදු ගෙවීම නතර කිරීමට ගනු ලැබූ තීරණය හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.138,979,605 ක මුදලක් කුරුණෑගල සමාගමෙන් අයවිය යුතු බව වැවිලි කර්මාන්ත අමාත්‍යංශය විසින් දැනුම් දී තිබුණද, කුරුණෑගල වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත රු. 19,051,007 ක ඉදිරියට කල කල්බදු පොළී ගෙවීමක් පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කල් බදු ආදායම රු. 5,234,575 ක් ලෙස ගිණුම් වල දැක්වුවද, වර්ෂයට අදාල ආදායම රු. 4,924,526 ක් විය. ඒ අනුව රු. 310,049 ක් වූ පෙර වර්ෂයට අදාල කල්බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් තබා තිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

	විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.	
(i)	නිදහස්කල හෙක්ටයාර් 550.88 ක ඉඩම්	16,214,000	ඉඩම් නිදහස්කිරීමේ ලේඛන
(ii)	කල්බදු පදනම මත ලද ඉඩම් හෙක්ටයාර් 6722	189,137,238	ඉඩම්වලට අදාල පිඹුරුපත් හා තහවුරු ලේඛන

තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) ඉහත මතය සඳහා පදනම, විෂය පථය සහ සීමාවන්

(ආ) මා දරන්නා වූ මතය

* තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර මා විසින් සිදුකරන ලද පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

* සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	සටහන	2016 රු.	2015 රු.
ආදායම	4	471,974,070	492,140,403
විකුණුම් පිරිවැය	5	(319,957,299)	(316,643,654)
දළ ලාභය		152,016,770	175,496,749
අනෙකුත් මෙහෙයුම් ආදයම්	6	96,683,454	121,733,181
පරිපාලන සහ පොදු වියදම්	7	(119,655,132)	(132,937,239)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ලාභය		129,045,092	164,292,691
ශුද්ධ මූල්‍ය ආදායම් / (වියදම්)	8	15,045,573	1,630,256
බදු පෙර ලාභය		144,090,665	165,922,947
ආදායම් බදු වියදම	9	(17,513,372)	(10,807,068)
වර්ෂයේ ලාභය		126,577,293	155,115,879
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් ආයුගණක ලෙස ගණනය කිරීමෙන් ලැබූ වාසිය / (අවාසිය)		38,527,114	8,098,729
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම		165,104,407	163,214,608
කොටසක ඉපැයුම	10	6.33	7.76

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

	සටහන	2016 රු.	2015 ප්‍රතිශ්ඨාපිත රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම්	11	74,452,624	93,387,704
නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර)	12	32,021,352	40,727,824
ජෛව වත්කම්	13A	851,917,867	785,952,344
පාරිභෝජ්‍ය ජෛව වත්කම්	13B	143,159,531	140,140,673
දේපල, පිරියත හා උපකරණ	14	266,164,493	264,684,411
අනෙකුත් මූල්‍ය වත්කම්	15	6,593,493	5,706,257
මුළු ජංගම නොවන වත්කම්		**1,374,309,360**	**1,330,599,213**
ජංගම වත්කම්			
තොග	16	39,198,884	35,007,421
තැන්පතු	17	2,134,540	2,218,840
ඉදිරියට ගෙවීම්	18	21,920,175	20,893,636
කෙටිකාලීන ව්‍යාපෘති මත කරන ලද ඉදිරියට ගෙවීම්	19	8,220,767	11,187,730
ආපසු ගෙවන ආදායම් බදු		8,646,415	9,116,377
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	20	67,808,240	56,359,580
අනෙකුත් මූල්‍ය වත්කම්	15	6,035,878	5,528,514
කෙටිකාලීන ආයෝජන	21	450,000,000	415,000,000
මුදල් හා බැංකු ශේෂ	22	47,454,497	30,142,753
මුළු ජංගම වත්කම්		**651,419,398**	**585,454,851**
මුළු වත්කම්		**2,025,728,758**	**1,916,054,064**
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ස්කන්ධ ප්‍රාග්ධනය	23	200,000,010	200,000,010
රඳවා ගත් ලාභ		1,139,457,881	1,064,381,104
දැව සංචිතය		266,883,194	247,398,848
අනෙකුත් සංචිත		53,566,512	15,039,398
මුළු හිමිකම		**1,659,907,597**	**1,526,819,360**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් - පාරිතෝෂික	24	79,733,753	117,628,140
ශුද්ධ කල්බදු වගකීම	25	97,911,250	101,511,205
විලම්භිත බදු වගකීම	26	101,115,045	89,347,366
මුළු ජංගම නොවන වගකීම්		**278,760,048**	**308,486,711**
ජංගම වගකීම්			
ශුද්ධ කල්බදු වගකීම	25	3,565,204	3,565,204
ලද අත්තිකාරම්	27	2,351,952	1,745,841
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	28	81,143,957	75,436,948
මුළු ජංගම වගකීම්		**87,061,113**	**80,747,993**
මුළු හිමිකම් සහ වගකීම්		**2,025,728,758**	**1,916,054,064**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

පී. එම්. ඩී. ජී. ප්‍රේමතිලක
මූල්‍ය කළමනාකරු

මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීමක් වේ.
සී/ස කුරුණෑගල වැවිලි සමාගම සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කලේ

ඒ. එම්. පියසෝම උපාලි
සභාපති
කුරුණෑගල

එච්. ඒ. එන්. සමන් කුමාර
අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	කොටස් ප්‍රාග්ධනය රු.	දැව සංචිතය රු.	වෙනත් සංචිත රු.	රඳවාගත් ඉපැයුම රු.	එකතුව රු.
2015.01.01 දිනට ශේෂය	200,000,010	203,478,239	6,940,669	1,036,042,220	1,446,461,139
බැහැර කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම (සටහන අ)				(37,297,388)	(37,297,388)
ගැලපීම - මූල්‍ය වියදම් (සටහන ආ)				17,660,208	17,660,208
ගැලපීම - විලම්බිත බදු (සටහන ඇ)				(13,219,206)	(13,219,206)
2015.01.01 දිනට ශේෂය - ප්‍රතිෂ්ඨාපනය කරන ලද	200,000,010	203,478,239	6,940,669	1,003,185,834	155,115,879
2016 වර්ෂයේ ලාභය - ප්‍රතිෂ්ඨාපනය කරන ලද				155,115,879	155,115,879
වෙනත් විස්තීර්ණ ආදායම්			8,098,729		8,098,729
දැව සංචිතයට මාරු කිරීම		43,920,609		(43,920,609)	-
ගෙවූ ලාභාංශ - 2014				(50,000,000)	(50,000,000)
2015.12.31 දිනට ශේෂය	200,000,010	247,398,848	15,039,398	1,064,381,104	1,526,819,361
බැහැර කරන ලද වත්කම්වල ශුද්ධ වටිනාකම (සටහන අ)				(29,715,923)	(29,715,923)
ගැලපීම - 1992.06.18 - 2015.12.31 දක්වා ඉවත් කරන ලද පොල් හා රබර් ගස්වල ශුද්ධ වටිනාකම (සටහන ඈ)				(2,300,248)	(2,300,248)
2016 වර්ෂයේ ශුද්ධ ලාභය				126,577,293	126,577,293
අනෙකුත් විස්තීර්ණ ආදායම්			38,527,114		38,527,114
දැව සංචිතයට මාරු කිරීම		19,484,346		(19,484,346)	-
ගෙවූ ලාභාංශ - 2015				-	-
2016.12.31 දිනට ශේෂය	200,000,010	266,883,194	53,566,512	1,139,457,881	1,659,907,597

සටහන (අ)

1992.06.18 වන දින සිට 2003.12.31 දින දක්වා බැහැර කරන ලද වත්කම් වල වටිනාකම, එම වත්කම් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් බාරගත් වටිනාකමට හෝ එම වත්කම වෙනුවෙන් සමාගම දරණ ලද පිරිවැය යන අගයන්ගෙන් අදාල වන වටිනාකම යොදාගෙන ගණනය කර ඇති අතර එහි වටිනාකම වූ රු. 37,297,387.96 ක වටිනාකම අදාල වත්කම් වලින් අඩුකර ඇති අතර 2015.12.31 දිනට ඊට අනුපාතික අනෙක් හිණුම්කරණ ගැලපීම බදුකරුට ඇති ගෙවිය යුතු වටිනාකමින් අඩුකර පෙන්වා ඇත.

2016.12.21 වන දින පැවති 2015 - වාර්ෂික මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් අනුව 2004.01.01 දින සිට බැහැර කරන ලද/ පරිපාලනමය අයිතිය වෙනස් වූ වත්කම් වල වටිනාකමද ගණනය කර පොත් වලින් ඉවත් කිරීමට හා එම බැහැර කිරීම් වලට අදාල අනෙක් හිණුම්කරණ ගැලපීම් රඳවා ගත් ලාභ වලින් අඩු කිරීමටද කටයුතු කර ඇත.

ඒ අනුව රු. 37,297,387.96 ක වටිනාකම පසුගිය වසර වලට බලපාන පරිදි හා රු. 27,831,281/- ක වටිනාකමක් ප්‍රවර්තන වර්ෂයට බලපාන පරිදි ගැලපීම් කර ඇත.

සටහන (ආ)

ඉහත ගැලපීමට සමානුපාතිකව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් බදු පදනම මත ලබාගත් වත්කම් මත ගෙවනු ලබන බදු වාරික වල පොලී වියදම (මූල්‍ය පිරිවැය) නැවත ගණනය කරන ලද අතර 2015.12.31 දක්වා වන එහි බලපෑම පසුගිය වසර වලට බලපාන පරිදි ගැලපීම් කර ඇත.

සටහන (ඇ)

පසුගිය වසර වල, විලම්භිත බදු ගණනය කිරීමේදී පාරිභෝජ්‍ය ජෛව වත්කම් මත පැන නගින තාවකාලික වෙනස්කම්වල බලපෑම සැලකිල්ලට ගෙන නොමැති අතර එම බලපෑම ගණනය කොට පසුගිය වසරට බලපාන පරිදි ගැලපීම් කර ඇත.

සටහන (ඈ)

1992.06.18 වන දින සිට 2015.12.31 දින දක්වා ඉවත් කරන ලද පොල් ගස් සහ රබර් ගස්වල (ඉඩම් බැහැර කිරීමෙන් ඉවත් වූ ගස් හැර) පිරිවැය සහ ක්‍රමක්ෂය එම වත්කම් ඉවත් කළ වර්ෂයේදී හඳුනාගෙන නොතිබූ අතර එම ගැලපීම පසුගිය වසර වලට බලපාන පරිදි ගැලපීම් කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	2016 රු.	2015 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ මූල්‍ය ප්‍රවාහ		
ආදායම් බදු පෙර ලාභය	144,090,665	165,922,947
ගැලපීම්		
ක්ෂය/ක්‍රමක්ෂය	57,300,367	57,984,958
කල්බදු ගිවිසම් මත පොලිය	24,658,296	25,393,663
තාවකාලික බැංකු ණය මත පොලී	-	52,397
සේවක ණය මත ක්‍රමක්ෂය	779,453	1,032,463
පාරිතෝෂික වෙන් කිරීම්	19,651,574	23,787,118
පොලී ආදායම	(40,483,322)	(28,108,779)
දේපල පිරියත හා උපකරණ ඉවත්කිරීම මත ලාභය / (අලාභය)	-	1,054,006
ශුද්ධ කල්බදු වගකීම කරන ලද ගැලපීම	(34,751)	-
ගෙවූ ආදායම් බදු	-	-
ගෙවන ලද රඳවා ගැනීමේ බදු	(2,528,259)	(2,286,876)
ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු	(1,323,420)	-
කාර්ය සාධන දිරිදීමනා සඳහා වෙන්කිරීම්	18,031,000	25,203,842
ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම්	10,732,681	11,297,741
ඉවත් කරන ලද පොල් හා රබර් ගස්වල ශුද්ධ වටිනාකම	201,838	-
පාරිභෝජ්‍ය ජෛව වත්කම් වල අගය වෙනස්වීම මත ලාභ / අලාභ	(19,484,346)	(43,920,609)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**211,591,776**	**237,412,872**
(වැඩිවීම්) / අඩුවීම් තොග	(4,191,463)	8,366,052
(වැඩිවීම්) / අඩුවීම් තැන්පතු	84,300	(246,000)
(වැඩිවීම්) / අඩුවීම් ඉදිරියට ගෙවීම්	364,260	343,355
(වැඩිවීම්) / අඩුවීම් වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	2,342,287	1,673,343
(වැඩිවීම්) / අඩුවීම් කෙටිකාලීන ආයෝජන මත ඉදිරියට ගෙවූ වියදම්	2,966,963	1,659,413
වැඩිවීම් / (අඩුවීම්) කලින් ලද කුලී	606,111	797,489
වැඩිවීම් / (අඩුවීම්) වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	9,357,014	1,639,445
පාරිතෝෂික ගෙවීම්	(19,018,847)	(22,608,659)
කාර්ය සාධන දිරිදීමනා ගෙවීම්	(25,042,487)	(28,917,006)
ප්‍රසාද දීමනා ගෙවීම්	(8,795,250)	(12,242,295)
දැව ගස් විකුණුම් වලින් ලද මුදල්	16,465,488	35,971,988
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**186,730,152**	**223,849,997**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(100,552,823)	(141,215,895)
(වැඩිවීම්) / අඩුවීම් නොනිම් ප්‍රග්ධන වැඩ	(28,769,608)	6,041,257
දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලද මුදල්		82,000
ලද පොලී	25,912,922	25,835,469
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(103,409,508)**	**(109,257,168)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ		
ගෙවූ කල්බදු වාරික	(29,614,299)	(28,958,867)
තාවකාලික බැංකු ණය මත පොලී - ලංකා බැංකුව	-	(52,397)
සේවක ණය දීම්	(9,452,000)	(8,892,850)
සේවක ණය අය කර ගැනීම්	8,057,400	8,744,500
ගෙවූ ලාභාංශ		(50,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(31,008,899)**	**(79,159,614)**
මුදල් හා මුදල් සමාන දෑ වල වැඩිවීම / (අඩුවීම)	52,311,744	35,433,214
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	445,142,753	409,709,538
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	**497,454,497**	**445,142,753**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ...

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

(සටහන අ)

වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**2016** රු.	**2015** රු.
කාලීන තැන්පතු - ලංකා බැංකුව	76,000,000	166,000,000
කාලීන තැන්පතු - මහජන බැංකුව	234,000,000	130,000,000
කාලීන තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව	140,000,000	119,000,000
භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනිම්	37,000,000	21,000,000
බැංකු මුදල්	4,826,554	7,559,909
අතැති මුදල්	5,620,095	1,570,876
තැපැල් මුද්දර	7,849	11,968
	497,454,497	445,142,753

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු ප්‍රතිපත්ති

1.1. නෛතික ස්වභාවය

සී/ස කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව 1982 අංක.17 දරණ සමාගම් පනත යටතේ පිහිට වූ සීමාසහිත සමාගමක් වන අතර එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල දඹුල්ල පාරේ අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සමාගමේ සියලු කොටස්වල අයිතිය මහා භාණ්ඩාගාරය සතුය.

1.2. මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරයෙහි ස්වභාවය

අදාළ වර්ෂයේදී සමාගමේ මූලික ක්‍රියාකාරකම් ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදු කරන ලදී. කුරුණෑගල වැවිලි සමාගම වතුයාය 08 කින් සමන්විතව වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතී. එම වතුයායන් නම්,

අත්තනගල්ල	කටුගම්පල
දඹදෙණිය	කුරුණෑගල
දොඩම්ගස්ලන්ද	නාරම්මල
හිරියාල	මහායාය

2. මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

2.1. අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කොට ඇත.

2.2. අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ ඈවර කිරීමේ හෝ අභිලාෂයක් නොමැති බවට තහවුරු වේ.

2.3. මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයන්හි දැක්වෙන පහත අයිතමයන් හැර සියළුම ප්‍රමාණාත්මක අයිතමයන් ඓතිහාසික පිරිවැයට පෙන්නුම් කෙරෙන අතර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇත.

- හිස් බදු ඉඩම් ප්‍රත්‍යාගණනිත අගයට දක්වා ඇත. - සටහන 11
- පරිභෝජ්‍ය ජෛව වත්කම් විකිණුම් පිරිවැය අඩු කොට සාධාරණ අගය මත තක්සේරු කොට ඇත. - සටහන 13 (ආ)
- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුවක් මත හඳුනාගෙන ඇත. (ශ්‍රී ලංකා ප්‍රමිත අංක 19) - සටහන 24
- ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂිබෝග අස්වැන්න ශුද්ධ උපලබ්ධිත අගය මත තක්සේරු කොට ඇත. ශුද්ධ උපලබ්ධිත අගය, ඇස්තමේන්තු විකුණුම් මිලෙන් ඇස්තමේන්තු ගත විකුණුම් වියදම් අඩුකිරීමෙන් ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශයන්හි උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැළපුමක් සිදුකොට නොමැත.

2.4. ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන් සමාගමෙහි ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. සියළු මූල්‍ය අයිතමයන් ආසන්නතම රුපියලට වටයා ඇත.

2.5. ඇස්තමේන්තු භාවිතය සහ නිශ්චයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට අදාළව නිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගැනීම අවශ්‍ය වේ.

අදාළ නිශ්චයන් සහ ඇස්තමේන්තු පූර්ව අත්දැකීම්, ප්‍රවණතා සහ වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව සැබෑ ප්‍රතිඵල, අදාළ නිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. වලංගුභාවය තහවුරු කර ගැනීම උදෙසා අදාළ ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිරන්තර සමාලෝචනයට ලක්කෙරේ.

ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම අදාළ සංශෝධනය සිදු කරන කාලපරිච්ඡේදයට හා ඉදිරියට බලපාන පරිදි හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත්, මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් ඇතිකරන අගයන් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත නිශ්චයන් පහත දැක්වෙන සටහන් වල ඇතුළත් වේ.

සටහන 12	- නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර)
සටහන 13 (ආ)	- පරිභෝජ්‍ය ජෛව වත්කම්
සටහන 24	- නිර්නය කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්
	- පාරිතෝෂික
සටහන 26	- විලම්භිත බදු කරණය

2.6. සංසන්දනාත්මක තොරතුරු

වඩාත් සාධාරණ ඉදිරිපත් කිරීමක් උදෙසා ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සමඟ සැසඳෙන පරිදි, පෙර වසර වල මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සංශෝධනය කර ඉදිරිපත් කර ඇත.

3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේදී යොදා ගැනුනු මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

3.1. වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම

මූල්‍ය ප්‍රකාශයන්හි ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ඇත්තේ සමාගමෙහි සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ වාර්තා කරන දින සිට වසරක් ඇතුළත උපලබ්ධි වන වත්කම්ය. ජංගම වත්කම් හැර වෙනත් වත්කම් වනුයේ සමාගම විසින් වාර්තා කරන දින සිට වසරකට වඩා වැඩි කාලයක් පවත්වා ගෙන යාමට අදහස් කරන වත්කම් වේ.

3.1.1. දේපල පිරියත සහ උපකරණ

3.1.1.1. හඳුනා ගැනීම සහ මිනුම්කරණය

දේපල පිරියත සහ උපකරණ දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂවීම් සහ සමුච්චිත අපහායන අලාභ අඩු කිරීමෙන් අනතුරුවය.

මෙම අරමුණ සඳහා වූ පිරිවැය, අදාල වත්කම අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටමට හෝ භාවිතයට ගෙන ඒමට වැයකරන සෘජු වියදම් ඇතුළත් කොට ඉදිරිපත් කරයි. ආයතනය විසින් ඉදිකරන ලද වත්කම්වල පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු වියදම් වලින් යුක්ත වේ. මෙහිදී යම් පවත්නා වත්කමක් ඉවත් කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් පිරිවැයක් වේනම් එයද නව වත්කමේ පිරිවැය ගණනය කිරීමේදී එකතු කරනු ලබයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

නොනිමි ප්‍රාග්ධන වැඩ අදාල වත්කම පළමුවෙන් භාවිතා කරන මොහොතේදී නියමිත වත්කම් ගිණුම් වෙත මාරු කරයි.

වෙනස් වූ ආර්ථික ඵලදායී ජීව කාලයක් ඇති දේපල පිරියත සහ උපකරණ වෙන වෙනම අයිතම වශයෙන් පෙන්නුම් කරයි.

ඉඩම් සංවර්ධන පිරිවැය වශයෙන් හැඳින්වෙන්නේ බිම් සැකසුම්, නව මාර්ග ඉදිකිරීම් සහ වෙනත් ප්‍රධාන පෙළේ යටිතල පහසුකම් සංවර්ධනයන්ය.

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල සහ පිරියත වල ධාරණ වටිනාකම සහ ඒවා ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමෙහි අන්තරය වශයෙන් සැලකෙන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකශනයෙහි වෙනත් ආදායම් යටතේ දැක්වේ.

3.1.1.2. පසුකාලීන වියදම්

පවත්නා දේපල පිරියත හෝ උපකරණ මත සිදුකරණ ලද වියදමක ප්‍රතිඵලයක් ලෙස ආරම්භයේදී එම වත්කමින් තක්සේරු කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය ඉක්මවා ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂිත කල්හි හා එම වියදම සාධාරණව හඳුනා ගත හැකි විටක එම වියදම ප්‍රාග්ධනිත කෙරේ. වත්කමෙහි පවත්නා වර්තමාන වටිනාකම ඉවත් කරනු ලැබේ.

එදිනෙදා දරණ දේපල පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ පිරිවැය විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම් වශයෙන් හඳුනා ගැනේ.

3.1.1.3. වත්කමක වටිනාකම ඉවත් කිරීම

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමේදී හෝ එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ තව දුරටත් නොලැබෙන කළ එහි පවතින වටිනාකම ඉවත් කෙරේ. අදාල ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගැනේ.

3.1.1.4. ණය පිරිවැය

කිසියම් වත්කමක් අත්පත් කර ගැනීමේදී, ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනයේදී එම කටයුත්ත සඳහා ගනු ලබන ණය මුදලකට අදාල ණය පිරිවැය පහත කරුණු වලට යටත්ව ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. ආදාල වත්කම අපේක්ෂිත කාර්ය සඳහා යොදා ගන්නා තෙක් එම කාලයට අදාළ ණය පිරිවැය පමණක් එම වත්කමේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 23 අනුව තීරණය කරයි.

3.1.1.5. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

ක්ෂයවීම් ගණනය කරනුයේ වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම මත පදනම්ව වේ. ක්ෂයවීම් එක් එක් වත්කමෙහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ සිදුකරනු ලබයි.

බදු පදනමට ලබා ගත් වත්කමක්, අදාල බදු කාල පරිච්ඡේදය හෝ අදාල වත්කමේ වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ.

ඉඩම් ක්ෂය නොකරයි.

ඇස්තමේන්තු ගත ඵලදායී ජීවකාලයන් පහත දැක්වේ.

	අවුරුදු
ගොඩනැගිලි	40
ළිං	40
වැටවල්	03
රථවාහන	05
යන්ත්‍ර	13 1/3
ලී බඩු හා සවිකිරීම්	10
උපකරණ	08
පරිගණක	05

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කිසියම් වත්කමක් ක්‍ෂය කිරීම එය භාවිතයට ගනු ලබන අවස්ථාවේ සිට ඇරඹෙන අතර අදාල වත්කම විකිණීම සඳහා හඳුනාගත් අවස්ථාවේදී හෝ එම වත්කම භාවිතයට ගැනීම අතහරින දිනයේ දී අවසන් වේ. බදු පදනමට ලබා ගත් වත්කම් පහත දැක්වෙන කාලපරිච්ඡේදයන් පුරා ක්‍රමක්‍ෂය කෙරේ.

	අවුරුදු
හිස් ඉඩම්	53
ගොඩනැගිලි	25
යන්ත්‍ර	15
මේරූ වගාවන්	30
ඉඩම් සංවර්ධන පිරිවැය	30

3.1.1.6. බදු පදනමට ලබා ගත් වත්කම්

සමාගම මූල්‍ය කල්බදු පදනමට ලබාගත් වත්කම් වල අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට පැවරී ඇති බැවින් ඒවා මුදලට මිලදී ගත් වත්කමක් සේ සලකා ප්‍රාග්ධනිත කර ඇත.

මූල්‍ය කල්බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල පරිච්ඡේදය හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්‍ෂය කෙරේ.

බදු කාලසීමාව තුල හිමිකාරිත්වයට අදාල අවදානම් සහ ප්‍රතිලාභ බදු හිමියා විසින් රඳවාගන්නා අවස්ථාවන්හි ඒවා මෙහෙයුම් කල් බදු වශයෙන් සැලකේ. මෙහෙයුම් කල් බදු සම්බන්ධයෙන් ගෙවනු ලබන බදු වාරික වියදමක් සේ සළකා විස්තීර්ණ ආදයම් ප්‍රකාශනය තුල හඳුනා ගනී.

3.1.1.7. මූල්‍යමය නොවන වත්කම් වල අපහායනය

සමාගම් මගින් සෑම වාර්තා කරන දිනයකදීම වත්කමක් අපහායනය වී ඇතිදැයි සළකා බැලේ. එවැනි හානි වීමක් පිළිබඳ සංඥාවක් පවතී නම් හෝ හානි වීම් සම්භන්ද වාර්ෂික පරික්ෂාවක් අවශ්‍ය වූ විටකදී සමාගම මගින් වත්කමෙහි ඉදිරි ආවරණ වටිනාකම පිළිබඳ තක්සේරුවක් සිදු කරයි.

කිසියම් වත්කමක් මුදල් ප්‍රවාහයන් උත්පාදනය නොකරන්නේ නම්, අදාල වත්කමෙහි ආවරණය කරගත හැකි වටිනාකම, එහි ධාරණ වටිනාකමට වඩා වැඩිනම් සහ එහි සැබෑ වටිනාකමින් එම වත්කම විකිණීම සඳහා දැරීමට සිදුවේයැයි අපේක්ෂිත විකුණුම් වියදම් අඩුකොට සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. වත්කමක ධාරණ වටිනාකම එහි ආවරණය කරගත හැකි වටිනාකම ඉක්මවා ඇතිවිටක අදාල වත්කම අපහායනය වූ බවට සැලකෙන අතර එහි වටිනාකම ආවරණය කරගත හැකි අගය දක්වා අඩු කරනු ඇත.

වත්කමක සැබෑ වටිනාකම තක්සේරු කිරීමේදී එම වත්කමෙහි ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් බදු පෙර වට්ටම් අනුපාතයන් යොදා ගනිමින් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් ගත කරනු ලබයි. මීට අමතරව විකිණීමේ පිරිවැය අඩුකළ සැබෑ වටිනාකම තීරණය කිරීමේදී මෑත කාලීන ගණුදෙනු ද සැලකිල්ලට ගැනේ. එවැනි ගනුදෙනු නොමැති විටක උචිත තක්සේරු ආකෘතියන් භාවිතා කරනු ලබයි.

අපහායන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ. පෙර හඳුනාගත් අපහායනය අලාභයක් ආපසු හරවනු ලබන්නේ අදාල වත්කමෙහි ආවරණ වටිනාකම තීරණය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු වල වෙනසක් සිදු වුවහොත් පමණි. එවැනි ආපසු හැරවීමක මූල්‍ය බලපෑම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

3.1.2. ජෛව වත්කම්

ජෛව වත්කම් මේරූ සහ නොමේරූ වත්කම් වශයෙන් වර්ග දෙකකි. මේරූ ජෛව වත්කම් යනු අස්වැන්න නෙළාගත හැකි තත්ත්වයට පත්වූ වගා වන අතර නොමේරූ ජෛව වත්කම් යනු තවමත් අස්වැන්න නෙළාගත හැකි තත්ත්වය පත් නොවූ වගාවන්ය.

ජෛව වත්කම් තවදුරටත් ඵලදරණ ජෛව වත්කම් සහ පරිභෝජ්‍ය ජෛව වත්කම් වශයෙන් වර්ග කරයි. ඵලදරණ ජෛව

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වත්කම් වලට විකිණීමට හෝ හෙලීමට අපේක්ෂාවෙන් තබාගෙන නෙමැති පොල් සහ රබර් වගා (ගස්) ඇතුලත් වේ.

පරිභෝජ්‍ය ජෛව වත්කම් ලෙස වර්ග කරනුයේ තේක්ක, මහෝගනී, හල්මිල්ල වැනි වාණිජ වටිනාකමක් සහිත දැව ගස්ය.

3.1.2.1. ඵලදරණ ජෛව වත්කම්

ඵලදරණ ජෛව වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීමේ හා අපහායනය අලාභයන් අඩු කිරීමෙන් අනුතුරුව වන අතර දේපල පරියත සහ උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව එය සිදුකරයි.

යම් වගාවක් වාණිජමය අස්වැන්න නෙළා ගැනීමේ තත්ත්වයට පත්වන තුරු දරණු ලබන බිම් සැකසුම් ඇතුළු වගාව ස්ථාපනය සඳහා දරණු ලබන සහ පොහොර යෙදීම් වැනි එම වගා නඩත්තුව සඳහා දරණු ලබන පිරිවැය නොමේරූ වගා යටතේ වර්ග කරයි. මෙම නොමේරූ වගා පිරිවැය, එම වගා සඳහා වන සෘජු පිරිවැය, එම වගා සඳහා අදාල වන පොදු කාර්ය පිරිවැය සහ එම වගා සෘජුව අදාල වන දිගුකාලීන ණය සඳහා වූ පොලී පිරිවැය යන පිරිවැයන්හි එකතුවන් ලෙස ගණනය කරනු ලබයි.

නොමේරූ තත්වයේ පැවති වගාවක් මේරූ තත්වයට පත්වූ විටක එසේ සිදුවූ වර්ෂයේ අවසානයේ එම වගාව සඳහා දරා ඇති පිරිවැය මේරූ වගා යටතට මාරු කරනු ලබයි. අන් ආකාරයක් පිළිබඳව සඳහන් කර නොමැති විටක, මේරූ ඵලදරණ ජෛව වත්කම් ඒවායේ ආර්ථික ඵලදායී ජීවිත කාලය අනුව පහත පරිදි ක්ෂය කරනු ලබයි.

පොල්	50
රබර්	20
වෙනත් වැවිලි	20

යම් ඵලදරණ ජෛව වත්කමක සිදුවන ස්ථිර අපාහනයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල අලාභයක් ලෙසට හඳුනා ගැන්නා අතර එම ජෛව වත්කමෙහි වටිනාකම අපාහන අලාභයේ වටිනාකමින් අඩුකරනු ලබයි.

3.1.2.2. ඵලදරණ ජෛව වත්කම්වල පාළු පැළ සිටුවීමේ පිරිවැය

මේරූ වගාවල ඇති පුරප්පාඩු සිටුවීම සඳහා දරණු ලබන වියදම් මෙම ගණයට අයත් වේ. වගාවේ ඵලදායී ජීවිත කාලය වැඩිවීමට හෝ අස්වැන්න වැඩිවීමට හෝ පෙර තක්සේරු කරන ලද වගාවේ ප්‍රගතිය අභිබවා නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිවීමකට තුඩු දෙන ආකාරයෙන් කරනු ලබන පාළු සිටුවීමක් වෙනුවෙන් දරණු ලබන පිරිවැය ප්‍රාග්ධනය කර නැවත තක්සේරු කරන ලද ඉතිරි ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලබයි. ප්‍රාග්ධනය කරනු නොලබන පාළු සිටුවීමේ පිරිවැය එය දැරූ වර්ෂයේ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනු ලබයි.

3.1.2.3. පාරිභෝජ්‍ය ජෛව වත්කම්

පාරිභෝජ්‍ය ජෛව වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික/ ප්‍රථම හඳුනා ගැනීමේදී මිණුම් කරන අතර එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස්වල සාධාරණ වටිනාකම, වර්තමාන දැව මිල ගණන් හා එම දැව ගස් පරිණත තත්ත්වයට පත්වූ විට එම දැව ගස් වලින් අපේක්ෂිත දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගෙන ගණනය කරනු ලබයි.

නොමේරූ ගස්වල පිරිවැය, සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි. මෙම ගණනය කිරීම සුදුකම් ලත් ස්වාධීන තක්සේරු කරුවකු විසින් කරනු ලබයි. පාරිභෝජ්‍ය ජෛව වත්කම් මූලික/ ප්‍රථම හඳුනා ගැනීමේදී හඳුනා ගනු ලබන ලාභ හෝ අලාභ සහ ඉන් පසුව එම වත්කම් වල සාධාරණ අගය වෙනස් වීම හේතු කොට ගෙන ඇති වන්නා වූ ලාභ හෝ අලාභ, එම ලාභ හෝ අලාභ හට ගත්තා වූ කාල පරිච්ඡේදයට අදාල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනු ලබයි. මේ හා සම්බන්ද අනෙකුත් සියළුම උපකල්පන ගිණුම් සටහන් අංක 13 (ආ) හි දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය/ ආකෘතිය (DCF) තුල අවදානය යොමු කොට අති ප්‍රධාන විචල්‍යයන්

විචල්‍යය	විග්‍රහය
මුදල් ඒකකය	ශ්‍රී ලංකා රුපියල්
දැව පරිමාව	උස සහ වටප්‍රමාණය භෞතිකව තහවුරු කරගැනීමෙන් හා විවිධ භූගෝලීය ප්‍රදේශයන් තුල එක් එක් දැව වර්ගයෙහි වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. මෙහිදී දැව හෙලීමට අදාල බලපවත්වනු ලබන සියළුම ව්‍යවස්ථාපිත විධි විධාන සැලකිල්ලට ගනු ලබයි.
ආර්ථික ඵලදායි ජීවිත කාලය	එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය අනුව තීරණය කරනු ලබයි.
විකුණුම් මිල	ශ්‍රී ලංකාවේ පවතින වෙළෙඳ පොළ මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. මෙහිදී දැව ගස් විකුණුම් තත්ත්වයට පත්කරීම සඳහා සම්පූර්ණ කළ යුතු සියළුම අවශ්‍යතාවයන් පිළිබඳව සළකා බලයි.
වට්ටම් අනුපාතය	අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා 14% වට්ටම් අනුපාතය යොදා ගෙන ඇත.

3.1.2.4. හඳුනාගැනීම හා මිනුම්කරණය

සමාගම මගින් ජෛව වත්කම් හඳුනාග නු ලබන්නේ අදාල වත්කම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත හිමිවන බවට තහවුරුවක් පවතින්නේ නම් සහ එම වත්කම සම්බන්ද පාලනය සමාගම සතුව පවතින්නේ නම් පමණි.

ඵල දරණ ජෛව වත්කම් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් සහ අපහායන අලාභ අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට ගණනය කෙරේ.

පරිභෝජ්‍ය දැව ගස් මූලික/ ප්‍රථම හඳුනාග ැනීමේදී හා එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේදී ගිණුම්කරණ ප්‍රමිත අංක 41 අනුව ඒවායේ සබෑ අගයෙන් විකුණුම් වියදම් අඩුකර සාධාරණ වටිනාකමට හඳුනා ගෙන වාර්තා කරනු ලබයි.

3.1.3. මූල්‍යමය උපකරණ

3.1.3.1. මූල්‍යමය වත්කම්

3.1.3.1.1. මූලික හඳුනා ගැනීම සහ මිනුම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 යටතේ ගැනෙන මූල්‍යමය වත්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හරහා සධාරණ අගයට හඳුනාගනු ලබයි.

මෙම මූල්‍යමය වත්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගය මත හඳුනා ගනු ලබන මූල්‍යමය වත්කම් හෝ දුන් ණය සහ ලැබිය යුතු මුදල් හෝ කල්පිරීම තෙක් රඳවාගෙන ඇති ආයෝජන හෝ විකිණීමේ බලාපොරොත්තුවෙන් තබා ගෙන ඇති මූල්‍යමය වත්කම් හෝ වශයෙන් යෝග්‍ය පරිදි වර්ගීකරණය කරනු ලබයි.

යම් මූල්‍යමය වත්කමක වර්ගීකරණය එහි පළමු හඳුනාගැනිමේදීම තීරණය කරනු ලබයි.

සියලු මූල්‍යමය වත්කම් පළමු හඳුනාග ැනිමේදී සාධාරණ අගයට හඳුනා ගැනේ. සාධාරණ නොවන අගයක් සහිත මූල්‍යමය වත්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හරහා ලාභ/අලාභ ඔස්සේ සධාරණ අගයට හඳුනාගනු ලබයි. එහිදී එයට ආදාල ගනුදෙනු පිරිවැය ද සැළකිල්ලට ගනු ලබයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1.3.1.2. පසුකාලීන මිණුම්කරණය

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිනුම්කරණය යම් මූල්‍ය වත්කමක වර්ගීකරණය මත තීරණය වන අතර එය පහත පරිදි වේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගය මත හඳුනා ගනු ලබන මූල්‍යමය වත්කම්.

උක්ත වර්ගීකරණය යටතේ හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම් යටතට, වෙළෙඳ/ගනුදෙනු කිරීමේ පරමාර්ථයෙන් තබාගෙන ඇති මූල්‍ය වත්කම් සහ මූලික හදුනාගැනීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හදුනාගත් මූල්‍යය වත්කම් ඇතුළත් වේ. කිසියම් මූල්‍ය වත්කමක් ඉදිරි කෙටි කාලයක් තුල විකිණීමේ හෝ ප්‍රති මිලදී ගැනීමේ හෝ අරමුණින් අත්පත් කර ගත්තේ නම් ඒවා වෙළෙඳ/ගනුදෙනු කිරීම සඳහා තබාගෙන ඇති මූල්‍යය වත්කම් වශයෙන් වර්ග කරයි. එමෙන්ම ප්‍රාවීරණ (ඉදිරි රැකුමක් සහිත) මූල්‍යය වත්කම් ලෙසට හඳුනා ගෙන නොමැති විටක ව්‍යුත්පන්න මූල්‍යය වත්කම් ද වෙළෙඳ/ගනුදෙනු කිරීම සඳහා තබාගෙන ඇති මූල්‍යය වත්කම් වශයෙන් වර්ග කරයි.

මෙම වර්ගයේ මූල්‍යය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරයි. එම වත්කම් වල සාධාරණ අගයේ සිදුවන වෙනස්වීම් විස්තර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය පිරිවැය හෝ මූල්‍ය ආදායම් යටතේ හඳුනා ගනී.

දුන් ණය සහ ලැබිය යුතු මුදල්

යනු ක්‍රියාකාරී වෙළඳපලක් තුල මිල තීරණය නොවන ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව එම වත්කම් පසුව හඳුනාගනු ලබන්නේ, සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ක්‍රමක්‍ෂය කරන ලද පිරිවැයෙන් අපාහන (හානිවූ) වටිනාකම අඩු කිරීමෙන් පසුව ලැබෙන වටිනාකමටය.

ක්‍රමක්‍ෂය කිරීමට යොදාගනු ලබන පිරිවැය එම වත්කම් අත්පත් කර ගැනීමේදී අදාල වූ අවමිල, අධිමිල සහ වෙනත් ගාස්තු හෝ පිරිවැයන් සැලකිල්ලට ගනිමින් තීරණය කරයි.

සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ හදුනාගනු ලබන ක්‍රමක්‍ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය ආදායම් යටතේ හඳුනාගැනේ. අපාහන අලාබ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය වියදමක් මූල්‍ය වියදම් යටතේ හඳුනාගැනේ.

දුන් ණය සහ ලැබිය යුතු මුදල් යන්නට වෙළඳ ණයගැතියන්, තැන්පතු, අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් හා මුදල් සමාන දෑ අයත් වේ.

කල්පිරීම තෙක් රඳවාගෙන ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ ප්‍රතිලාභ සහිත නිශ්චිත කල්පිරීම් කාලයක් ඇති කල්පිරීම දක්වා රඳවා ගැනීමේ හැකියාවක් හා එවැනි අභිලාෂයක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරීම තෙක් රඳවාගෙන ඇති ආයෝජන ලෙසට වර්ගීකරණය කෙරේ. පළමු මිණුම්කරණයෙන් පසු, කල්පිරීම තෙක් රඳවාගෙන ඇති ආයෝජන වල වටිනාකම පිරිවැයෙන් සමුච්ඡිත ක්‍රමක්‍ෂය හා අපහායන අලාභ අඩු කිරීමෙන් ගණනය කරනු ලබයි. එහිදී ක්‍රමක්‍ෂය ගණනය කිරීම සඳහා සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනී. ක්‍රමක්‍ෂය කිරීම සඳහා පාදක කරගනු ලබන පිරිවැය එම වත්කම් අත්පත් කරගැනීමේදී ගෙවූ අවමිළ අධිමිළ සහ එම ගනුදෙණුවේ අත්‍යවශ්‍ය කොටසක් ලෙසට දැරීමට සිදුවූ ගාස්තු හෝ වියදම්ද සැළකිල්ලට ගනු ලබයි. ක්‍රමක්‍ෂය ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය ආදායමක් ලෙසට හඳුනාගනු ලබන අතර අපහායන අලාභ එම ප්‍රකාශය තුල මූල්‍ය පිරිවැයක් ලෙසට හඳුනාගනු ලැබේ.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජන සහ ණය සුරැකුම් ඇතුලත් වේ. ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජන යන්නට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුලින් ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් හෝ වෙළඳපොල තුල වෙළඳ ගණුදෙණු කිරීම සඳහා තබාගෙන සිටින හෝ මූල්‍ය

ආයෝජන හැර අනෙකුත් මූල්‍ය ආයෝජන ඇතුළත් වේ.

අවිනිශ්චිත අනාගත කාලයක් පුරා රඳවාතබා ගැනීමේ අපේක්ෂාවෙන් තබාගෙන ඇති ණය සුරැකුම් ද මෙම කාණ්ඩය යටතට ගැනේ. මෙවැනි ණය සුරැකුමක් විකිණීම ද්‍රවශීලතා අවශ්‍යතාවයක් හෝ වෙළඳපල තත්ත්වයේ වෙනස් වීමක් නිසා හෝ පමණක් සිදු කෙරේ.

පළමු හඳුනාගැනීමෙන් පසුව, විකිණීමට ඇති මූල්‍ය ආයෝජන එම වත්කම් මූල්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනිම අතහරින අවස්ථාව දක්වා සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර උපලබ්ධි නොවූ ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගෙන විකිණීමට ඇති මූල්‍ය ආයෝජන සංචිතයට මාරු කරයි. මූල්‍ය වත්කමක් ලෙස හඳුනාගැනීම අත්හරින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල මූල්‍ය ආදායම් හෝ වියදම් ලෙස නැවත වර්ගීකරණය කර හඳුනාගනු ලබන අතර එම වත්කමට අදාල වටිනාකම විකිණීමට ඇති ආයෝජන සංචිතයෙන් මාරු කිරීම සිදු කරනු ලබයි.

විකිණීමට ඇති ණය සුරැකුම් වලට අදාල පොලී ආදායම සඵල පොලී අනුපාත ක්‍රමය යටතේ ගණනය කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනී.

3.1.3.1.3. හඳුනාගැනීමෙන් වැලකීම

කිසියම් මූල්‍යමය වත්කමක් හෝ මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන ආකාරයේ මූල්‍යමය වත්කම් සමූහයක කොටසක් හෝ පහත දැක්වෙන අවස්ථාවන්හිදී මූල්‍ය වත්කම් ලෙස හඳුනාගැනීමෙන් වැලකී සිටී.

- අදාල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ හිමිකම අවසන් වීම

- යම් මූල්‍ය වත්කමක් තවදුරටත් මූල්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීම අවසන් කරනු ලබන්නේ එම වත්කමකින් ජනනය වන මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය සමාගම විසින් වෙනත් පාර්ශවයකට පවරා ඇති විටක හෝ පැවරුම් ගිවිසුමක් තුල එවැනි වත්කමක් සම්බන්ධයෙන් ලබාගත් මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට ගෙවීමට බැඳී ඇති විටක හෝ සහ (අ) යම් වත්කමක අවදානම සහ ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනත් පාර්ශවයකට පවරා ඇති විටක හෝ (ආ) යම් වත්කමක අවදානම සහ ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනත් පාර්ශවයකට පවරා නැතත් එම වත්කමෙහි පාලන හැකියාව පවරා ඇති විටකය.

3.1.3.1.4. මූල්‍යමය වත්කම් අපහායනය වීම

සමාගම මගින් එක් එක් වාර්තා කරන දිනයන්හි දී මූල්‍යමය වත්කම් අපහායනය පිළිබඳ භෞතික සාක්ෂි පවතීදැයි පරීක්ෂා කෙරේ. කිසියම් වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදු වූ සිදුවීමක් හේතුකොටගෙන මූල්‍ය වත්කමක අපහායනය වීමක් පිළිබඳ යම් සාක්ෂියක් හඳුනා ගතහොත් හා එම සිද්ධිය එම වත්කමෙන් අපේක්ෂිත අනාගත මූල්‍යමය ප්‍රවාහයන් සම්බන්ධයෙන් යම් බලපෑමක් ඇතිකරන විට සහ එම බලපෑම විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි විට පමණක් මූල්‍යමය වත්කමක් අපහායනය වූ බවට නිර්ණය කෙරේ.

3.1.3.2. මූල්‍යමය වගකීම්

3.1.3.2.1. මූලික හඳුනා ගැනීම සහ මිණුම්කරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි විෂය පථය තුළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුලින් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන මූල්‍ය වගකීම්, හෝ ලබාගත් ණය ලෙසට හඳුනා ගනු ලබයි.

යම් මූල්‍ය වගකීමක වර්ගීකරණය පළමු හඳුනාගැනීමේදී නිර්ණය කරනු ලබයි. ඕනෑම මූල්‍ය වගකීමක් පළමු හඳුනාගැනීමේදී සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර එය ණයක් සම්බන්ධයෙන් වන විට එය අත්පත් කර ගැනීම සඳහා හෝ එවැනි මූල්‍ය වගකීමක් නිකුත් කිරීම සඳහා හෝ දරණු ලබන පිරිවැයද එයට එකතු කර මුළු වගකීමේ වටිනාකම ගණනය කරනු ලබයි.

සමාගමේ මූල්‍ය වගකීම් යන්නට, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ ලබාගත් ණය ඇතුළත් වේ.

3.1.3.2.2. පසුකාලීන මිණුම්කරණය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුලින් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන මූල්‍ය වගකීම් යන්නට විකිණීමේ අරමුණින් තබාගෙන ඇති සහ පළමු හඳුනාගැනීමේදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුලින් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබූ මූල්‍ය වගකීම් ඇතුලත් වේ.

ඉතා ආසන්න කාලයක් තුල විකිණීමේ බලාපොරොත්තුවෙන් අත්පත් කරගෙන ඇති මූල්‍ය වගකීම් විකිණීමට ඇති මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

විකිණීමට ඇති මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඇතිවන්නා වූ ලාභ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනු ලබයි.

පළමු හඳුනාගැනීමෙන් පසුව, පොලී සහිත ණය සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට හඳුනා ගනී. සඵල පොලී අනුපාත ක්‍රමය තුලින් හෝ වගකීමක් හඳුනා නොගැනීම තුලින් හෝ පැන නගින ලාභ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනී.

ක්‍රමක්ෂය කරනු ලබන පිරිවැය, අත්පත්කර ගැනීමේදී අදාල වූ අවමිල හෝ අධිමිල සහ ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලබයි. සඵල පොලී අනුපාත ක්‍රමය තුළ වූ ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගැනේ.

3.1.3.2.3. හඳුනා ගැනීම අවසන් කිරීම

යම් මූල්‍ය වගකීමක් යටතේ ඇති බැඳියාව ගෙවා අවසන් කර ඇති විටක හෝ අහෝසි වී ඇති විටක හෝ කල් ඉකුත් වී ඇති විටක හෝ එම මූල්‍ය වගකීම තවදුරටත් මූල්‍ය වගකීමක් වශයෙන් හඳුනා නොගනී.

3.1.3.3. මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කිරීම කළ හැක්කේ හඳුනාගත් වටිනාකම් එකිනෙකට හිලව් කිරීමට බලාත්මක නීතිමය අයිතියක් වර්තමානයේ පවතින්නේ නම් සහ මෙම වත්කම් හා වගකීම් ශුද්ධ වටිනාකමට හිලව් කිරීමට හෝ මූල්‍ය වත්කම උබලබ්ධිකර ඒත් සමඟම මූල්‍ය වගකීම ගෙවා අවසන් කිරීමට හෝ අභිප්‍රායක් ඇත්නම් පමණි.

3.1.3.4. මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රති පාර්ශවකරුවකු සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගමට අත්වන මූල්‍ය අලාභ වන අතර මෙය මූලිකවම සමාගම වෙත ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් සහ සම්බන්ධිත පාර්ශවයන් ආශ්‍රිතව උද්ගත වේ.

හානිකරණය සඳහා සමාගම යම් ඉඩහැරීමක් (ප්‍රතිපාදනයක්) තබා ඇති අතර ඒ තුලින් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ඇතිවිය හැකි අලාභයේ තක්සේරු වටිනාකම නිරූපණය වේ.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කම් යොදා ගනිමින් ස්වකීය මූල්‍යමය වගකීම් ඉටු කිරීමට නොහැකි වීමෙන් සමාගමක් විසින් මුහුණ දෙන අවදානම වේ. ද්‍රවශීලතා කළමනාකරණය සඳහා සමාගම අනුගමනය කරනු ලබන ප්‍රවේශය වනුයේ සාමාන්‍ය මෙන්ම ආන්තික තත්ත්වයකදී ද අනපේක්ෂිත අලාභ ඇතිවන්නා වූ හෝ සමාගමේ කීර්තිනාමයට හානි වන ආකාරයේ හෝ ක්‍රියාවලියකින් තොරව සිය මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොලී අනුපාත අවදානම

වෙළෙඳපොළ පොලී අනුපාතයන් වෙනස් වීමේ අවදානමට සමාගම මූලිකවම ලක් වනුයේ පාවෙන පොලී අනුපාතයක් සහිත දිගුකාලීන ණය ලබා ගෙන ඇති විටකය. මෙම අවදානම කළමනාකරණය කිරීම සඳහා පාවෙන සහ ස්ථාවර පොලී අනුපාත වලින් යුත් සමතුලිත ණය පහසුකම් සම්මිශ්‍රණයක් පවත්වා ගැනීමට සමාගම කටයුතු කරනු ලබයි.

3.1.4. තොග

3.1.4.1. ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන අස්වැන්න

වාර්තා කරන දිනට විකිණී නොමැති නමුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනය වන විට විකිණී ඇති ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන (අස්වැන්න), එම විකුණුම් මිලෙන් විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට තක්සේරු කර ඇත.

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන දින වනවිටත් විකුණුම් ගිවිසුම් සඳහා එළැඹී නොමැති තොග, ඇස්තමේන්තුගත සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිලක් යටතේ ඇස්තමේන්තු කර ඇත.

පොල් සඳහා අස්ථාවර වෙළෙඳ පොළ තත්ත්වයක් පවතින අවස්ථාවක එම පොල් තොග කොප්පරා බවට පරිවර්තනය කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ උපලබ්ධිත අගයට ඇස්තමේන්තු කරනු ලබයි.

3.1.4.2. වැඩිදුර සැකසු කෘෂි නිෂ්පාදන

වැඩිදුර සකසන ලද කෘෂි නිෂ්පාදන වල වටිනාකම, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත වටිනාකම යන අගයන්ගෙන් අඩු වටිනාකමට තක්සේරු කෙරේ. මෙහිදී අබලි හා අඩු සංචලනයක් සහිත අයිතම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් තබා ඇත. ශුද්ධ උපලබ්ධිත වටිනාකම යනු අදාල තොග සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුල විකිණීමෙන් ලැබිමට අපේක්ෂිත මිලෙන් අපේක්ෂිත විකුණුම් වියදම් සහ එම තොග විකිණිය හැකි තත්ත්වයට පත් කිරීමට දැරිය යුතුවන වියදම් අඩු කොට ලැබෙන අගය වේ.

3.1.4.3. යෙදවුම් අමුද්‍රව්‍ය, පරිභෝජනය කළහැකි දෑ සහ අමතර කොටස්

මේවා පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් (FIFO) පදනම මත සත්‍ය පිරිවැයට ගණනය කෙරේ.

3.1.4.4. පැලතවාන්

පැලතවාන් පිරිවැය සඳහා සෘජු අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු පොදු කාර්ය පිරිවැය ඇතුළත් වේ. නිසි ප්‍රමාණය ඉක්මවා වැඩුනු පැල මෙහිදී ඉවත් කරනු ලබයි.

3.1.5. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යන්නට මුදල් ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ වටිනාකම වෙනස්වීම පිළිබඳ අවදානම අවම මට්ටමක පවතින දන්නා මූල්‍යමය වටිනාකමක් සඳහා කඩිනමින් මුදල් බවට පරිවර්තනය කළහැකි ද්‍රවශීල ආයෝජනයන්ගෙන් සමන්විත වෙයි.

3.2. වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වගකීම් යටතේ දක්වා ඇත්තේ වාර්තා කරන දිනයෙන් වසරක් ඇතුලත ගෙවිය යුතු හෝ ඉල්ලූ විටෙකදී ගෙවීමට බැඳී සිටින වගකීම් වේ. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයෙන් වසරකට පසු ගෙවියයුතු ගෙවීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියළුම වගකීම් ගිණුම්ගත කොට ඇත.

යම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේදී සමාගම යම් නෛතික බැඳීමකට යටත්ව ඇත්ද එම බැඳීම විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකිද සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක මූල්‍ය ගලායාමක් අවශ්‍ය වන්නේද එවැනි විටෙක ඒ සඳහා වෙන්කිරීමක් සිදු කරනු ලබයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.2.1. සේවය ප්‍රතිලාභ

3.2.1.1. නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල්

නිර්ණය කල ප්‍රතිලාභ සැලසුමක් යනු සේවා කාලය අවසානයේ ප්‍රතිලාභ හිමිවන සැළසුමකි. ඒ යටතේ සමාගම තම සේවකයන් වෙනුවෙන් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදලක් ලබාදීම සිදු වන අතර වෙනත් වැඩිපුර ගෙවීමක් සඳහා නෛතික බැඳියාවක් ඇතිවීම සිදු නොවේ. නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ සැළසුම් ක්‍රමයකට කරනු ලබන දායකත්වය සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

සමාගම විසින් සෑම සේවකයකුගේම දළ පාරිශ්‍රමිකයෙන් ගණනය කරනු ලැබූ 12% ක ප්‍රමාණයක් සේවක අර්ථසාදක අරමුදලට හෝ වතු කාර්ය සංගමයට හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක සමිතියට හෝ ගෙවනු ලබයි.

එමෙන්ම සෑම සේවකයකුගේම දළ පාරිශ්‍රමිකයෙන් ගණනය කරනු ලැබූ 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා සමාගම විසින් ගෙවනු ලබයි.

3.2.1.2. නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

වයස, සේවා කාලය හෝ සේවක වන්දි ගෙවීම් වැනි කාරණා එකක් හෝ කිහිපයක් හේතුකොටගෙන සේවය අවසන් වීමේදී සේවකයෙකුට ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය තීරණය කිරීම, නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික ක්‍රමයක් යටතේ සිදුවේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ අවශ්‍යතාවය අනුව සියළුම හිමිකම්ලාභී සේවකයින් සඳහා නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ප්‍රතිලාභ ක්‍රමය සඳහා සම්පූර්ණයෙන්ම අභ්‍යන්තර අරමුදල් යොදවා ඇත.

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වෙන් කිරීම ස්වාධීන සුදුසුකම් ලත් ආයුගණක තක්සේරු ආයතනයක් විසින් සිදුකරයි.

නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්මට අදාලව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුල හඳුනාගනු ලබන වගකීමෙහි ප්‍රමාණය, වාර්තා කරන දිනට නිර්ණය කළ ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකමට හඳුනා නොගත් අතීත සේවා පිරිවැය ගැලපීමෙන් ගණනය කරනු ලබයි. නිර්ණය කළ ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 -විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය හි සඳහන් ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය යොදාගෙන ගණනය කිරීම සිදුකර ඇත.

නිර්ණය කළ ප්‍රතිලාභ වල වර්තමාන අගය ගණනය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා දළ වශයෙන් විශ්‍රාමික ප්‍රතිලාභය හිමිවන කාල පරිච්ඡේදයට දළ වශයෙන් ආසන්න වන කල්පිරීම් කාලයක් සහිත රාජ්‍ය බැඳුම්කර වලට අදාල පොලී අනුපාතය යොදා ගනු ලබයි.

අත්දැකීම් තුලින් සිදුකරන වෙනස්කම් තුල සහ යොදාගනු ලැබූ උපකල්පන වල වෙනස්වීම් තුල ඇතිවන්නා වූ ලාභ/ අලාභ, එම ලාභ/ අලාභ ඇතිවූ කාලපරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායමට ගලපනු ලබයි.

අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලබයි. කෙසේ වෙතත් එසේ සිදු කරනු ලබන්නේ සේවකයින් සේවා කාලය තුල රැඳී සිටින කාලයෙහි (ඉදිරි පවරන ලද කාලය) වෙනස්වීමකට අදාලව එම වෙනස හට නොගන්නේ නම් පමණි. එවැනි අවස්ථාවක අතීත සේවා පිරිවැය ඉදිරි පවරන ලද කාලය පුරා සරළ මාර්ග ක්‍රමය යටතේ ක්‍රමක්ෂය කරනු ලබයි.

කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත අනුව මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පමණි.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා භාවිත කරන ලද මූලික උපකල්පන සටහන් අංක 24 හි දක්වා ඇත.

3.3. ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන්

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමක් මත හට ගෙන ඇති නමුත් ආයතනයේ පාලනයෙන් පරිබාහිර වූ අනාගත අවිනිශ්චිත සිදුවීමක, සිදුවීම හෝ සිදුනොවීම මත ඇතිවිය හැකි වත්කමක් හෝ වගකීමකි. සියළුම ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන් සටහන 29 හි දක්වා ඇත.

3.4. විලම්භිත ආදායම

3.4.1. ප්‍රදාන සහ ආධාර

ප්‍රදාන සහ ආධාර හඳුනා ගැනෙනුයේ අදාල ප්‍රදානය හිමි වන බවට සහතික වීමක් සහ ඒ සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාලිය හැකි බවට තහවුරුවීමෙන් පසුව පමණි. කිසියම් ප්‍රදානයක් වත්කමක් සම්බන්ධයෙන් වන විට අදාල වත්කමේ පිරිවැයෙන් ප්‍රදාන ලෙස ලැබෙන වටිනාකම අඩුකරණු ලැබේ. කිසියම් ප්‍රදානයක් වියදමක් සම්බන්ධයෙන් වන විට එම ප්‍රදානය ඊට අදාල වියදමට අනුකූල වන පරිදි ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.5. විස්තීර්ණ අදායම් ප්‍රකාශය

විස්තීර්ණ අදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රියාත්මක වන ක්‍රමය වඩාත් සාධාරණ බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි අවශ්‍යතාවන්ට අනුකූලව එම ක්‍රමය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇත.

3.5.1. ආදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒම ස්ථිර ලෙස තහවුරු වීම, ආදායම සහ ඊට අදාල වියදම විශ්වාසනීයව හා සාධාරණ ලෙස මැනිය හැකි වීම යන කාරණා දෙකම සංතෘප්ත වන අවස්ථාවක දී පමණක් එම අර්ථික ප්‍රතිලාභය ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරනු ලබයි.

ලැබුනු සහ ලැබිය යුතු වටිනාකම්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම තීරණය කරනු ලබන අතර එහිදී වෙළඳ වට්ටම්, විකුණුම් බදු අඩු කර ශුද්ධ වටිනාකමට ආදායම හඳුනා ගනී. ඊට අමතරව සමාගම තුල සිදුවන අන්තර් විකුණුම් ගනුදෙණු වල වටිනාකම ආදායම් හඳුනා ගැනීමේදී බැහැර කරනු ලබයි. පහත සඳහන් විශේෂ නිර්ණායක ආදායම් හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබයි.

3.5.1.1. භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගෙන ඇත්තේ ඒ සම්බන්ධ විශ්වසනීය සාක්ෂි ඇතිවිට පමණි. එය සාමාන්‍යයෙන් හිමිකාරත්වය තුලින් ඇතිවන අවදානම් සහ ප්‍රතිලාභ ගැණුම්කරු වෙතට මාරුවන ක්‍රියාත්මක විකුණුම් එකඟතාවයක් හරහා වේ. එය සාමාන්‍යයෙන් භාණ්ඩ ගෙනයාම, ප්‍රතිෂ්ඨාව ලැබීමේ හැකියාවක් පැවතීම, අදාල පිරිවැය සහ ප්‍රතිලාභ විශ්වසනීයව ඇස්තමේන්තු කිරීමේ හැකියාවක් පැවතීම, තවදුරටත් එම භාණ්ඩ සම්බන්ධව කළමනාකරණ යොමුවීමක් නොපැවතීම, ආදායම විශ්වසනීයව මිණිය හැකිවීම යන කාරණා මත තීරණය වේ. ආදායම ඉන්වොයිස් වටිනාකමට හඳුනාගනු ලබයි.

3.5.1.2. පොලී ආදායම

අයකර ගැනීම සැක සහිත නොවේ නම් පොලී ආදායම උපචිත වශයෙන් හඳුනාගැනේ.

3.5.1.3. ඉවත් කිරීම් වලින් ලැබෙන ලාභ හෝ අලාභ

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් ආදායම සංසන්දනය කිරීමෙන් නිර්ණය කරන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දැක්වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.5.2. වියදම් හඳුනාගැනීම

3.5.2.1. මෙහෙයුම් වියදම්

ව්‍යාපාරික කටයුතු තුල එදිනෙදා සිදුවන මෙහෙයුම් ක්‍රියාවලියේදී කරනු ලබන වියදම් සහ දේපල පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී වැයවන සියළු වියදම් මූල්‍ය වර්ෂයේ ලාභ/ අලාභ ගණනය කිරීම සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ. මූල්‍ය නොවන වත්කම්, මන්දගාමී සංසරණයක් සහිත තොග, ප්‍රමාණය ඉක්මවා වැඩුනු පැළතවාන් ඇතුලු දේපල පිරියත සහ උපකරණ සම්බන්ධ සියළු වගකීම් සහ ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

3.5.2.2. මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය සඳහා පොලී වියදම් සහ මෙහෙයුම් කල් බදු යටතේ සිදුකල ගෙවීම් ඇතුළත් වේ.

වත්කම් අත්පත් කරගැනීම හෝ සුදුසුකම්ලත් වත්කම් නිෂ්පාදනයට හෝ ඉදිකිරීමට හෝ අදාල සඵල පොලී අනුපාතික ක්‍රමය යටතේ හඳුනාගනු ලබන මූල්‍ය පිරිවැය හැර අනෙකුත් මූල්‍ය වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් සරල මාර්ග ක්‍රමය යටතේ බදු කාලසීමාව පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

3.5.2.3. බදු වියදම

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්භිත බදු වලින් සමන්විත වේ.

ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

3.5.2.3.1. ප්‍රවර්තන බද්ද

ප්‍රවර්තන වර්ෂයේ සහ සංසන්දනාත්මක වර්ෂයේ (පෙර වර්ෂයේ) වර්තමාන බදු වියදම, 2006 අංක 10 දරණ ආදායම් බදු පනත සහ ඊට අදාලව පසුව නිකුත් කර ඇති සංශෝධන වලට අනුකූලව ගණනය කරනු ලබයි. ඒ අනුව අදාල වර්ෂයේ බදු වන ආදායමට එරෙහිව දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවූ හෝ ගෙවිය යුතු බද්ද වර්තමාන බදු වියදම ලෙස හඳුනා ගැනේ.

3.5.2.3.2. විලම්භිත බදුකරණය

විලම්භිත බදු වගකීම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීම් ක්‍රමය භාවිතා කරමින් හඳුනා ගනු ලබයි. මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කරනු ලබන වත්කම් සහ වගකීම් වල ධාරණ අගය සහ බදුකරණයේ දී යොදා ගනු ලබන බදු පදනම අනුව එම වත්කම් සහ වගකීම් වල ධාරණ අගය අතර පවතින තාවකාලික වෙනස සම්බන්ධයෙන් විලම්භිත බදු ගණනය කරනු ලබයි.

පහත සඳහන් තාවකාලික වෙනස් වීම් සඳහා විලම්භිත බදු ගණනය කිරීම සිදු නොකරයි: 1. ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් හැර ගිණුම්කරණ හෝ බදුමය ලාභය/ අලාභය හෝ කෙරෙහි බලපෑමක් ඇති නොකරණ ගනුදෙණුවකින් හට ගන්නා වත්කමක හෝ වගකීමක පළමු හඳුනාගැනීම විලම්භිත බදු ගණනය කිරීම සිදු නොකරයි. 2. උප සමාග මක් හෝ සාමූහිකව පරිපාලනය කරනු ලබන ව්‍යාපාරයකට අදාලව කරනු ලබන ආයෝජනයක් හා සම්බන්ධ වෙනසක් (එම වෙනස දුරදක්නා අනාගත කාලයකදී ආපසු හැරවීමක් සිදු නොවේයැයි සාධාරණව විශ්වාස කළ හැකි විට) සඳහා විලම්භිත බදු ගණනය කිරීම සිදු නොකරයි. 3. පළමුව හඳුනා ගනු ලබන කීර්තිනාමයක් සම්බන්ධව බදුවන තාවකාලික වෙනස්වීමකට අදාලව විලම්භිත බදු ගණනය කිරීම සිදු නොකරයි.

තාවකාලික වෙනස්කම් සම්බන්ධ විලම්භිත බදු ගණනය කිරීම සඳහා එම තාවකාලික වෙනස්කම් ආපසු හැරවෙන/ ප්‍රතිවර්තවන අවස්ථාවේදී අදාල යන බදු ප්‍රතිශතය යොදා ගනී.

භාවිතා නොකරන ලද බදු අලාභයන්, බදු බැරකම් සහ අඩු කල හැකි තාවකාලික වෙනසක්ම් සම්බන්ධව විලම්භතී බදු වතක්ම් ලෙස හඳුනාගැනේ. කෙසේ වෙතත්, මෙම විලම්භිත බදු වත්කමක් හඳුනාගනු

ලබන්නේ එය උපලබ්ධි කර ගත හැකි බදු වන ලාභයක් දුර දක්නා අනාගත කාලයක් තුල ඇති විය හැකි බව විශ්වාසනීයව තහවුරු වන්නේ නම් පමණි විලම්භිත බදු වත්කම් සෑම වාර්තා කරන දිනකදීම සමාලෝචනය කරන අතර එය අනාගතයේ උපලබ්ධි වන බදු ප්‍රතිලාභයේ ප්‍රමාණය යටත්ව ගැලපීමට කටයුතු කරයි.

ප්‍රවර්තන බදු වත්කම් සහ බදු වගකීම් එකිනෙකට හිලව් කිරීමට හැකි බලාත්මක නීතිමය අයිතියක් පවතින්නේ නම් හා විලම්භිත බද්ද එකම ඒකකයක් සහ අධිකාරියක් වෙනුවෙන් වන විටක, විලම්භිත බදු වත්කම්, විලම්භිත බදු වගකීමට හිලව් කිරීම සිදුකරනු ලබයි.

විලම්භිත බදුකරණයට අදාල තොරතුරු ගිණුම්කරණ සටහන් හි දක්වා ඇත.

3.6. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කරනු ලබයි. බදු වාරික ගෙවීම, ලාභාංශ ගෙවීම සහ ප්‍රදාන හා ආධාර ලැබීම් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද ලැබූ පොලී හා ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද වර්ගීකරණය කර ඇත.

3.7. කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමාන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

3.8. වාර්තා කරන දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු සිදුවීම් යනු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනය හා මූල්‍ය වාර්තා නිකුත් කිරීම සඳහා අනුමත කරන ලද දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම්ය.

වාර්තා කරන දිනට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට හෝ කටයුතු කර ඇත.

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

		2016 රු.	2015 රු.
4	**ආදායම්**		
	පොල් (සටහන් 04.1)	413,661,122	442,113,846
	රබර් (සටහන් 04.2)	29,902,334	30,606,278
	රඹුටන්	6,151,698	4,087,610
	ගම්මිරිස්	5,435,210	1,461,660
	කජු	6,107,902	2,034,769
	අඹ	1,769,494	2,526,435
	විසිතුරු පත්‍ර සහ පැළ	5,378,131	4,140,575
	වෙනත්	3,568,179	5,169,230
		471,974,070	492,140,403
4.1	**පොල් ආදායම**		
	ගෙඩි පොල්	390,091,817	432,980,437
	බීජ පොල්	11,430,920	-
	පොල් තෙල්	6,948,260	9,133,409
	කොප්පරා	5,190,126	-
		413,661,122	442,113,846
	නිෂ්පාදනය (ගෙඩි)	16,652,531	14,067,173
	විකුණුම් (ගෙඩි)	16,739,571	14,167,242
	ශුද්ධ විකුණුම් සාමාන්‍ය (ගෙඩි 1000 කට)	24,712	31,207
	විකුණුම් පිරිවැය (ගෙඩි 1000 කට)	15,254	18,503
	ලාභය (ගෙඩි 1000 කට)	9,458	12,704
4.2	**රබර් ආදායම**		
	දුම් ගැසූ රබර් ෂීට්	5,563,765	-
	රබර් කිරි	22,774,720	29,189,899
	ඔට්ටුපාලු සහ වෙනත්	1,563,850	1,416,379
		29,902,334	30,606,278
	නිෂ්පාදනය (කි. ග්‍රෑ.)	144,376	140,678
	විකුණුම් (කි. ග්‍රෑ.)	141,837	140,245
	ශුද්ධ විකුණුම් සාමාන්‍ය (කි. ග්‍රෑ. 1 කට)	211	218
	විකුණුම් පිරිවැය (කි. ග්‍රෑ. 1 කට)	328	267
	ලාභය (කි.ග්‍රෑම් 1 කට)	(117)	(49)

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

		2016 රු.	2015 රු.
5	**විකුණුම් පිරිවැය**		
	පොල්	255,344,179	262,136,535
	රබර්	47,296,161	37,551,747
	රඹුටන්	1,236,467	1,163,883
	ගම්මිරිස්	2,118,916	630,147
	කජු	1,967,027	1,482,611
	අඹ	1,442,534	896,662
	විසිතුරු පත්‍ර සහ පැළ	6,056,475	7,834,008
	වෙනත්	4,495,541	4,948,061
		319,957,299	316,643,654
6	**අනෙකුත් මෙහෙයුම් ආදායම්**		
	පොල් ගස් විකිණීමෙන් ලද ලාභය (සටහන 6.1)	34,469,384	34,925,181
	රබර් ගස් විකිණීමෙන් ලද ලාභය (සටහන 6.2)	4,244,065	4,380,317
	දේපල පිරියත උපකරණ විකිණීම / ඉවත්කිරීම මත ලාභ / අලාභ	-	(1,054,006)
	වටිනාකම වෙනස්වීම මත ලාභ / අලාභ - පාරිභෝජ්‍ය ජෛව වත්කම්	19,484,346	43,920,609
	පොල් ලෙලි විකුණුම්	16,801,241	21,146,756
	අයකරන ලද ප්‍රමාද ගාස්තු - පොල්	10,490,117	5,124,795
	කුලී සහ පහසුකම් ගාස්තු ආදායම	5,206,259	4,512,441
	ආපසු ලියා හැරීම/(ලියා හැරීම)	1,791,916	1,351,194
	වැලි	977,124	3,984,481
	වෙනත් ආදායම්	3,219,002	3,441,413
		96,683,454	121,733,181

6.1 2016 වර්ෂය තුලදී ඉවත් කරන ලද පොල් ගස්වල පිරිවැය (රු. 803,466) සහ ක්‍රමක්ෂය (රු. 657,248) ගැලපීම් කර ඇත.

6.2 2016 වර්ෂය තුලදී ඉවත් කරන ලද රබර් ගස්වල පිරිවැය (රු.209,249) සහ ක්‍රමක්ෂය (රු.153,452) ගැලපීම් කර ඇත.

		2016 රු.	2015 රු.
7	**පරිපාලන හා පොදු වියදම්**		
	වැටුප් වේතන සහ ඒ ආශ්‍රිත වියදම්	74,297,931	84,193,373
	නඩත්තු සහ අලුත්වැඩියා වියදම්	10,396,329	11,957,144
	වෙනත් පරිපාලන වියදම්	34,960,872	36,786,722
		119,655,132	132,937,239
	මෙහෙයුම් කටයුතුවලින් වූ ලාභ ගණනය කිරීමේදී පහත වියදම් අඩුකර ඇත.		
	අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	5,405,016	4,390,964
	ව්‍යවස්ථාපිත විගණනයට අදාල විගණන ගාස්තු - 2016	575,000	-
	ව්‍යවස්ථාපිත විගණනයට අදාල විගණන ගාස්තු - 2015	563,730	-
	පරිත්‍යාග	791,286	4,133,752
	ක්ෂය / ක්‍රමක්ෂය		
	බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම්	2,621,779	3,169,957
	නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර)	4,324,152	4,841,977

		2016 රු.	2015 රු.
	එලදරණ ජෛව වත්කම්	10,374,106	9,516,970
	දේපල, පිරියත හා උපකරණ	39,980,330	40,456,054
	පුද්ගල පිරිවැය		
	නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික	19,651,574	23,787,118
	නිර්ණය කල දායකත්ව සැලසුම් පිරිවැය - සේ.අ.අ සහ සේ. භා. අ.	30,737,059	25,207,897
	කාර්ය සාධන දිරිදීමනා	18,031,000	25,203,842
	ප්‍රසාද දීමනා	10,732,681	11,297,741
	නිවාඩු දීමනා	4,182,727	6,431,144
	වෛද්‍ය නිවාඩු	3,828,489	3,893,848
	වැටුප් සහ වේතන	222,391,933	201,000,848

8	**ශුද්ධ මූල්‍ය ආදායම / වියදම**		
8.1	**මූල්‍ය ආදායම්**		
	කාලීන තැන්පතු මත පොලී	37,763,823	25,798,714
	භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීම් මත පොලී (සටහන් 8.1.1)	1,366,273	727,789
	සේවක ණය මත පොලී	573,773	549,813
	කලින් ගෙවූ සේවක ප්‍රතිලාභ	779,453	1,032,463
		40,483,322	28,108,779
8.2	**මූල්‍ය වියදම්**		
	කල්බදු පොලී	24,658,296	25,393,663
	තාවකාලික බැංකු ණය පොලී	-	52,397
	සේවක ණය ක්‍රමක්ෂයවීම්	779,453	1,032,463
		25,437,749	26,478,523
		15,045,573	1,630,256

8.1.1 රජයේ සුරැකුම්පත් සම්බන්ධ ද්විතීක වෙළඳ පොළ ගණුදෙනු මත වූ කාල්පනික රදවා ගැනීම් බදු බැරකම

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ ද 137 වගන්තිය ප්‍රකාරව කිසියම් සමාගමක් රාජ්‍ය සුරැකුම් ආශ්‍රිත ද්විතීය වෙළෙඳ පොළ ගණුදෙනු සිදු කිරීම මඟින් පොලී ආදායමක් උපයයිනම් කාල්පනික රදවාගත් බද්ද අදාල බදු වර්ෂයේදී සමාගමේ ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් බවට පත් වේ.
ඒ අනුව වසර 2015 දී රජයේ සුරැකුම් සම්බන්ධ ද්විතීය වෙළෙඳ පොළ ගණුදෙනු වලින් උපයා ගත් ශුද්ධ පොලී ආදායම, මූල්‍ය ප්‍රකාශයන්හි දළ පොලී ආදායම ලෙසට හඳුනාගැනිම සඳහා ශුද්ධ පොලී ආදායමෙන් 1/9 වන රුපියල් 136,627/= ක කාල්පනික රදවාගත් බද්ද එකතු කර දක්වා ඇත.

9 ආදායම් බදු වියදම්

9.1 ප්‍රවර්තන බදු වියදම්

2006 අංක 10 දරණ ආදායම් පනතේ 48 (අ) වගන්තිය 2011 අංක 22 දරණ ආදායම් බදු පනතෙහි 16 වන වගන්තියෙන් සංශෝධනය කර ඇති අතර ඒ අනුව කෘෂිකාර්මික කටයුත්තක් තුලින් ඉපැයූ ලාභ සහ ආදයම් එම පනතේ පළමු උපලේඛණයට අනුව 10% බදු අනුපාතයට යටත් වේ. අනෙකුත් ලාභ සාමාන්‍ය අනුපාතය යටතේ බද්දට යටත් වේ.

ප්‍රවර්තන ආදායම් බදු වියදම් (සටහන 9.2)	5,745,693	-
විලම්භිත බදු වියදම (9.3 සහ 25)	11,767,679	10,807,068
	17,513,372	10,807,068

		2016 රු.	2015 රු.
9.2	**ගිණුම්කරණ ලාභය ප්‍රවර්තන බදු වියදම සමඟ සැසඳීම**		
	බදුවලට පෙර ගිණුම්කරණ ලාභය (සටහන 9.2.1)	144,090,665	165,922,947
	අනෙකුත් ප්‍රභවයන් ගෙන් ලද ආදායම් හා බද්දෙන් නිදහස් ආදායම්	(60,165,339)	(69,860,919)
		83,925,326	96,062,028
	අඩු කිරීමට ඉඩ නොදෙන අයිතමයන්ගේ එකතුව	78,162,484	86,346,028
	අඩු කිරීමට ඉඩ දෙන අයිතමයන්ගේ එකතුව	(150,183,069)	(170,210,322)
	ගලපන ලද ව්‍යාපාර ලාභය	11,904,741	12,197,734
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම	39,703,870	27,076,315
	මුළු ව්‍යවස්ථාපිත ආදායම	51,608,611	39,274,049
	සුදුසුකම් ලද ගෙවීම්	(31,088,278)	(39,274,049)
	බදු අයකළ හැකි ආදායම	20,520,333	-
	කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මත බද්ද 10%	-	-
	වෙනත් ආදායම් මත බද්ද 28%	5,745,693	-
	වාර්ෂික ලාභය මත ආදායම් බද්ද	5,745,693	-

9.3 විලම්භිත බදු

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සහ බදු කරණයේදී, වත්කම් හා වගකීම් වල ශුද්ධ ධාරණ අගය ලෙස යොදාගන්නා වටිනාකම්වල තාවකාලික වෙනසක් පවතින අතර එම තාවකාලික වෙනස සඳහා වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වගකීම ගණනය කරනු ලබයි. එය සටහන් අංක 26 දක්වා ඇත. විලම්භිත බදු වගකීමෙහි ඇතිවන්නා වූ වෙනස වසර තුලදී මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනා ගැනේ. සමාගමේ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් 10% ක බදු අනුපාතයක් යටතේ හා වෙනත් ආදායම් 28% ක බදු අනුපාතයක් යටතේ බදුවන අතර සාමාන්‍ය බදු අනුපාතය 19% ක් වේ. සඵල බදු අනුපාතය 4% ක් පමණ වේ. විලම්භිත බදු ගණනය කිරීම සඳහා සාමාන්‍ය බදු අනුපාතය හෝ සඵල බදු අනුපාතය යොදා ගැනීම සාධාරණ නොවන අතර එබැවින් 10% ක බදු අනුපාතය යොදා ගනිමින් විලම්භිත බදු ගණනය කර ඇත.

පහත ප්‍රභවයන්ගෙන් පැන නැගුනු විලම්භිත බදු වියදම්/ (ආදායම්)		
දේපල, පිරියත හා උපකරණ	(1,328,028)	(1,302,760)
එලදරණ ජෛව වත්කම්	(6,596,553)	(8,042,687)
පාරිභෝජ්‍ය ජෛව වත්කම්	(301,886)	(794,862)
බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	248,227	25,268
නිර්නය කල සේවක ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික	(3,789,439)	(692,027)
	(11,767,679)	(10,807,068)

10 කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමාන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

10.1 කොටසක ප්‍රාථමික ඉපයුම

සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි ලාභය (රු.)	126,577,293	155,910,741
බර තබන ලද සාමාන්‍ය කොටස් ගණන	20,000,001	20,000,001
කොටසක ඉපැයුම (රු. ශත)	6.33	7.80

10.2 කොටසක තනුක ඉපයුම

2015 දෙසැම්බර් 31 වන දින වන විට සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කළ හැකි කොටස් සමාගම විසින් නිකුත් කර නොමැති හෙයින් කොටසක තනුක ඉපයුම, කොටසක ප්‍රාථමික ඉපයුමට සමාන වේ.

11 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම්

11.1 1992 ජූනි 18 වන දින සමාගම ස්ථාපනය කිරීමේදී සියළු බදු ඉඩම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ කඩිනම් වැඩ පැවරුම් බලකාය විසින් ලබාදුන් රීතීන් අනුව පොත්වලට ඇතුලත් කර ඇත. ඒ අනුව තක්සේරුකරණය සම්බන්ධ විශේෂඥයෙකු වන ඩී. ආර්. වික්‍රමසිංහ මහතා විසින් සමාගම පිහිටුවීමට පෙර ඊට ආසන්නයේ ලබා දී තිබූ වටිනාකමට මෙම බදු ඉඩම් ප්‍රත්‍යාගණනය කර පොත්වලට ඇතුලත් කළයුතු බවට 1995 මාර්තු 08 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව 1992 ජූනි 18 වන දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තා කළ ප්‍රත්‍යාගණනිත වටිනාකම රුපියල් 189,234,932 කි. එම වත්කම් වල ධාරණ අගය සටහන් අංක 11.3 හි දක්වා ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS/ SLFRS) හඳුන්වාදීමත් සමග කඩිනම් වැඩ පැවරුම් බලකාය (UITF) විසින් නිකුත් කර තිබූ රීතීන් අහෝසි කර, 2012 දෙසැම්බර් 19 වන දින "බදු අයිතිය යටතේ ඇති ඉඩම් සම්බන්ධව නිර්දේශිත භාවිතයන් පිළිබඳ ප්‍රකාශය (SORP), නිකුත් කර ඇත. එම ප්‍රකාශය අනුව බදු අයිතිය යටතේ ඇති ඉඩම් තවදුරටත් ප්‍රත්‍යාගණනය කිරීමට ඉඩදෙනු නොලබයි.

11.2 ජනවසම සතුව පැවති වතු 13 ක් සමාගමට බාර දුන් නමුදු ඉන් වතු 05 ක පමණක් බදු ගිවිසුම් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වතු 08 හි (දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පල, කුරුණෑගල, මහයාය, නාරම්මල සහ වාරියපොල) බදු ගිවිසුම් සම්පූර්ණ කළ යුතුව ඇත. මෙම බදු ගිවිසුම් ජූනි 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකස් කර ඇත. බදු ගිවිසුම් සම්පූර්ණ නොවූ වතු වෙනුවෙන් සමාගම හා ජනවසම අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. මෙය ජනවසම හා සමාගම අතර ඇති වලංගු ගිවිසුමක් ලෙස ක්‍රියාකරයි.

11.3 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් (වසර 53)

	රු.
පිරිවැය	
1992.06.18 වන දිනට ප්‍රාග්ධනිත වටිනාකම	189,234,932
1992.06.18 සිට 2003.12.31 දක්වා වත්කමෙහි පරිපාලන අයතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් - 2004 වර්ෂයේදී ගැලපීම් කර ඇත.	(21,227,380)
2016.12.31 වන දිනට ශේෂය	168,007,552
2004.01.01 සිට 2016.12.31 දක්වා වත්කමෙහි පරිපාලන අයතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් - 2016 වර්ෂයේදී ගැලපීම් කර ඇත.	(29,358,787)
2016.12.31 වන දිනට ශේෂය	138,648,765
ක්‍රමක්ෂය	
2015.01.01 දිනට සමුච්ජිත ක්‍රමක්ෂය	71,449,891
2015 වසරට අදාල ක්‍රමක්ෂය	3,169,957
2015.12.31 දිනට සමුච්ජිත ක්‍රමක්ෂය	74,619,848
2016 වසරට අදාල ක්‍රමක්ෂය	2,621,779
,2004.01.01 සිට 2016.12.31 දක්වා වත්කමෙහි පරිපාලන අයතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් ,	(13,045,487)
2016.12.31 වන දිනට ශේෂය (සටහන - අ)	64,196,140
ලියා හරින ලද වටිනාකම	
2015.12.31 දිනට	93,387,704
2016.12.31 දිනට	74,452,625
1992.06.18 වන දිනට ශේෂය	189,234,932
1992.06.18 සිට 2003.12.31 දක්වා වත්කමෙහි පරිපාලන අයතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් - 2004 වර්ෂයේදී ගැලපීම් කර ඇත.	(21,227,380)
,2004.01.01 සිට 2016.12.31 දක්වා වත්කමෙහි පරිපාලන අයතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් - 2016 වර්ෂයේදී ගැලපීම් කර ඇත.	(29,358,787)
2016.12.31 වන දිනට ශේෂය	138,648,765
සටහන - අ	
1992.06.18 සිට 2045.06.17 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන	19,358
1992.06.18 සිට 2016.12.31 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන	8,963
2016.12.31 වන දිනට ක්‍රමක්ෂය (138,648,765 / 19,358 x 8,963)	64,196,140

12 නිශ්චල බදු දේපළ (හිස් ඉඩම් හැර)

සටහන 11හි විස්තර කර ඇති පරිදි, ජනවසමෙන් බාර දුන් සියලුම වතුවල බදු ගිවිසුම් සම්පූර්ණ වී නොමැති වුවත් වරලත් ගණකාධිකාරි ආයතනයේ කඩිනම් වැඩ පැවරිලි බලකායේ නියමයන්ට අනුකූලව, මූල්‍ය කල් බදු යටතේ ඇති වතුවල සියළුම වත්කම් 1992 ජුනි 18 වන දින සිට බලපාන පරිදි සමාගමේ පොත් වල ඇතුළත් කර ඇත. මෙම කාර්ය සඳහා එම වත්කම් සමාගමේ පොත්වල වාර්තා කළ යුත්තේ, එම වත්කම් ජනවසම පොත් වල පෙන්වන පොත් අගයටය යන්න 1995 මාර්තු මස 8 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි 18 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පහත දැක්වෙන පරිදි සටහන් කර ඇත.

ප්‍රත්‍යාගණනය	ඵලදායී අයුකාලය අවුරුදු	1992.06.18 දිනට	මාරු කිරීම්	පරිපාලන අයිතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් ගැලපුම් වර්ෂය 2004	2015.12.31 වන දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.
ඉඩම් සංවර්ධන පිරිවැය	30	1,127,305		(4,000)	1,123,305
ගොඩනැගිලි	25	22,130,873		(4,437,121)	17,693,752
යන්ත්‍රෝපකරණ	15	34,841		-	34,841
මේරූ වගාවන්	30	43,001,122	90,335,750	(10,433,369)	122,903,503
නොමේරූ වගාවන්		90,647,222	(90,335,750)	(311,472)	-
		156,941,363	-	(15,185,962)	141,755,401

වත්කම් වල ධාරණ අගය පහත පරිදි වේ

ප්‍රත්‍යාගණනය

	2016.01.01 වන දිනට ශේෂය		පරිපාලන අයිතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම්	2016.12.31 වන දිනට ශේෂය
	රු.		රු.	රු.
ඉඩම් සංවර්ධන පිරිවැය	1,123,305	-	-	1,123,305
ගොඩනැගිලි	17,693,752	-	-	17,693,752
යන්ත්‍රෝපකරණ	34,841	-	-	34,841
මේරූ වගාවන්	122,903,503	-	(16,579,977)	106,323,526
	141,755,401	-	(16,579,977)	125,175,424

ක්‍රමක්ෂය

	2016.01.01 වන දිනට ශේෂය	වසරට අදාල ක්‍රමක්ෂය	පරිපාලන අයිතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම්	2016.12.31 වන දිනට ශේෂය
ඉඩම් සංවර්ධන පිරිවැය	881,410	37,472	-	918,882
ගොඩනැගිලි (සටහන අ)	16,660,244	707,963	-	17,368,207
යන්ත්‍රෝපකරණ	34,841	-	-	34,841
මේරූ වගාවන් (සටහන ආ)	83,451,082	3,578,717	(12,197,656)	74,832,143
	101,027,577	4,324,151	(12,197,656)	93,154,072

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

ධාරණ අගය	2016.01.01 වන දිනට ශේෂය රු.	2016.12.31 වන දිනට ශේෂය රු.
ඉඩම් සංවර්ධන පිරිවැය	241,895	204,423
ගොඩනැගිලි (සටහන අ)	1,033,508	325,545
යන්ත්‍රෝපකරණ	-	-
මේරූ වගාවන්	39,452,421	31,491,383
	40,727,824	32,021,352

ජනවසම මගින් බාරදුන් වතුවල ඒ වනවිට පැවති නොමේරූ වගාවන් සඳහා කර තිබූ ප්‍රාග්ධන ආයෝජන වියදම් 1992.06.18 දිනට වූ ප්‍රත්‍යාගණනිත අගයට නොමේරූ වගාවන් යටතේ පෙන්වා ඇත. ඉන් අනතුරුව මෙම වගාවන් ඵලදරණ තුරු දරන ලද ප්‍රාග්ධන ආයෝජන වියදම් සටහන අංක 13 (අ) හි දක්වා ඇත. මෙම වගාවන් ඵලදරණ/ පරිණත වගාවන් තත්ත්වයට පත් වූ විට එම වගාවන් එම තත්ත්වයට ගෙන ඒම දක්වා දරණ ලද සටහන අංක 13 (අ) හි නොමේරූ වගාවන් යටතේ පෙන්වා ඇති පිරිවැය එම සටහන යටතේ මේරූ වගාවන් ගණයට මාරු කර ඇත. ඊට අනුරූපිතව මෙම සටහනෙහි නොමේරූ වගාවන් යටතේ එම වගාවන් සම්බන්ධයෙන් වන යම් පිරිවැයක් වෙතොත් එය මෙම සටහනේම මේරූ වගාවන් යටතට මාරු කිරීම සිදු කර ඇත.

සටහන අ - ගොඩනැගිලි	
1992.06.18 සිට 2045.06.17 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන (වසර 25)	9,131
1992.06.18 සිට 2016.12.31 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන	8,963
2016.12.31 වන දිනට ක්‍රමක්ෂය (16,484,018 / 9,131 × 8,963)	17,368,207

සටහන ආ - මේරූ වගාවන්	
පිරිවැය	
1992.06.18 වන දිනට මේරූ වගාවන්	
1992.06.18 වන දිනට ශේෂය	43,001,122
පරිපාලන අයිතිය වෙනස්වීම තුල හඳුනාගත් බැහැර කිරීම් 1992.06.18 සිට 2016.12.31 දක්වා	(6,979,587)
2016.12.31 දක්වා ඉවත් කරන ලද පොල් ගස් වල වටිනාකම (ඉඩම් බැහැර කිරීමේදී ඉවත් වූ ගස් හැර)	(10,102,690)
	25,918,845
මේරූ වගාවන් යටතට මාරු කර ඇති 1992.06.18 වන දිනට පැවති නොමේරූ වගාවන්	
1992.06.18 වන දිනට ශේෂය	90,647,222
පරිපාලන අයිතිය වෙනස්වීම තුල බැහැර කිරීම් ලෙස හඳුනාගත් නොමේරූ අවධියේ පැවති වගාවන්	(311,472)
පරිපාලන අයිතිය වෙනස්වීම තුල බැහැර කිරීම් ලෙස හඳුනාගත් මේරූ වගාවන් යටතට මාරුකළ නොමේරූ වගාවන්	(8,730,966)
2016.12.31 දක්වා ඉවත් කරන ලද රබර් ගස් වල වටිනාකම (ඉඩම් බැහැර කිරීමේදී ඉවත් වූ ගස් හැර)	(1,200,102)
2016.12.31 වන දිනට ශේෂය	80,404,681
2016.12.31 වන දිනට මේරූ වගාවන්	106,323,526
ක්‍රමක්ෂය	
1992.06.18 වන දිනට මේරූ වගාවන්	
1992.06.18 සිට 2022.06.17 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන (වසර 30)	10,957
1992.06.18 සිට 2016.12.31 දක්වා කාල පරිච්ඡේදයට දින ගණන	8,963
2016.12.31 වන දිනට ක්‍රමක්ෂය (25,918,845 / 10,957 × 8,963)	21,202,026

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

මේරූ වගාවන් යටතට මාරු කර ඇති 1992.06.18 වන දිනට පැවති නොමේරූ වගාවන්

ඵලදායී ජීවිත කාලය වසර 30

මාරු කර කරන ලද වර්ෂය	විස්තරය	බැහැර කරන ලද දිනය	පිරිවැය			ක්‍රමක්ෂය
			1992.06.18 වන දිනට ශේෂය	බැහැර කිරීම්	2016.12.31 වන දිනට ශේෂය	2016.12.31 වන දිනට ශේෂය
31/12/1994	නොමේරූ වගාවන්ගේ වටිනාකම		37,756,930			
	බැහැර කිරීම් - කොරකහ - නොමේරූ අවධියේ පැවති වගාවන්			(311,473)		
	බැහැර කිරීම් - මහයාය	7/8/1997		(2,957,425)		
	බැහැර කිරීම් - මල්වත්ත	7/8/1997		(355,313)		
	බැහැර කිරීම් - අම්බන (රබර්)	10/9/1994		(223,374)		
	බැහැර කිරීම් - සූරියපුර	6/6/2000		(92,705)		
	බැහැර කිරීම් - පොල්ගම්මන	1/1/2016		(322,347)		
	බැහැර කිරීම් - පොල්ගම්මන	1/1/2016		(410,721)		
	බැහැර කිරීම් - රබර් ගස් - 2013 - 2015	1/1/2016		(990,854)		
	බැහැර කිරීම් - රබර් ගස් - 2016	31/12/2016		(209,249)		
			37,756,930	(5,873,461)	31,883,469	23,381,598
31/12/1995	නොමේරූ වගාවන්ගේ වටිනාකම		8,429,585			
	බැහැර කිරීම් - මාවතගම	15/8/1997		(493,832)		
	බැහැර කිරීම් - වල්බෝතලේ	31/5/2011		(721,401)		
			8,429,585	(1,215,232)	7,214,353	5,050,310
31/12/1996	නොමේරූ වගාවන්ගේ වටිනාකම		12,394,880	-	12,394,880	8,263,630
31/12/1997	නොමේරූ වගාවන්ගේ වටිනාකම		8,045,288			
	බැහැර කිරීම් - මාවතගම	15/8/1997		(412,325)		
	බැහැර කිරීම් - පන්නල	9/4/1999		(748,578)		
	බැහැර කිරීම් - පෙතියාකන්ද	6/6/2000		(242,922)		
			8,045,288	(1,403,825)	6,641,463	4,206,604
31/12/1998	නොමේරූ වගාවන්ගේ වටිනාකම		9,962,094			
	බැහැර කිරීම් - පොල්ගම්මන	1/1/2016		(684,684)		
			9,962,094	(684,684)	9,277,410	5,566,615
31/12/1999	නොමේරූ වගාවන්ගේ වටිනාකම		8,676,654			
	බැහැර කිරීම් - මාවතගම	15/8/1997		(420,467)		
	බැහැර කිරීම් - පොල්ගම්මන	1/1/2016		(604,222)		
			8,676,654	(1,024,689)	7,651,965	4,336,439
31/12/2000	නොමේරූ වගාවන්ගේ වටිනාකම		4,666,747			
	බැහැර කිරීම් - පොල්ගම්මන	1/1/2016		(40,648)		
			4,666,747	(40,648)	4,626,099	2,467,365
31/12/2001	නොමේරූ වගාවන්ගේ වටිනාකම		715,044		715,044	357,555
			90,647,222	(10,242,540)	80,404,682	53,630,117
ක්‍රමක්ෂය - 2016.12.31 වන දිනට මේරූ වගාවන්						74,832,143

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

13 (අ) ඵලදරණ ජෛව වත්කම්

ආරම්භයේ සිටම දිගුකාලීන වගාවන් සඳහා කරන ලද ප්‍රාග්ධන වියදම් සම්බන්ධ විස්තර පහත වේ. බදු ගිවිසුම යටතේ අත්පත් කර ගත් වත්කම් (වගාවන්ද ඇතුලත්ව) සටහන් අංක 11 සහ 12 ඇතුළත් කර ඇත. ජනවසමින් බදු පදනම යටතේ සමාගමට පැවරුන නොමේරූ වගාවන් වෙනුවෙන් ඉන්පසුව දරණ ලද ආයෝජන වියදම් මෙම සටහන යටතේ පෙන්වා ඇත. මෙම වගාවන් අත්වූ දිනයේ සිට ඵලදරණ තෙක් දරණ ලද නොමේරූ වගාවන් යටතේ ඇති අතිරේක ආයෝජන වියදම් ප්‍රමාණය මෙම වගාවන් ඵලදරණ/ පරිනත තත්ත්වයට පත්වීමේදී මේරූ වගාවන් යටතට මාරුකර ඇත. ඊට අනුරූපීතව සටහන් අංක 12 හි (ජනවසමෙන් බද්දට ගත් නිශ්චල වත්කම්) නොමේරූ වගාවන් යටතේ එම වගාවන්ට අදාල පිරිවැයක් වේනම් එය එම සටහනෙහි මේරූ වගාවන් යටතට මාරුකිරීම සිදුකර ඇත.

නොමේරූ ජෛව වත්කම්

	පොල්	රබර්	කජු	කුරුඳු	රඹුටන්	වෙනත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය							
2016/01/01 දිනට ශේෂය	383,384,769	54,283,902	10,054,347	6,182,988	2,265,624	17,922,608	474,094,238
වර්ෂය තුළ එකතු කිරීම්	71,739,291	6,882,176	888,717	1,270,571	1,176,740	5,904,524	87,862,019
වර්ෂය තුළ මාරුකිරීම්	(66,349,953)	-	(7,051,670)	(2,840,935)	(781,343)	(4,435,998)	(81,459,899)
වර්ෂය තුළ ඉවත් කිරීම්		-	-	-	-	-	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	388,774,106	61,166,078	3,891,394	4,612,624	2,661,021	19,391,134	480,496,358

මේරූ ජෛව වත්කම්

පිරිවැය	පොල්	රබර්	කජු	කුරුඳු	රඹුටන්	වෙනත්	එකතුව
ඵලදායී ජීවිත කාලය	**වසර 50**	**වසර 20**	**වසර 20**	**වසර 20**	**වසර 20**		
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2016/01/01 දිනට ශේෂය	315,005,376	54,562,740	10,261,219	2,468,600	1,926,783	18,172,161	402,396,879
වර්ෂය තුළ මාරුකිරීම්	66,349,953	-	7,051,670	2,840,935	781,343	4,435,998	81,459,899
වර්ෂය තුළ ඉවත් කිරීම්	(14,778,855)	-	-	-	-	-	(14,778,855)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	366,576,474	54,562,740	17,312,889	5,309,535	2,708,126	22,608,159	469,077,923
ක්‍රමක්ෂය							
2016/01/01 දිනට ශේෂය	57,566,103	27,286,559	1,651,545	1,843,270	568,172	1,623,124	90,538,773
වර්ෂයේ වියදම	6,004,530	2,728,137	513,062	123,430	96,339	908,608	10,374,106
වර්ෂය තුළ ඉවත් කිරීම්	(3,256,466)	-	-	-	-	-	(3,256,466)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	60,314,168	30,014,696	2,164,607	1,966,700	664,511	2,531,732	97,656,414
ධාරණ අගය							
2016/01/01 දිනට	257,439,273	27,276,181	8,609,674	625,330	1,358,611	16,549,037	311,858,106
2016/12/31 දිනට	306,262,307	24,548,044	15,148,282	3,342,835	2,043,615	20,076,427	371,421,510
මුළු ඵලදරණ ජෛව වත්කම් වල ධාරණ අගය							
2016/01/01 දිනට	640,824,042	81,560,083	18,664,021	6,808,318	3,624,235	34,471,645	785,952,344
2016/12/31 දිනට	695,036,413	85,714,122	19,039,676	7,955,459	4,704,636	39,467,561	851,917,867

දිනට	31.12.2016	31.12.2015
	රු.	රු.
13 (ආ) පාරිභෝජ්‍ය ජෛව වත්කම්		
වර්ෂ ආරම්භයේ ශේෂය	140,140,673	132,192,052
වටිනාකම අඩු වැඩි වීම තුල හඳුනාගත් ලාභ හෝ අලාභ	19,484,346	43,920,607
දැව ගස් හෙලීම නිසාවූ වටිනාකමේ අඩුවීම	(16,465,488)	(35,971,986)
වර්ෂ අවසානයේ ශේෂය	143,159,531	140,140,673

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැළකේ.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදාගනිමින් ආර්යතිලක සහ සමාගම මගින් අදාළ තක්සේරුකරණය සිදුකෙරිණි. දැව ගස් වල සාධාරණ අගය නිශ්චය කිරීමේදී සියළු වතු ආවරණය කරමින් භෞතික සත්‍යාපනයක් සිදුකරන ලදී.

තක්සේරුකරණයේදී යොදා ගැනුනු මූලික උපකල්පන

1. දැව හෙලීම රේඛීය අමාත්‍යාංශය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනුමත කරන බව.
2. වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත.
3. වට්ටම් අනුපාතය 14% කි.

ශුද්ධ වර්තමාන වටිනාකම් මත පදනම් බාහිර තක්සේරුකරණය දැව ගස් වල දිගු කාලීන හානිවීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස්වීම හේතුවෙන් සාධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරුකිරීමේදී පවතින ඒ හා බැඳුනු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම තත්‍ය වටිනාකමෙන් වෙනස් විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අවදානම් වලට නිරාවරණය වේ.

නියාමන සහ පාරිසරික අවදානම්

සමාගම ශ්‍රී ලංකාවේ නීතිරීති හා රෙගුලාසි වලට යටත් වේ. දේශීය පාරිසරික සහ වෙනත් නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් නිරන්තර විමර්ශනයන් සිදුකෙරේ.

සැපයුම් සහ ඉල්ලුම් අවදානම

දැව වල අලෙවි පරිමාවන් සහ මිල උච්චාවචනයන් සම්බන්ධ අවදානම් වලට සමාගම නිරාවරණය වේ. හැකි අවස්ථාවන්හිදී සමාගම මගින් සිය නිෂ්පාදන පරිමාව වෙළෙඳපොල ඉල්ලුම සහ සැපයුමට අනුව සකසමින් මෙම අවදානම කළමනාකරණය කරයි. සමාගමෙහි මිල ව්‍යුහය වෙළෙඳ පොළ මිල හා සමගාමී වන බවට සහ අපේක්ෂිත නිෂ්පාදන පරිමාව වෙළෙඳපොල ඉල්ලුමට සරිලන පරිදි පවතින බව තහවුරු කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් විශ්ලේෂණාත්මක අධ්‍යනයන් සිදුකරනු ලබයි.

දේශගුණ සහ වෙනත් අවදානම්

සමාගමෙහි දැව ගස් කාලගුණ වෙනස්වීම්, රෝග සහ වෙනත් ස්වභාවික ආපදාවන්ගේ අවදානමට ලක් වේ.

14. දේපළ පිරියත හා උපකරණ

සමාගම ආරම්භ කල 1992 ජුනි 18 වැනි දින, ගැසට් නිවේදනය මඟින් සමාගම වෙත පැවරූ වත්කම් හා ඉන්පසුව කරන ලද එකතු කිරීම් ඉවත් කිරීම් පහත දැක්වේ. බදු පදනම මත ලබාගත් වත්කම් ගිණුම්කරණ සටහන් අංක 11 සහ 12 යටතේ දක්වා ඇත.

	ඉඩම් අත්පත් කර ගැනීම්	ඉඩම් සංවර්ධන පිරිවැය	ගොඩනැගිලි	ලිං	වැටවල්	මෝටර් රථ	යන්ත්‍ර සූත්‍ර
වත්කම්වල ආයු කාලය (අවුරුදු)			40	40	3	5	13 1/3
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය							
2016 ජනවාරි 01 දිනට ශේෂය	8,123,564	3,869,754	149,157,275	5,471,198	44,740,604	144,167,724	1,849,609
වර්ෂය තුළ එකතුවීම්	-	150,000	491,487	753,101	7,254,553	1,678,672	-
වර්ෂය තුළ ඉවත් කිරීම්	-	-	-	-	-	-	-
වර්ෂය තුළ මාරු කිරීම්				-			
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,123,564	4,019,754	149,648,762	6,224,299	51,995,157	145,846,396	1,849,609
				-			
ක්ෂයවීම්							
2016 ජනවාරි 01 දිනට ශේෂය			7,736,894	1,010,993	20,644,242	90,346,671	197,642
වර්ෂයේ වියදම			3,728,935	136,782	12,090,139	20,663,700	138,721
වර්ෂය තුළ ඉවත් කිරීම්			-	-	-	-	-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	-	11,465,829	1,147,775	32,734,381	111,010,371	336,363
ධාරණ අගය							
2016.01.01 දිනට ශේෂය	8,123,564	3,869,754	141,420,381	4,460,205	24,096,362	53,821,053	1,651,967
2016.12.31 දිනට ශේෂය	8,123,564	4,019,754	138,182,933	5,076,524	19,260,776	34,836,025	1,513,246

	ලී බඩු හා සවිකිරීම්	උපකරණ	පරිගණක උපකරණ	පරිගණක මෘදුකාංග	එකතුව	නොනිමි වැඩ	එකතුව
2016.12.31 වන දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්					20,658,978	47,330,489	
වත්කම්වල ආයු කාලය (අවුරුදු)	10	8	5	5			
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය							
2016 ජනවාරි 01 දිනට ශේෂය	12,810,244	14,956,542	3,579,425	220,000	388,945,939	9,162,402	398,108,341
වර්ෂය තුළ එකතුවීම්	383,923	1,712,868	266,200	-	12,690,804	28,778,712	41,469,516
වර්ෂය තුළ ඉවත් කිරීම්	-	-	-	-	-	-	-
වර්ෂය තුළ මාරු කිරීම්					-	(9,104)	(9,104)
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	13,194,167	16,669,410	3,845,625	220,000	401,636,743	37,932,010	439,568,753
ක්ෂයවීම්							
2016 ජනවාරි 01 දිනට ශේෂය	3,898,381	7,230,339	2,314,768	44,000	133,423,930		133,423,930
වර්ෂයේ වියදම	1,250,358	1,526,749	400,946	44,000	39,980,330		39,980,330
වර්ෂය තුළ ඉවත් කිරීම්	-	-	-	-	-		-
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	5,148,739	8,757,088	2,715,714	88,000	173,404,260	-	173,404,260
ධාරණ අගය							
2016.01.01 දිනට ශේෂය	8,911,863	7,726,203	1,264,657	176,000	255,522,009	9,162,402	264,684,411
2016.12.31 දිනට ශේෂය	8,045,428	7,912,322	1,129,911	132,000	228,232,483	37,932,010	266,164,493
2016.12.31 වන දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්	509,968	3,591,413	1,894,370				73,985,218

	දිනට	31.12.2016	31.12.2015
		රු.	රු.

පොල්අත්තාපිටිය නමින් හඳුන්වන ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති හෙක්ටයාර 1.416 ක විශාලත්වයෙන් යුතු භූමිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පවරා ගෙන 1987 ජූලි 15 දින ජනවසමට බාරදුන් ඉඩමක් වුවද පැවරී නැති හෙයින් එහි අයිතිය තවමත් රජය සතුව පවතී. ඉඩම අත්පත් කර ගැනීම හේතු කොට ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ ඉඩමේ අයිතිය කුරුණෑගල වැවිලි සමාගමට පැවරීමේ යෝජිත එකඟත්වයක් හා එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම අනුව කර ඇත. වන්දි වශයෙන් ලැබිය යුතු රුපියල් මිලියන 3.5 ක මුදල වසර 18 ක කාලයක් නොගෙවා ප්‍රමාද වීම හේතු කොට ගෙන ඒ මත ගණනය කරන ලද නෛතික පොලිය වන රු. 4,623,564.00 ද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව මෙම ගෙවීමට සමාගම එකඟ විය. ඒ අනුව මෙම ඉඩම අත්පත් කර ගැනීම සඳහා සමාගම දරණ ලද සම්පූර්ණ මුදල රු. 8,123,564.00 ක් වේ. ගෙවූ සම්පූර්ණ මුදලම ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැය යටතේ දක්වා ඇත. නමුත් මෙම ඉඩමේ නෛතික අයිතිය සමාගම වෙත පැවරීම තවමත් සිදු වී නොමැත.

15	**වෙනත් මූල්‍යමය වත්කම්**		
	ජංගම නොවන වත්කම්		
	සේවකයන් සඳහා දුන් ණය (15.1)	6,271,235	5,446,034
	පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ (15.2)	322,258	260,223
		6,593,493	5,706,257
	ජංගම වත්කම්		
	සේවකයන් සඳහා දුන් ණය (15.1)	5,449,390	4,994,299
	පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ (15.2)	586,488	534,215
		6,035,878	5,528,514
15.1	සේවකයන් සඳහා දුන් ණය		
	වර්ෂය ආරම්භක දිනට ශේෂය	11,234,771	11,086,421
	වර්ෂය තුළ ප්‍රදානය කළ ණය	9,452,000	8,892,850
	වර්ෂය තුළ අයකරගත් ණය	(8,057,400)	(8,744,500)
		12,629,371	11,234,771
	පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ වලට මාරු කිරීම්	(908,746)	(794,438)
	වර්ෂය අවසන් දිනට ශේෂය	11,720,625	10,440,333
	ජංගම නොවන වත්කම්	6,271,235	5,446,034
	ජංගම වත්කම්	5,449,390	4,994,299
		11,720,625	10,440,333
15.2	පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ		
	වර්ෂය ආරම්භක දිනට ශේෂය	794,438	1,019,691
	වර්ෂය තුළ එකතු වීම්	893,761	807,210
	ක්‍රමක්ෂය	(779,453)	(1,032,463)
	වර්ෂය අවසන් දිනට ශේෂය	908,746	794,438
	ජංගම නොවන වත්කම්	322,258	260,223
	ජංගම වත්කම්	586,488	534,215
		908,746	794,438

5%ක සහනදායි වාර්ෂික පොලී පදනමක් මත සමාගම සේවකයින්ට ණය ලබා දෙනු ලබයි. පළමු ගිණුම් ගත කිරීමේදීම එම ණය සාධාරණ අගයකට ගිණුම්ගත කරනු ලැබේ. සේවකයින්ට දෙනු ලබන ණය වලට අදාල සාධාරණ අගය ගණනය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන වෙළෙඳපොල පොලී අනුපාතයෙන් වට්ටම් කිරීමෙනි. සේවකයින්ට ලබා දෙන ණය වලට අදාලව පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ ලෙස හඳුනාගනු ලබන්නේ ණය වල පිරිවැය සහ ගණනය කරන ලැබූ සාධාරණ අගය අතර වෙනසයි.

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	දිනට	31.12.2016	31.12.2015
		රු.	රු.
	ආපදා ණය	2016	2015
	කුරුණෑගල වැවිලි සමාගම	5.0%	5.0%
	මේ හා සමාන ණය වල වෙළෙඳ පොළ පොලී අනුපාතය		
	01.01.2016 - 20.11.2016	11.5%	20.0%
	21.11.2016 - 31.12.2016	13.0%	20.0%

16	**තොග**		
	නිෂ්පාදිත තොග	19,021,854	16,711,223
	අමතර කොටස් හා පාරිභෝජ්‍ය ද්‍ර	8,572,319	8,084,049
	යෙදවුම් අමුද්‍රව්‍ය	9,474,873	6,799,632
	පැළතවාන්	1,341,839	1,990,900
	පශු සම්පත්	470,394	522,330
	වෙනත් තොග	317,606	899,287
		39,198,884	35,007,421

17	**තැන්පතු**		
	ඉන්ධන මිළදී ගැනීම සඳහා වූ තැන්පතු	520,000	620,000
	වෙනත් භාණ්ඩ හා සේවා මිළදී ගැනීම සඳහා වූ තැන්පතු	41,700	31,000
	කොළඹ කාර්යාලයේ බදු කුලිය සඳහා වූ තැන්පතු	600,000	600,000
	කම්කරු උසාවියේ තැන්පත් කර ඇති මුදල් - පාරිතෝෂික සඳහා	967,840	967,840
	වෙනත්	5,000	
		2,134,540	2,218,840

18	**ඉදිරියට ගෙවීම්**		
	බදු දේපළ සඳහා වූ බදු කුලී - ජනතා වතු සංවර්ධන මණ්ඩලය - (සටහන අ)	19,051,007	17,660,207
	රක්‍ෂණ	1,149,561	1,201,599
	සාමාජික ගාස්තු	85,989	85,989
	සේවා ගිවිසුම්	50,354	55,516
	බදු කුලී	8,000	265,734
	ඉඩම් මැනීම්	1,107,316	1,002,414
	වෙනත්	467,950	622,177
		21,920,175	20,893,636

(සටහන අ) - බදු වත්කම් බැහැර කිරීම මත ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු බදු වාරික නැවත ගණනය කිරීමක් සිදු කර ඇති අතර ඒ අනුව රු. 19,051,007 ක වටිනාකමක් ඉදිරි ගෙවීමක් ලෙසට හඳුනාගෙන ඇත. (ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සටහන් අංක 'අ' බලන්න)

19	**කෙටිකාලීන ව්‍යාපෘතීන් සඳහා ඉදිරියට ගෙවූ වියදම්**		
	විසිතුරු පත්‍ර සහ පැළ ව්‍යාපෘතිය - අත්තනගල්ල	7,935,013	10,544,985
	අන්නාසි		114,428
	මඤ්ඤොක්කා	184,034	142,636
	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය	33,006	153,369
	තෘණ භූමි	66,955	100,432
	පැපොල්		45,244
	වී	1,760	86,636
		8,220,767	11,187,730

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	දිනට	31.12.2016	31.12.2015
		රු.	රු.
20	**වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ**		
	වෙළෙඳ ණයගැතියෝ		
	පොල් විකුණුම් සම්බන්ධ ණය ගැතියෝ	39,815,545	37,068,546
	අඩුකිරීම් : ප්‍රතික්ෂේපිත පොල් සඳහා වෙන් කිරීම්	(1,430,683)	(1,449,872)
	පොල් විකිණීමෙන් පැන නැගුනු අය කර ගත හැකි අලාභ	3,331,718	1,444,441
	බීජ පොල් විකුණුම් සම්බන්ධ ණය ගැතියෝ		
	රබර් විකුණුම් සම්බන්ධ ණය ගැතියෝ	3,424,524	2,646,322
	දැව ගස් විකුණුම් සම්බන්ධ ණය ගැතියෝ	-	5,091,560
	වෙනත් විකුණුම් සම්බන්ධ ණය ගැතියෝ	108,729	150,203
	ලැබිය යුතු කුලී ආදායම්	11,054	210,455
	වෙනත් ලැබිය යුතුදෑ		
	රඳවා ගැනීමේ බදු	-	-
	කාල්පනික රඳවා ගැනීමේ බදු	-	-
	ආර්ථික සේවා ගාස්තු	-	-
	ලැබිය යුතු රක්‍ෂණ වන්දි	132,029	23,068
	ලැබිය යුතු සේවක ණය	2,386,327	2,263,384
	ලැබිය යුතු පොලී ආදායම්	22,983,740	9,192,792
	සුළු ණය ගැතියෝ	1,501,734	1,692,889
	අඩුකිරීම් : බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(4,456,478)	(1,974,208)
		67,808,240	56,359,580

21	**කෙටි කාලීන ආයෝජන**		
	කාලීන තැන්පතු - ලංකා බැංකුව	76,000,000	166,000,000
	කාලීන තැන්පතු - මහජන බැංකුව	234,000,000	-
	කාලීන තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව	140,000,000	119,000,000
	කාලීන තැන්පතු - මහජන බැංකුව - විශ්‍රාම පාරිතෝෂික අරමුදල	-	130,000,000
		450,000,000	415,000,000

22	**මුදල් හා බැංකු ශේෂයන්**		
	තැපැල් මුද්දර	7,849	11,968
	භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිලදී ගැනීම්	37,000,000	21,000,000
	බැංකු මුදල්	4,826,554	7,559,909
	අතැති මුදල්	5,620,095	1,570,876
		47,454,497	30,142,753

23	**ස්කන්ධ ප්‍රාග්ධනය**		
	නිකුත් කල සහ සම්පූර්ණයෙන් ගෙවා නිමකල		
	රු. 10/= සාමාන්‍ය කොටස් 20,000,000	200,000,000	200,000,000
	රු. 10/= ස්වර්ණමය කොටස් 01 (සටහන 23.1)	10	10
		200,000,010	200,000,010

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

	දිනට	31.12.2016	31.12.2015
		රු.	රු.

23.1 ස්වර්ණමය කොටස්කරු

ස්වර්ණමය කොටසෙහි හිමිකාරත්වය වර්තමානයේදී මහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් දරණු ලබන අතර එහි අයිතිය ඍජුව ශ්‍රී ලංකා රජය මගින් හෝ 100% රජයේ හිමිකාරිත්වය සහිත පොදු සමාගමක් මගින් හෝ දැරිය හැකිය. සාමාන්‍ය කොටස්කරුවන්ට ඇති හිමිකම් වලට අමතරව විශේෂ හිමිකම් ස්වර්ණමය කොටස්කරු සතු වේ.

24 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් - පාරිතෝෂික

		31.12.2016	31.12.2015
	වර්ෂ ආරම්භක දිනට ශේෂය	117,628,140	124,548,410
	වර්ෂයේ වියදම	(18,875,540)	15,688,389
	වර්ෂය තුළ කල ගෙවීම් සහ ගෙවිය යුතු ගිණුමට මාරුකිරීම්	(19,018,847)	(22,608,659)
	වර්ෂය අවසාන දිනට ශේෂය	79,733,753	117,628,140

සමාගම මගින් එහි අඛණ්ඩ පැවැත්ම තහවුරු කෙරෙනු ඇත. පාරිතෝෂික වගකීම සඳහා අරමුදල් සම්පාදනය සම්පූර්ණයෙන්ම අභ්‍යන්තරව සිදු කෙරේ.

ආයුගණක තක්සේරුකරු විසින් විශ්‍රාම ප්‍රතිලාභ තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 මගින් නිර්දේශිත "යෝජිත ඒකක ණය ක්‍රමය භාවිතා කර ඇත." 2016 දෙසැම්බර් 31 වන දිනට විශ්‍රාමික ප්‍රතිලාභ තක්සේරු කිරීම ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් පෞද්ගලික සමාගම විසින් සිදු කර ඇත.

24.1	වසර තුල විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වෙනස් වූ ආකාරය පහත දැක්වේ	2016	2015
	පොලී පිරිවැය	11,762,814	12,454,841
	වත්මන් සේවා පිරිවැය	7,888,760	11,332,277
	සේවක පිරිවැය තුල අන්තර්ගත වියදම (සටහන 07)	19,651,574	23,787,118
	අතීත සේවා පිරිවැය	(73,403,509)	-
	විස්තීර්ණ ආදායම තුල හඳුනාගත් වියදම	34,876,395	(8,098,729)
	වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් වියදම	(38,527,114)	(8,098,729)
	විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් මුළු වියදම/ (ආදායම)	(18,875,540)	15,688,389

පාර්තෝෂික ගණනය කිරීමේ සූත්‍රය සංශෝධනය කිරීම

2013 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත් වන සේවකයින් හට පාරිතෝෂික ලෙස මසක වැටුපක් සම්පූර්ණ කළ සෑම වර්ෂයක් වෙනුවෙන්ම ගෙවීම සඳහා ගෙන තිබූ 2013 ජනවාරි 24 වන දිනැති අංක 281/10 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2016 අප්‍රේල් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කිරීම සඳහා තීරණය කර ඇත. ඒ අනුව 2016 අප්‍රේල් 25 වන දින සිට අවම වශයෙන් වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත් වනු ලබන ඕනෑම සේවකයෙකු හට මාස භාගයක වැටුපක් ඔවුන් සම්පූර්ණ කළ සෑම සේවා වසරක් සඳහාම ගෙවීමට කටයුතු කරනු ලබයි.

24.2 ඇක්චූරියල් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් පුද්ගලික සමාගම මගින් යොදා ගැනුනු ප්‍රධාන උපකල්පන

24.2.1 මූල්‍යමය උපකල්පන

2016

වාර්ෂික පොලී අනුපාතය	11%
වාර්ෂික වැටුප් වැඩිවීමේ අනුපාතය	
විධායක නිලධාරීන්	15% ඊළඟ වැටුප් වැඩිවීම 2017.06.01
විධායක නොවන නිලධාරීන් - ප්‍රධාන කාර්යාලය	12% ඊළඟ වැටුප් වැඩිවීම 2017.06.01
වතු කාර්ය මණ්ඩලය	25% වසර 03 කට වරක් ඊළඟ වැටුප් වැඩිවීම 2017.06.01
මුරකරුවන්	9% ඊළඟ වැටුප් වැඩිවීම 2017.06.01
දෛනික වැටුප් ලබන සේවකයන්	9% ඊළඟ වැටුප් වැඩිවීම 2017.06.01
දෛනික වැටුප් ලබන සේවකයන්ගේ වැටුප	රු. 480 හෝ රු.555 හෝ රු.725

2015

වාර්ෂික පොලී අනුපාතය	10%
වාර්ෂික වැටුප් වැඩිවීමේ අනුපාතය	
විධායක නිලධාරීන්	2% ඊළඟ වැටුප් වැඩිවීම 2016.06.01
විධායක නොවන නිලධාරීන් - ප්‍රධාන කාර්යාලය	3% ඊළඟ වැටුප් වැඩිවීම 2016.06.01
වතු කාර්ය මණ්ඩලය	2% ඊළඟ වැටුප් වැඩිවීම 2016.06.01
මුරකරුවන්	9% ඊළඟ වැටුප් වැඩිවීම 2016.06.01
දෛනික වැටුප් ලබන සේවකයන්	9% ඊළඟ වැටුප් වැඩිවීම 2016.06.01
දෛනික වැටුප් ලබන සේවකයන්ගේ වැටුප	රු. 380 හෝ රු.455 හෝ රු.625

24.2.2 ප්‍රජා ව්‍යාප්ති උපකල්පන

ඉහත දක්වන ලද මූල්‍යමය උපකල්පන වලට අමතරව මාතෘත්වය, ඉවත් වීම්, ආබාධිත තත්ත්වයන් සහ විශ්‍රාම ගැනීමේ වයස වැනි ප්‍රජා ව්‍යාප්ති උපකල්පන ද මෙහිදී භාවිත කෙරිණි. සමාගමෙහි පාරිතෝෂික වගකීම ඇස්තමේන්තු කිරීම සඳහා ලන්ඩන් ඇක්චූරියස් ආයතනය මගින් නිකුත් කරන ලද A 1967/70 සහ A 1949/52 වගු භාවිතා කර ඇත.

විශ්‍රාම ලැබීමේ වයස පුරුෂ/ස්ත්‍රී අවුරුදු 60

24.2.3 පාර්තෝෂික ගණනය කිරීමේ සූත්‍රය

2016

මාසික වැටුප් ලබන සේවකයන්

වසර 05 ක අවම සේවා කාලයකට යටත්ව සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම මාස භාගයක වැටුප

විධායක නිලධාරීන් සහ විධායක නොවන නිලධාරීන් - ප්‍රධාන කාර්යාලය

මසක වැටුප = මූලික වැටුප + ජීවන වියදම් දීමනාව (රු. 7,800/-)

රු. 10,000/- ක ගැලපුම් දීමනාව අදාල වන විධායක නිලධාරීන් සඳහා එකතු කර ඇත.

වතු කාර්ය මණ්ඩලය

මසක වැටුප = මූලික වැටුප

දෛනික වැටුප් ලබන සේවකයන්

වසර 05 ක අවම සේවා කාලයකට යටත්ව සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම මාස භාගයක වැටුප (දෛනික වැටුප × දින 14)

ගිණුම්කරණ සටහන්
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

2015

වසර 10 කට අඩු සේවා කාලයක් ඇති සේවකයින් සඳහා

වසර 05 ක අවම සේවා කාලයකට යටත්ව සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම මාස භාගයක වැටුප.

වසර 10 ක් හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් ඇති සේවකයින් සඳහා

සම්පූර්ණ කරන ලද සෑම සේවා වසරක් සඳහාම මසක වැටුප

විධායක නිලධාරීන් සහ විධායක නොවන නිලධාරීන්

මසක වැටුප = මූලික වැටුප + මූලික වැටුපෙන් 10%ක් වූ අයවැය දීමනාව + රු. 2,500/- ක උපරිමයට යටත්ව 5%ක් වූ අයවැය දීමනාව + ජීවන වියදම් දීමනාව (රු. 7,800/-)

රු. 10,000/- ක ගැලපුම් දීමනාව අදාල වන විධායක නිලධාරීන් සඳහා එකතු කර ඇත.

වතු කාර්ය මණ්ඩලය

මසක වැටුප = මූලික වැටුප

දෛනික වැටුප් ලබන සේවකයන්

මසක වැටුප = දෛනික වැටුප × දින 28

	දිනට	18.06.1996	31.12.2016	31.12.2015
				ප්‍රතිෂ්ඨාපනය කළ
		රු.	රු.	රු.
25	**ශුද්ධ කල්බදු වගකීම**			
	දළ කල්බදු වගකීම	401,114,000	232,998,230	241,219,031
	අඩු කළා : අනාගත කාලපරිච්ඡේදය සඳහා අදාල පොලී වියදම	(226,419,004)	(131,521,776)	(136,142,622)
	ශුද්ධ කල්බදු වගකීම	174,694,996	101,476,454	105,076,409
	අ) වසර 5 කට පසු ගෙවිය යුතු (උපචිත)			
	දළ වගකීම්		192,068,230	200,289,031
	අඩු කළා : අනාගත කාලපරිච්ඡේදය සඳහා අදාල පොලී වියදම		(108,417,796)	(113,038,642)
	ශුද්ධ වගකීම්		83,650,434	87,250,389
	ආ) වසර 2 සිට 5 දක්වා ගෙවිය යුතු (උපචිත)			
	දළ වගකීම්		32,744,000	32,744,000
	අඩු කළා : අනාගත කාලපරිච්ඡේදය සඳහා අදාල පොලී වියදම		(18,483,184)	(18,483,184)
	ශුද්ධ වගකීම්		14,260,816	14,260,816
	ඇ) වසරක් තුළ ගෙවිය යුතු (උපචිත)			
	දළ වගකීම්		8,186,000	8,186,000
	අඩු කළා : අනාගත කාලපරිච්ඡේදය සඳහා අදාල පොලී වියදම		(4,620,796)	(4,620,796)
	ශුද්ධ වගකීම්		3,565,204	3,565,204
			101,476,454	105,076,409

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හදිසි වැඩ පැවරුම් බලකාය මඟින් ඉඩම් බදු දීම් වලට අදාලව නිකුත් කර ඇති රීතීන්ට අනුව, බදු හිමියාට ඇති වගකීම/ බැඳීම කොටස් දෙකකින් සමන්විතය. එනම් බදු වාරික වල වාර්තමාන අගය සහ විලම්භනය කළ පොලී ප්‍රමාණයයි. ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම සඳහා 4% වට්ටම් අනුපාතය යොදා ගෙන ඇත. ගෙවන ලද බදු වාරික වල වටිනාකම (විචල්‍ය බදු කුලී ප්‍රමාණය හැර) බදු කරුට ඇති දළ වාරික වගකීමෙන් අඩු කර ඇති අතර පොලී ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයට වියදමක් සේ ගලපා ඇත.

ඉඩම් බදු ගිවිසුම 1996 ජූනි 18 වන දින සිට බලපාන පරිදි සංශෝධනය කිරීමත් සමඟ ඊට පෙර එක් වතුයායක් වෙනුවෙන් ගෙවූ රු. 500/- ක නාමික බදු කුලියෙහි විශාල වැඩිවීමක් සිදු විය. ප්‍රථමයෙන්ම, 1996 ජූනි 18 සිට 1997 ජූනි 17 දක්වා වන වර්ෂය සඳහා සංශෝධිත පදනම යටතේ බදු කුලී ගෙවූ අතර එය රුපියල් 8,186,000/- විය. මෙම අගය වාර්ෂිකව දළ දේශිය නිෂ්පාදන අවධමනකයෙන් ඉහළ යන අතර එය විචල්‍ය බදු කුලියක ස්වභාවය ගනු ලබයි.

2045 ජූනි 18 වන දිනෙන් අවසන් වන තුරු එළඹෙන සෑම මාස 12 කට වරක්ම ගෙවිය යුතු බදු ප්‍රමාණය වන්නේ පෙර වර්ෂයේ දළ දේශීය නිෂ්පාදන අවධමනකය ගැලපූ ප්‍රවර්ථන වර්ෂයේ අවසන් කාර්තු දෙකෙහි බදු වාරික වල වටිනාකමට ප්‍රවර්ථක වර්ෂයේ දළ දේශිය නිෂ්පාදන අවධමනය ගැලපූ ඉදිරි වර්ෂයේ ප්‍රථම කාර්තු දෙකෙහි බදු වාරික වල වටිනාකමට එකතු කිරීමෙනි. ප්‍රවර්ථන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුල රුපියල් 24,658,296/- ක් බදු පොලී වියදම් ලෙස අඩුකර ඇති අතර එහි ස්ථාවර බදු වාරික තුල අන්තර්ගත පොලී ප්‍රමාණය සහ විචල්‍ය බදු පොලී ප්‍රමාණයක් අන්තර්ගත වේ.

ප්‍රතිස්ථාපනය කිරීම - 1992.06.18 වන දින සිට 2003.12.31 දින දක්වා බැහැර කරන ලද වත්කම් වල වටිනාකම, එම වත්කම් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් බාරගත් වටිනාකමට හෝ එම වත්කම වෙනුවෙන් සමාගම දරණ ලද පිරිවැය යන අගයන්ගෙන් අදාල වන වටිනාකම යොදාගෙන ගණනය කර ඇති අතර එහි වටිනාකම වූ රු.37,297,387.96 ක වටිනාකම අදාල වත්කම් වලින් අඩුකර ඇති අතර 2015.12.31 දිනට ඊට අනුපාතික අනෙක් ගිණුම්කරණ ගැලපීම බදුකරුට ඇති ගෙවිය යුතු වටිනාකමින් අඩුකර පෙන්වා ඇත.

2016.12.21 වන දින පැවති 2015 - වාර්ෂික මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් අනුව 2015.12.31 වන දින දක්වා 'බදුකරුට ඇති ගෙවිය යුතු වටිනාකමින්' අඩුකර පෙන්වා ඇත. ගිණුම්කරණ ගැලපීම් රඳවා ගත් ලාභ වලින් අඩු කිරීමටද කටයුතු කර ඇත.

ඒ අනුව රු. 37,297,387.96 ක වටිනාකම පසුගිය වසර වලට බලපාන පරිදි හා රු. 27,831,281/- ක වටිනාකමක් ප්‍රවර්තන වර්ෂයට බලපාන පරිදි ගැලපීම් කර ඇත.

	දිනට	31.12.2016	31.12.2015 ප්‍රතිස්ථාපනය කළ
		රු.	රු.
26	**විලම්භිත බදු වගකීම**		
	වර්ෂ ආරම්භක දිනට ශේෂය	89,347,366	65,321,092
	වසර තුළ අයකිරීම් (ප්‍රතිස්ථාපනය කළ - 2015)	11,767,679	10,807,068
	පසුගිය වසරට අදල ගැලපුම්		13,219,206
	වර්ෂය අවසාන දිනට ශේෂය	101,115,045	89,347,366
	පහත දැක්වෙන තාවකාලික වෙනස්වීම් ඇතිකරන්නාවූ මූලයන්ට එරෙහිව විලම්භිත බදු වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඇත.		
	මේරූ ජෛව වත්කම්	(851,917,877)	(785,952,344)
	පාරිබෝජ්‍ය ජෛව වත්කම්	(143,159,541)	(140,140,673)
	දේපළ පිරියත හා උපකරණ	(100,263,260)	(86,982,983)
	අඩමාණ ණය ගැතියන් සඳහා වෙන් කිරීම්	4,456,478	1,974,208
	විශ්‍රාම පාරිතෝෂික	79,733,753	117,628,140
		(1,011,150,447)	(893,473,652)
	අදාල බදු අනුපාතය	10%	10%
	ශුද්ධ විලම්භිත බදු වගකීම්	(101,115,045)	(89,347,366)

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

සමාගම, මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට රුපියල් 8,419,021/- ක විලම්භිත බදු වත්කමක් හඳුනාගෙන ඇත. මෙම බදු වත්කම අනාගතයේදී ඇතිවන්නා වූ බදුවන ලාභයට එරෙහිව උපලබ්ධි වන බව කළමනාකරණයෙහි විශ්වාසයයි. එමෙන්ම වාර්තා කරන දිනට හඳුනාගත් විලම්භිත බදු බැරකම රු. 109,534,066/- කි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 වන දිනට ශුද්ධ විලම්භිත බදු බැරකම රු. 101,115,045/-කි.

ඉදිරියට බලපවත්වන බදු අනුපාතය

බදු උපදේශකයින්ගේ අදහස අනුව සමාගම මගින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මගින් උපයන ලද ලාභය 'කෘෂිකාර්මික' කටයුතු වලින් ලද ලාභය වශයෙන් සැලකිය හැකි අතර එය 2011/04/01 දිනෙන් ඇරඹෙන තක්සේරු වසරේ සිට 10%ක ආදායම් බද්දකට යටත් වනු ඇත.

27 අත්තිකාරම් ලැබීම්

බදු කුලී සඳහා	2,157,992	1,551,881
වෙනත්	193,960	193,960
	2,351,952	1,745,841

28 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු වෙළඳ හා වෙනත් ණය හිමියන් සහ උපචිත වියදම්	7,328,483	4,508,157
දෛනික වෙක්රෝල් සේවකයින්ගේ වැටුප් හා වේතන	9,533,523	8,805,905
ආපසු ගෙවන ලංසු සුරක්ෂණ, ආරක්ෂක තැන්පතු සහ රඳවා ගත් මුදල්	13,470,257	11,838,255
ගෙවිය යුතු පාරිතෝෂික	4,593,806	1,260,361
ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල්	2,981,775	2,634,901
ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්	493,290	424,139
ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	1,424,051	-
බ්‍රෝකර් ගාස්තු සඳහා වෙන්කිරීම්	745,999	635,170
ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම්	13,461,031	11,523,600
කාර්ය සාධන දිරි දීමනා සඳහා වෙන් කිරීම්	18,095,448	25,106,935
ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා වෙන් කිරීම්	3,828,489	3,893,848
නිවාඩු පඩි සඳහා වෙන් කිරීම්	5,187,805	4,805,677
	81,143,957	75,436,948

29 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනය වන විට සමාගම සතුව කිසිදු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීමක් නොපැවතිනි.

30 වාර්තා කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය වන ආකාරයේ කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තා කරන දිනයෙන් පසු සිදුවී නොමැත,

දිනට	31.12.2016 රු.	31.12.2015 රු.

31 සම්බන්ධිත පාර්ශවයන් අතර ඇති ගනුදෙනු

වර්ෂය තුලදී සම්බන්ධිත පාර්ශවයන් අතර ගනුදෙනු සිදු වී නොමැත

31.1 ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන්

ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් යන්නට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා ප්‍රධාන විධායක නිලධාරී ඇතුලත්වේ,

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	8,791,033	10,129,991

32	**රජයේ ප්‍රදානයන්**	
	වර්ෂය තුල ලැබුනු මූල්‍යමය නොවන ප්‍රදානයන්	
	වැවිලි මානව සංවර්ධන භාරයෙන් ලැබුනු අයභාර ප්‍රදානයන්	1,756,609
	වැවිලි මානව සංවර්ධන භාරයෙන් ලැබුනු මූල්‍යමය නොවන ප්‍රදානයන් (සෙවිලි තහඩු) කම්කරුවන්ගේ සුබසාධන පහසුකම් (කම්කරු ලයිම් නිවාස සහ මුරකරු නිවාස නැවත සෙවිලි කිරීම සහ වැසිකිලි පහසුකම්) වැඩිදියුණු කිරීම සඳහා ලැබී ඇත.	
	වර්ෂය තුල ලැබුනු මූල්‍යමය ප්‍රදානයන්	
	රබර් නැවත සිටුවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානයන්	912,757
	රබර් නැවත සිටුවීම හෝ අළුතින් සිටුවීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුනු සහනාදාර අදාල වගාවේ (ඵලදරණ ජෛව වත්කම්) පිරිවැයෙන් අඩුකර එම වගාවේ ධාරණ අගය ලබාගෙන ඇත.	
	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුනු අයභාර ප්‍රදානයන්යන්	225,149
	රබර් ගසක කිරි කැපුම් කට්ටය ආවරණය සඳහා වූ වැසි ආවරණ සවි කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුනු සහනාදාර අදාල වියදමෙන් අඩුකර පෙන්වා ඇත.	

33 මූල්‍යමය අවදානම් කළමනාකරණය

සමස්ථ විශ්ලේෂණය

සිය මූල්‍යමය උපකරණ භාවිතයේදී සමාගම පහත දැක්වෙන අවදානම් වලට නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළෙඳ පොළ අවදානම් (මුදල් ඒකක අවදානම සහ පොලී අනුපාත අවදානමද ඇතුලත්ව)

මෙම සටහන මගින් ඉහත එක් එක් අවදානම සඳහා සමාගමෙහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සහ අවදානම් මැනීම සහ කළමනාකරණය වෙනුවෙන් වන සමාගමෙහි අරමුණු ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග දැක්වේ. අවදානම් කළමනාකරණ ආකෘතික රාමුව මෙය ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමාගමෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන්, සමාගම මුහුණ දෙන අවදානම් හදුනාගැනීම, විශ්ලේෂණය හා ඒ තුලින් අවදානම් සීමා ඇති කිරීම හා පාලනය තහවුරු කරයි.

අවදානම් කළමනාකරණ ආකෘතික රාමුව

මෙය ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමාගමෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන්, සමාගම මුහුණ දෙන අවදානම් හදුනාගැනීම, විශ්ලේෂණය හා ඒ තුලින් අවදානම් සීමා ඇති කිරීම හා පාලනය තහවුරු කරයි.

ණය අවදානම

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ ප්‍රති පාර්ශවයක් මගින් සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගමට අත්වන මූල්‍යමය අලාභය වන අතර මෙය මූලිකවම සමාගම වෙත ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් සහ ආයෝජන සුරැකුම් ආශ්‍රිතව උද්ගත වේ. මූල්‍යමය වත්කම් වල පවතින වටිනාකම මගින් උපරිම ණය අවදානම් නිරාවරණය නියෝජනය කෙරේ. වාර්තා කරන දිනයේදී උපරිම ණය අවදානම් නිරාවරණය පහත දැක්වෙන පරිදි වේ.

ගිණුම්කරණ සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

දිනට	31.12.2016	31.12.2015
	රු.	රු.
ණය සහ ලැබිය යුතු දෑ		
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	67,808,240	56,359,580
කෙටි කාලීන ආයෝජන	450,000,000	415,000,000
මුදල් හා මුදල් සමාන දෑ	47,454,497	30,142,753
	565,262,738	501,502,333

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු සමාගම මගින් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් යොදා ගනිමින් පියවිය යුතු මූල්‍යමය වගකීම් පියවා දැමීමට නොහැකි තත්ත්වයක් ඇතිවීමේ අවදානමයි. මෙම අවදානම කළමනාකරණය යනු සාමාන්‍ය හෝ අසීරු තත්ත්වයන්හිදී සමාගමට සිය වගකීම් පියවීම් සඳහා වන ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමයි.

ද්‍රවශීලතා අවදානම මගහරවා ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කරමින් මුදල් සහ මුදල් සමාන දෑ මට්ටම ප්‍රමාණාත්මකව පවත්වා ගැනිමට හා මූල්‍ය ආයතන මඟින් ආරක්ෂිත ණය පහසුකම් ලබා ගැනිමට කටයුතු කරයි.

මූල්‍යමය අවදානම් කළමනාකරණය

	31.12.2016	31.12.2015
ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වගකීම්		
බදු හිමියන්ගේ ශුද්ධ වගකීම්	101,476,454	105,076,409
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	81,143,957	75,436,948
	182,620,411	180,513,357

වෙළෙඳ පොළ අවදානම

වෙළෙඳ පොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත, පොලී අනුපාත සහ වෙළෙඳ පොළ මිල ගණන් වෙනස්වීම මත සමාගමෙහි අදායම හෝ රඳවාගත් මූල්‍යමය උපකරණයන්හි වටිනාකම වෙනස්වීමට ඇති අවදානමයි. වෙළෙඳ පොළ අවදානම කළමනාකරණයේ අරමුණ වන්නේ අවදානම පාලනය කරමින් ආදායම උපරිම කරගැනීමයි.

පොලී අනුපාත අවදානම

මෙමගින් හැඳින්වෙන්නේ වෙළෙඳ පොළ පොලී අනුපාතයන් වෙනස්වීම හේතුවෙන් මූල්‍යමය උපකරණයන්හි අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ අවදානමයි. වෙළෙඳ පොළ පොලී අනුපාතයන් වෙනස් වීමේ අවදානමට සමාගම ලක් වනුයේ මූලිකව සමාගමෙහි දිගු කාලීන ණය වගකීම සහ පාවෙන පොලී අනුපාතයන් සහිත අයෝජනයන්ය. කෙසේවුවද වාර්තා කරන දිනය වන විට සමාගම සතුව දිගුකාලීන පාවෙන අනුපාත සහිත ණය ගැනීම් හෝ තැන්පතු නොපැවතිණි.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය

පහත සඳහන් අරමුණු වෙනුවෙන් කුරුණෑගල වැව්ලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2018 අගෝස්තු 21 වන දින පස්වරු 4.00 ට නො. 712/3, බේස්ලයින් පාර, දෙමටගොඩ, කොළඹ - 09 දරණ ස්ථානයේ පිහිටි කුරුණෑගල වැව්ලි සමාගමේ කොළඹ කාර්යාලයේදී පැවැත්වේ.

1. අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ විගණකවරුන්ගේ වාර්තාව සමගින් 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ සම්මත කිරීම.

2. 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ විගණකවරුන් වශයෙන් රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව පත්කර ගැනීම.

3. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ලාභයෙන් රුපියල් මිලියන 30 ක අවසන් ලාභාංශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම.

4. වෙනත් කරුණු.

4.1 බදු කාලසීමාව දීර්ඝ කිරීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලයත් සමග බදු ඉඩම් සඳහා අත්සන් කොට ඇති බදු ගිවිසුම් 2045 ජූලි 17 වන දිනෙන් අවසන් වේ.

4.2 මෙතෙක් බදු ගිවිසුම් අත්සන් කොට නොමැති එහෙත් ඒ වෙනුවට අවබෝධතා ගිවිසුමක් පමණක් අත්සන් කොට ඇති ඉඩම් සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) සතුව පැවති වතු 13 ක් සමාගමට බාර දුන් නමුදු ඉන් වතු 05 ක් සඳහා පමණක් බදු ගිවිසුම් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වතු 08 සඳහා (දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පල, කුරුණෑගල, මහයාය, නාරම්මල සහ වාරියපොල) බදු ගිවිසුම් සම්පූර්ණ කළ යුතුව ඇත. බදු ගිවිසුම් සම්පූර්ණ නොවූ වතු වෙනුවෙන් සමාගම හා ජනවසම අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. මෙය බදු ගිවිසුම් සම්පූර්ණ කරන තුරු ජනවසම හා සමාගම අතර ඇති වලංගු ගිවිසුමක් ලෙස ක්‍රියාකරයි.

4.3 බදු වාරික සංශෝධනය කිරීම

ජාතික හා මහජන අවශ්‍යතාවයන් සඳහා සහ ව්‍යවස්ථාපිත නිශ්චයන් සඳහා ඉඩම් බැහැර කිරීම තුල, කුරුණෑගල වැව්ලි සමාගම ආරම්භයේදී සමාගමට බාරදුන් බදු වත්කම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සමාගමට අහිමි වී ඇත. එහෙයින් 1994.12.31 වන දිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය පාදක කොටගෙන ආරම්භයේදී ගණනය කරන ලද බදු වාරික වටිනාකම සංශෝධනය කළ යුතුව ඇත. කුරුණෑගල වැව්ලි සමාගම සංශෝධිත බදු වාරිකයක වටිනාකමක් ගෙවීමට කටයුතු කලද ඒ සඳහා බදු ගිවිසුමේ අනෙක් පාර්ශවකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙනුවෙන් බදුවාරික එක්රැස් කිරීම සඳහා බලාධිකාරිය ලබා දී ඇති වැව්ලි කළමනාකරණ හා අධීක්ෂණ අංශය හෝ එම කටයුත්ත සඳහා නිසි එකඟතාවයක් එළ කර නොමැත. කුරුණෑගල වැව්ලි සමාගමේ ස්වර්ණමය කොටස්කරුවන මහා භාණ්ඩාගාරයෙන් මෙම ක්‍රියාවලිය නියමානුකූල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ඉල්ලා සිටිමු.

4.4 කුරුණෑගල වැව්ලි සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ (ආ) කොටසේ 03 වන වගන්තියේ සඳහන් වෙනත් බලතල යටතේ සමාගමට ලැබී ඇති බලතල ක්‍රියාත්මක කිරීම

(ආ) කොටසේ 03 වන වගන්තිය - "වෙනත් බලතල"

ඕනෑම පතල්, කැණීම් හිමිකමක්, මැණික්, ගොඩනැගිලි, කර්මාන්තශාලා, මෝල්, පිරියත, පරවශතා (පහසු කරවනයන්), අයිතිවාසිකම්, වරප්‍රසාද, අනුග්‍රහයන්, පේටන් බලපත්‍ර, පේටන් අයිතීන්, බලපත්‍ර, රහස්‍ය ක්‍රියාවලීන්, යන්ත්‍රෝපකරණ, පිරියත, වෙළෙඳ තොග සහ ඕනෑම ආකාරයක නිශ්චල හෝ පෞද්ගලික දේපල හෝ, එහි අවශ්‍ය බැඳියාවන්, සමාගමේ ව්‍යාපාරික හෝ එහි ශාඛාවක හෝ

දෙපාර්තමේන්තුවක හෝ අරමුණ සඳහා හෝ සම්බන්ධයෙන් අත්පත් කර ගැනීමට, අයිතිකර ගැනීමට, සන්තකයේ තබා ගැනීමට, ආනයනය කිරීමට, මිළදී ගැනීමට, බද්දට ලබා ගැනීමට හෝ හුවමාරු කිරීම මගින් ලබාගැනීමට, කුලී පදනම මත ලබාගැනීමට හෝ වෙනත් ආකාරයකින් අත්පත් කරගැනීමට සහ සන්තකයේ රඳවා ගැනීමට සහ ලෝහ සහිත පස්, ඛණිජ සහ මැණික් සෙවීමට සහ එවැනි ලෝහ සහිත පස්, ඛණිජ සහ මැණික් කැණීම සහ සමාගම අත්පත් කරගනු ලැබිය හැකි ඕනෑම භූමියක ඇතුලත හා මතුපිට කැණීම් සිදුකිරීම සඳහා බලපත්‍ර ලබා දීමට, සහ එවැනි ඉඩමක් ගොඩනැගිලි සඳහා හෝ සමාගමට ප්‍රයෝජනවත් වන ආකාරයේ ඕනෑම කටයුත්තක් සඳහා බදු දීමට බලතල ඇති බව.

කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම

2018 අගෝස්තු 01 වන දින

රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් සහිත කොටස් හිමියෙකුට ඔහු/ඇය වෙනුවෙන් රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නියෝජිතයෙක් පත් කිරීමට හිමිකම ඇත. එම නියෝජිතයා සමාගමේ සාමාජිකයෙක් වීම අවශ්‍ය නැත.

මෙම අරමුණ සඳහා භාවිතා කිරීමට පෙරකලාසි ආකෘති පත්‍රයක් අමුණා ඇත.

පෙරකලාසි පත්‍රය

පහත අත්සන් තබන ....

පදිංචි ....

කුරුණෑගල වැවිලි සමාගමේ සමාගමේ සාමාජික/සාමාජිකයින් වන මම/අපි,

ඒ.එම්.පියසෝම උපාලි මහතා	හෝ	එච්.ඒ.පී. තුසිත කුමාර ඩයස් මහතා	හෝ
ඩී.එම්. බණ්ඩාරනායක මහතා	හෝ	එච්.ඒ.එන්. සමන් කුමාර මහතා	හෝ
ඩබ්.එම්.ඩී.බී.අබේරත්න මහතා	හෝ	එම්.පී.ඩී. ඉඳුනිල් අමරසිංහ මහතා	හෝ

.... යන අය 2018 අගෝස්තු 23 වන දින පස්වරු 4.00 ට නො. 712/3, බේස්ලයින් පාර, දෙමටගොඩ, කොළඹ - 09 දරණ ස්ථානයේ පිහිටි කුරුණෑගල වැවිලි සමාගමේ කොළඹ කාර්යාලයේදී පවත්වනු ලබන සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී මා/අප නියෝජනය කිරීම සඳහා මාගේ/අපගේ නියෝජිතයා ලෙස සහ මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පත්කර සිටිමි/සිටිමු.

කරුණාකර යෝජනා අංකය ඉදිරියෙන් x සළකුණ යොදා ඔබගේ වරණය සඳහන් කරන්න.

	පක්ෂ	විපක්ෂ
1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විගණකවරුන්ගේ වාර්තාව සමඟින් 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ සම්මත කිරීම.		
2. 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ විගණකවරුන් වශයෙන් රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව පත්කර ගැනීම.		
3. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ලාභයෙන් රුපියල් මිලියන 30 ක අවසන් ලාභාංශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම.		

4. වෙනත් කරුණු

4.1 බදු කාලසීමාව දීර්ඝ කිරීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලයත් සමග බදු ඉඩම් සඳහා අත්සන් කොට ඇති බදු ගිවිසුම් 2045 ජූලි 17 වන දිනෙන් අවසන් වේ.

4.2 මෙතෙක් බදු ගිවිසුම් අත්සන් කොට නොමැති එහෙත් ඒ වෙනුවට අවබෝධතා ගිවිසුමක් පමණක් අත්සන් කොට ඇති ඉඩම් සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීම.

ජනවසම සතුව පැවති වතු 13 ක් සමාගමට බාර දුන් නමුදු ඉන් වතු 05 ක් සඳහා පමණක් බදු ගිවිසුම් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි වතු 08 සඳහා (දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පල, කුරුණෑගල, මහයාය, නාරම්මල සහ වාරියපොල) බදු ගිවිසුම් සම්පූර්ණ කළ යුතුව ඇත. බදු ගිවිසුම් සම්පූර්ණ නොවූ වතු වෙනුවෙන් සමාගම හා ජනවසම අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. මෙය ජනවසම හා සමාගම අතර ඇති වලංගු ගිවිසුමක් ලෙස ක්‍රියාකරයි.

4.3 බදු වාරික සංශෝධනය කිරීම

ජාතික හා මහජන අවශ්‍යතාවයන් සඳහා සහ ව්‍යවස්ථාපිත නිශ්චයන් සඳහා ඉඩම් බැහැර කිරීම තුල, කුරුණෑගල වැව්ලි සමාගම ආරම්භයේදී සමාගමට බාරදුන් බදු වත්කම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සමාගමට අහිමි වී ඇත. එහෙයින් 1994.12.31 වන දිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය පාදක කොටගෙන ආරම්භයේදී ගණනය කරන ලද බදු වාරික වටිනාකම සංශෝධනය කළ යුතුව ඇත. කුරුණෑගල වැව්ලි සමාගම සංශෝධිත බදු වාරිකයක වටිනාකමක් ගෙවීමට කටයුතු කලද ඒ සඳහා බදු ගිවිසුමේ අනෙක් පාර්ශවකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය වෙනුවෙන් බදුවාරික එක්රැස් කිරීම සඳහා බලාධිකාරිය ලබා දී ඇති වැව්ලි කළමනාකරණ හා අධීක්ෂණ අංශය හෝ එම කටයුත්ත සඳහා නිසි එකඟතාවයක් එළ කර නොමැත. කුරුණෑගල වැව්ලි සමාගමේ ස්වර්ණමය කොටස්කරුවන මහා භාණ්ඩාගාරයෙන් මෙම ක්‍රියාවලිය නියමානුකූල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ඉල්ලා සිටිමු.

4.4 කුරුණෑගල වැව්ලි සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ (ආ) කොටසේ 03 වන වගන්තියේ සඳහන් වෙනත් බලතල යටතේ සමාගමට ලැබී ඇති බලතල ක්‍රියාත්මක කිරීම

(ආ) කොටසේ 03 වන වගන්තිය - "වෙනත් බලතල"

ඕනෑම පතල්, කැණීම් හිමිකමක්, මැණික්, ගොඩනැගිලි, කර්මාන්තශාලා, මෝල්, පිරියත, පරවශතා (පහසු කරවනයන්), අයිතිවාසිකම්, වරප්‍රසාද, අනුග්‍රහයන්, පේටන් බලපත්‍ර, පේටන් අයිතීන්, බලපත්‍ර, රහස්‍ය ක්‍රියාවලීන්, යන්ත්‍රෝපකරණ, පිරියත, වෙළෙඳ තොග සහ ඕනෑම ආකාරයක නිශ්චල හෝ පෞද්ගලික දේපල හෝ, එහි අවශ්‍ය බැඳියාවන්, සමාගමේ ව්‍යාපාරික හෝ එහි ශාඛාවක හෝ දෙපාර්තමේන්තුවක හෝ අරමුණ සඳහා හෝ සම්බන්ධයෙන් අත්පත් කර ගැනීමට, අයිතිකර ගැනීමට, සන්තකයේ තබා ගැනීමට, ආනයනය කිරීමට, මිළදී ගැනීමට, බද්දට ලබා ගැනීමට හෝ හුවමාරු කිරීම මගින් ලබාගැනීමට, කුලී පදනම මත ලබාගැනීමට හෝ වෙනත් ආකාරයකින් අත්පත් කරගැනීමට සහ සන්තකයේ රඳවා ගැනීමට සහ ලෝහ සහිත පස්, ඛණිජ සහ මැණික් සෙවීමට සහ එවැනි ලෝහ සහිත පස්, ඛණිජ සහ මැණික් කැණීම සහ සමාගම අත්පත් කරගනු ලැබිය හැකි ඕනෑම භූමියක ඇතුලත හා මතුපිට කැණීම් සිදුකිරීම සඳහා බලපත්‍ර ලබා දීමට, සහ එවැනි ඉඩමක් ගොඩනැගිලි සඳහා හෝ සමාගමට ප්‍රයෝජනවත් වන ආකාරයේ ඕනෑම කටයුත්තක් සඳහා බදු දීමට බලතල ඇති බව.

2018...................මස.........................වන අද දින අත්සන් කරන ලදී.

....

අත්සන

කොටස් හිමියාගේ ජාතික හැඳුනුම්පත්/ගමන් බලපත්‍ර/සමාගම් ලි.ප. අංකය.

පෙරකලාසි අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1 පෙරකලාසි අයදුම් පත නිසි පරිදි සම්පූර්ණ කර සපයා ඇති නියමිත ස්ථානයේ අත්සන් තැබීමට සහ දිනය සඳහන් කිරීමට කටයුතු කරන්න.

2 පෙරකලාසි අයදුම්පත ඇටෝර්නි බලය හිමි පුද්ගලයකු විසින් අත්සන් තබා ඇත්නම් සහ එය සමාගමෙහි දැනටමත් ලියාපදිංචි වී නොමැතිනම් පෙරකලාසි අයදුම් පත සමඟ එම ඇටෝර්නි බලපත්‍රයද ඉදිරිපත් කළ යුතු වේ.

3 සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම් පත රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර කොළඹ 7, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, අංක 47 දරණ ස්ථානයේ තැන්පත් කළ යුතු වේ.

ආයතනික තොරතුරු

සමාගමේ නම
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

ලියාපදිංචි කාර්යාලය
අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.

දුරකථන අංකය	:	037 2223133
ෆැක්ස්	:	037 2229618
විද්‍යුත් ලිපිනය	:	kurunegalaplt@sltnet.lk

සංස්ථාපනය කළ දිනය
1992 ජූනි 18 දින

සමාගම් ලියාපදිංචි අංකය
PB1319

නෛතික තත්ත්වය
පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සීමාසහිත පොදු සමාගමකි. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ අණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පිහිටවු සීමාසහිත සමාගමක් වන අතර, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය - 2016

ඒ. එම්. පියසෝම උපාලි මහතා	-	සභාපති
එච්.ඒ.පී. තුසිත කුමාර ඩයස් මහතා	-	විධායක අධ්‍යක්ෂ
ඩී. එම්. බණ්ඩාරනායක මහතා	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
එච්. ඒ. එන්. සමන් කුමාර මහතා	-	අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත
ඩබ්. එම්. ඩී. බී. අබේරත්න මහතා		
ආර්. සිඩ්නි කුලතිලක මහතා		
එම්.ජී.ඩී. ඉඳුනිල් අමරසිංහ මහතා		

සමාගමේ විගණකවරු
විගණකාධිපති දෙපාර්තමේන්තුව

306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

දුරකථන අංකය	:	0112 887028-34
ෆැක්ස්	:	0112 887223
විද්‍යුත් ලිපිනය	:	oaggov@sltnet.lk
වෙබ් අඩවිය	:	www.auditorgeneral.gov.lk

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ලේකම්වරු
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම

අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

දුරකථන අංකය	:	0112 695782
ෆැක්ස්	:	0112 695410

Designed, Produced & Printed by : b-connected little details make a big difference

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල.
දුරකථන අංකය: 037 2223133, 037 2223191 | ෆැක්ස්: 037 2229618 | විද්‍යුත් ලිපිනය: kurunegalaplt@sltnet.lk